# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

*கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு*

# Ministry of Agriculture, Livestock, Land and Irrigation

**කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ**

*கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரிவு*

Agriculture and Livestock Divisions

## ප්‍රගති වාර්තාව

*முன்னேற்ற அறிக்கை*

## Progress Report

**(2025.01.01 – 2025.09.30)**

වෙළුම - **I**

*தொகுதி - I*

**Volume - I**

**අයවැය කාරක සභා අවස්ථා විවාදය - 2026**

*வரவுசெலவுத் திட்ட குழுநிலை விவாதம் - 2026*

**Committee Stage of the Budget Debate - 2026**

# ප්‍රගති වාර්තාව

# අයවැය කාරක සභා අවස්ථාව 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

නො.80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල

## ප්‍රගති වාර්තාව

## අයවැය කාරක සභා අවස්ථාව 2026

(2025.09.30 දක්වා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ මගින් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සහ 2026 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල ඉලක්ක ඇතුළත් ප්‍රගති වාර්තාව)

***අමාත්‍යාංශයේ වැය ශීර්ෂය- අංක 118***

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

- *කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය - ගරු කේ. ඩී. ලාල් කාන්ත මැතිතුමා*
  - *කෘෂිකර්ම හා පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය - ගරු නාමල් කරුණාරත්න මැතිතුමා*
  - *ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය - ගරු අරවින්ද සෙනරත් විතාරණ මැතිතුමා*
- *අමාත්‍යාංශ ලේකම් - ඩී. පී. වික්‍රමසිංහ මහතා*


| | |
|---|---|
| දුරකථන (පොදු) | 011-2034300 |
| ෆැක්ස් | 011-2868910 |
| විද්‍යුත් තැපැල | info@agrimin.gov.lk |
| වෙබ් අඩවිය | www.agrimin.gov.lk |

# අන්තර්ගතය

හැඳින්වීම ........ 04-07

කෘෂිකර්ම අංශය සහ පශු සම්පත් අංශය ........ 08

2025 වසර තුළ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල සාරාංශය හා මූල්‍ය ප්‍රගතිය ....... 09-10

2026 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ඉලක්ක ........ 11-12

කෘෂිකර්ම අංශය ........ 13

වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය ........ 14-16

වැය ශීර්ෂ අංක 118 පුනරාවර්තන වියදම් යටතේ සිදුකරන ලද ප්‍රධාන වැඩසටහනෙහි ප්‍රගතිය .. 16-17

2025 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය........ 18-28

කෘෂිකර්ම අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය........ 29-101

පශු සම්පත් අංශය ........ 102

වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය ........ 103-108

2025 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය........ 108

පශු සම්පත් විෂය පථය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය........ 109-124

## හැඳින්වීම

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, 2024 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2412/08 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කර ඇත. පරිපාලනයේ පහසුව උදෙසා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ලෙස අංශ හතරකට බෙදා ඇත.

ඒ අනුව, මෙම වාර්තාව තුළ කෘෂිකර්ම සහ පශු සම්පත් යන අංශ විසින් සහ එම අංශ යටතේ ඇති ආයතන විසින් සිදු කරන ලද සංවර්ධන වැඩසටහන්වල 2025.09.30 දින දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය සහ 2026 වර්ෂයේ මූල්‍ය හා භෞතික ඉලක්ක ද ඇතුළත් කර ඇත (වෙළුම I). ඉඩම් (වෙළුම II) සහ වාරිමාර්ග (වෙළුම III) අංශ විසින් වෙන වෙනම තම ප්‍රගති වාර්තා සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශයට අදාළ කාර්යය හා කර්තව්‍යයන් (2024 නොවැම්බර් මස 25 වැනි දින අංක 2412/08 අංක දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව)**

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග විෂයයන්ට සහ අදාළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. රටේ ආහාර සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි ආහාර නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම
5. ප්‍රමිතියෙන් යුත් කෘෂිකාර්මික නිෂ්පාදන තුළින් ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ආහාර ලබාදීම සහතික කිරීම
6. දේශීය වශයෙන් ඵලදායී ලෙස වගාකළ හැකි ආහාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම
7. ආනයනික භෝග සඳහා සුදුසු ආදේශක භෝග දේශීයව වගා කිරීම දිරිමත් කිරීම
8. අපනයන කෘෂි ගම්මාන ප්‍රවර්ධනය කිරීම
9. තත්කාලීන කෘෂිකර්ම දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම
10. තොග පවත්වා ගැනීම් හා සැපයුම් කටයුතු ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නවීන තාක්ෂණය යොදාගැනීම
11. භෝග විවිධාංගීකරණය මත පදනම් වූ කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
12. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම
13. සම්ප්‍රදායික ගොවීන්, තරුණ පරපුර සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් නවීන තාක්ෂණය සහිත කෘෂි අධ්‍යාපන අවස්ථා වෙත යොමු කිරීම
14. තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම දිරි ගැන්වීම

15. රසායනික පලිබෝධ සහ වෙනත් රසායනික සංයෝග නිශ්චිත ප්‍රමිතියක් සහිතව යෙදීම නියාමනය කිරීම
16. කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන්නන් සඳහා වගා රක්ෂණ ක්‍රම හා ගොවි විශ්‍රාම ක්‍රමවේදයන් පුළුල් කිරීම
17. සැපයුම් දාමය ශක්තිමත් කිරීම මගින් ගොවීන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහතික කිරීම
18. දේශගුණික වෙනස්කම්, කාලගුණයේ දෛනික තොරතුරු, ගොවි ජනතාවට සන්නිවේදනය කිරීම මගින් ස්වභාවික ආපදාවන් අවම කර ගැනීම
19. ප්‍රමිතියෙන් යුතු බීජ හා පැලෑටි ගොවි ජනතාවට ලබා දීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම
20. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම
21. කෘෂිකාර්මික සංවර්ධන කලාප, කෘෂි ගම්මාන, ගොවි සමූපකාර සහ ගොවි සමාගම් (farmer-administered co-operatives and farmer companies) ප්‍රචලිත කිරීම
22. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හා සංවිධාන නගාසිටුවීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
23. කාබනික පොහොර භාවිතය සහ  වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමයෙන් නැඹුරු වීමේ වැඩසටහන් පුළුල් කිරීම හා දිරි ගැන්වීම
24. ගුණාත්මක තත්ත්වයේ පොහොර ආනයනය කිරීම හා බෙදාහැරීම රජයේ සහනාධාර ප්‍රතිපත්තිය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම
25. නියමිත ප්‍රමිතියෙන් යුත් රසායනික පොහොර හා පරිසර හිතකාමී කාබනික පොහොර නිසි කලට බෙදා හැරීම සඳහා ක්‍රමවේද සැකසීම
26. දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් අන්තර්ජාතික ප්‍රමිතියට අනුගතව කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීම
27. දේශීය ගොවියා සහ පාරිභෝගිකයා සෑහීමට පත්වන ආකාරයේ සාධාරණ මිල ප්‍රතිපත්තියක් සහ භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම
28. අතිරික්ත නිෂ්පාදන ගබඩා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීම
29. කෘෂි නිෂ්පාදන අගය එකතු කර අපනයනය කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම
30. ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා දේශීය බීජ ප්‍රතිපත්තියක්  හඳුන්වා දීම
31. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පෞද්ගලික  අංශය දිරිමත් කිරීම
32. රජයේ ගොවිපොළවල් හා බීජ නිෂ්පාදන ගොවිපොළ සංවර්ධනය
33. දේශීය නිෂ්පාදනය වැඩිකිරීම තුළින් ආහාර භෝග ආනයනය අවම කිරීම
34. පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම
35. සත්ත්ව සුබසාධනය හා ඒ සම්බන්ධ කටයුතු
36. නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම
37. පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝග වලින් ආරක්ෂා කිරීම හා නිරෝධායනය කටයුතු
38. විවිධ භූගෝලීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපොළ සංවර්ධනය දිරි ගැන්වීම
39. පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම හා අපනයනය සඳහා දිරිගැන්වීම

40. මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපොළවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම
41. කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදන හා පාරිභෝජන අවස්ථා පුළුල් කිරීම
42. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය
43. සත්ත්ව ආහාර සඳහා අවශ්‍ය බඩඉරිඟු රට තුළ වගා කිරීම සඳහා කටයුතු කිරීම
44. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණය
45. ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු
46. සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා**

1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
4. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය
6. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
7. වී අලෙවි මණ්ඩලය
8. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය
9. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
10. ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය)
11. ජාතික පොහොර ලේකම් කාර්යාලය
12. ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්
13. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)
14. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා ආශ්‍රිත සමාගම්
15. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
16. සීමාසහිත මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම

- **කෘෂිකර්ම සහ පශු සම්පත් අංශ මගින් ක්‍රියාත්මක කරන අණපනත්**

1. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත (1999 අංක 20)
2. ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46)
3. ග්‍රාමෝදය මණ්ඩල පනත (1982 අංක 28)
4. ගස් හෙළීම (පාලන කිරීම) පනත (1951 අංක 9)
5. බීජ වී පනත (2003 අංක 22)
6. පස් සංරක්ෂණ පනත (1996 අංක 24)
7. වී අලෙවි මණ්ඩල පනත (1971 අංක 14)
8. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතන පනත (1972 අංක 5)
9. කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා වන ශ්‍රී ලංකා සභාව පනත (1987 අංක 47)
10. රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත (1972 අංක11)

11. පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත (1980 අංක 33)
12. පැළෑටි ආරක්ෂා කිරීමේ පනත (1999 අංක 35)
13. පොහොර විධිමත් කිරීමේ පනත (1988 අංක 68)
14. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනත (1973 අංක 18)
15. සත්ත්ව රෝග පනත (1992 අංක 59)
16. සත්ත්ව ආහාර පනත (1986 අංක 15)
17. සත්ත්ව පනත (1958 අංක 29)
18. පශු වෛද්‍ය වෘත්තික පනත (1956 අංක 46)
19. අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය පනත (1992 අංක 46)
20. වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

## කෘෂිකර්ම අංශය සහ පශු සම්පත් අංශය

- **දැක්ම**

ආහාර සුරක්ෂිතතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාර්යක්ෂම, ඵලදායී හා ශක්තිමත් කෘෂිකාර්මික අංශයක්

- **මෙහෙවර**

ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය තුළින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතුව, ගෝලීය තරඟකාරී නිෂ්පාදනයන් බිහිකරන ව්‍යවසායකත්ව කෘෂිකර්මාන්තයක් සාක්ෂාත් කර ගැනීම.

- **අරමුණු**

1. ආහාර හා ආශ්‍රිත කෘෂි භෝග විෂයයෙහි ප්‍රතිපත්තිමය සහාය සැපයීම
2. ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කිරීම
3. කෘෂි නිෂ්පාදන සඳහා ස්ථාවර මිලක් පවත්වා ගැනීම
4. වී මිල දී ගැනීමේ හා වෙළෙඳපොල වැඩසටහන් කාර්යක්ෂම කළමනාකරණය
5. ව්‍යාපෘති නිසි කලට ක්‍රියාත්මක කිරීම
6. තෝරාගත් භෝගවල නිෂ්පාදනය ඉහළ නැංවීම
7. කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම
8. විදේශ අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යෙදවීම
9. සේවාලාභීන්ට මිත්‍රශීලී හා ප්‍රතිඵල අරමුණු කරගත් පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
10. සමස්ත රාජ්‍ය අංශය තුළ ඵලදායි කළමනාකරණයක් ඇති කිරීම

- **අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු තිරසාර සංවර්ධන අරමුණු**

1. අරමුණ 2 - සාගිනි නිමවා, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්වයක් සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.
2. අරමුණ 5 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.
3. අරමුණ 12 - තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.

## 2025 වසර තුළ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල සාරාංශය හා මූල්‍ය ප්‍රගතිය

**(වැය ශීර්ෂ අංක 118 යටතේ කෘෂිකර්ම සහ පශු සම්පත් අංශවල, 2025.09.30 දින දක්වා)**

| අ/අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන | 101,780.00 | 102,877.31 | 34,805.13 | 34 |
| 2 | පුනරාවර්තන | 51,639.00 | 51,633.00 | 34,544.67 | 67 |
| | **සමස්ත අයවැය** | **153,419.00** | **154,510.31** | **69,349.80** | **45** |

**කෘෂිකර්ම අංශය - ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | | | | |
| 1. | පොහොර සහනාධාර වැඩසටහන | 35,000.00 | 35,000.00 | 22,727.74 | 65 |
| 2. | පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය (ණය පොලී ගෙවීම) | 2,005.00 | 2,005.00 | 1,181.43 | 59 |
| | ප්‍රාග්ධන | | | | |
| 1. | ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික ප්‍රවර්ධන විශේෂ වැඩසටහන | 550.00 | 640.07 | 57.65 | 9 |
| 2. | අතිරේක බෝග වගා වැඩසටහන | 150.00 | 150.00 | 25.69 | 17 |
| 3. | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම විශ්ව විද්‍යාල සමග ක්‍රියාත්මක කිරීම | 56.00 | 55.55 | 49.05 | 88 |
| 4. | බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය | 1,500.00 | 1,500.00 | 626.00 | 42 |
| 5. | ආරක්ෂිත වී තොගයක් පවත්වා ගෙන යාම | 6,000.00 | 6,000.00 | 5,949.80 | 99 |
| 6. | කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය (පිටු අංක 14 බලන්න) | 500.00 | 500.00 | - | - |
| 7. | පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය (ණය මූලධන ගෙවීම) | 8,664.00 | 8,664.00 | 6,978.81 | 81 |
| | ***උප එකතුව - i*** | **17,420.00** | **17,509.62** | **13,687.00** | **78** |
| | විදේශාධාර ව්‍යාපෘති | | | | |
| 1. | දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය (CSIAP) (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 8,775.00 | 8,765.00 | 2,832.23 | 32 |
| 2. | කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) - IFAD | 3,470.00 | 3,470.00 | 1,167.00 | 34 |
| 3. | කෘෂිකාර්මික අංශය නවීකරණ කිරීමේ ව්‍යාපෘතිය (ASMP) - (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව) | 1,250.00 | 2,829.50 | 1,635.80 | 58 |
| 4. | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන (SARP) | 5,947.00 | 4,443.45 | 709.34 | 16 |
| 5. | ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය | 30.00 | 40.00 | 5.52 | 14 |
| 6. | කොළඹ - කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත් වැඩියාව හා ප්‍රතිසංස්කරණය | - | 6.24 | 1.33 | 21 |
| | ***උප එකතුව - ii*** | **19,472.00** | **19,554.19** | **6,351.22** | **32** |

| අ/අ | වැඩසටහන | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන | | | | |
| 1. | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය | 38.00 | 38.00 | 13.75 | 36 |
| 2. | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 33.00 | 33.00 | 8.50 | 26 |
| 3. | ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | 338.00 | 338.00 | 104.09 | 31 |
| 4. | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 75.00 | 75.00 | 32.88 | 43 |
| | ***උප එකතුව - iii*** | **484.00** | **484.00** | **159.22** | **33** |
| | **මුළු එකතුව - (i+ii+iii)** | **37,376.00** | **37,547.81** | **20,197.44** | **54** |

**පශු සම්පත් අංශය - වැය ශීර්ෂ අංක 118 යටතේ සිදුකරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි) | වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1. | සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය | 69.00 | 7.21 | 11 |
| 2. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය) | 150.00 | 18.27 | 12 |
| 3. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන ආධාර) | 100.00 | 9.17 | 09 |
| 4. | එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 200.00 | 0.005 | 0.003 |
| | **මුළු එකතුව** | **519.00** | **34.66** | **06** |

## 2026 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ඉලක්ක

- **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | **135,000.00** |
| | කෘෂිකර්ම හා පශු සම්පත් අංශය | 52,000.00 |
| | වාරිමාර්ග අංශය | 78,000.00 |
| | ඉඩම් අංශය | 5,000.00 |
| | | |
| 2 | පුනරාවර්තන වියදම් | **89,000.00** |
| | කෘෂිකර්ම හා පශු සම්පත් අංශය | 71,000.00 |
| | වාරිමාර්ග අංශය | 10,000.00 |
| | ඉඩම් අංශය | 8,000.00 |
| | **එකතුව (1 + 2)** | **224,000.00** |

## 01. කෘෂිකර්ම අංශය

**2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

- **පොහොර සහනාධාර වැඩසටහන**

| අ/අ | වැඩසටහන | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු.මි.) |
|---|---|---|
| | **පුනරාවර්තන** | |
| 1. | රසායනික හා කාබනික පොහොර සඳහා පොහොර සහනාධාර වැඩසටහන (මුදල් ප්‍රදාන) | 36,900.00 |
| 2. | පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය (ණය පොලී ගෙවීම) | 700.00 |
| | | |
| | **ප්‍රාග්ධන** | |
| 1. | පොහොර සහනාධාර වැඩසටහනේ කාලීන ණය (ණය මූලධන ගෙවීම) | 5,500.00 |

- **අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

| අ/අ | වැඩසටහන | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු.මි.) |
|---|---|---|
| 1. | ආහාර සුරක්ෂිතතාව හා තාක්ෂණය පිළිබඳ විශේෂ වැඩසටහන | 800.00 |
| 2. | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම විශ්ව විද්‍යාල සමග ක්‍රියාත්මක කිරීම | 80.00 |
| 3. | බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය | 1,800.00 |
| 4. | අතිරේක බෝග වගා වැඩසටහන | 200.00 |
| 5. | කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය | 750.00 |

| අ/අ | වැඩසටහන | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු.මි.) |
|---|---|---|
| | **එකතුව** | **3,630.00** |

## 02. පශු සම්පත් අංශය

- **2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්)**

| අ/අ | වැඩසටහන | ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු.මි.) |
|---|---|---|
| 1. | සතුන් අභිජනනය කිරීමේ ගොවිපොළ ස්ථාපනය කිරීම | 150.00 |
| 2. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය) | 140.00 |
| 3. | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන සහායන්) | 200.00 |
| 4. | එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධනය | 300.00 |
| | **එකතුව** | **790.00** |

# කෘෂිකර්ම අංශය

# වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

## 01. ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික ප්‍රවර්ධන විශේෂ වැඩසටහන
වැය ශීර්ෂ අංක 118-2-03-020-2202

ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණය වැඩසටහන යටතේ 2025 අයවැය මඟින් රු.මි. 550.00 ක් වෙන් කරන ලදි. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ රජයේ උපාය මාර්ගික ප්‍රමුඛතා පහත පරිදි වේ.

i.) ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සහ තාක්ෂණික ප්‍රවර්ධනය.
ii.) කෘෂිකර්ම පද්ධතිවල ඉහළ නිෂ්පාදනමය හා කාර්යක්ෂමතාවය සහතික කිරීම.
iii.) කෘෂිකාර්මික ව්‍යවසායකයන් සහ තිරසාර වෙළඳපල ප්‍රවර්ධනය කිරීම.
iv.) ප්‍රශස්ත ඉඩම් කළමනාකරණයට පහසුකම් සැලසීම.
v.) කෘෂිකාර්මික පිළිවෙත් නිසි ලෙස කළමනාකරණයට පහසුකම් සැලසීම.
vi.) කෘෂිකර්මාන්තයට අදාළ මෙහෙයුම් පරිසර හිතකාමී ලෙස ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීම.
vii.) ව්‍යවසායකත්වයට සහ ආර්ථික වර්ධනය සඳහා ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම.
viii.) කෘෂිකාර්මික පර්යේෂණ හා දැනුම කළමනාකරණය කිරීමට සහය වීම.

මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා හඳුනාගත් විශේෂිත බෝගවල (ක්ෂේත්‍ර බෝග, අල බෝග, එළවළු බෝග) නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම, කෘෂිකර්මය සඳහා උසස් තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම, කෘෂි පාදක කර්මාන්ත ප්‍රවර්ධනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය, ජල කළමනාකරණය, දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා වන බෝග ආරක්ෂණ වැඩ පිළිවෙල, කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු, කෘෂිකර්ම නවෝත්පාදනය සහ පසු අස්වනු කළමනාකරණය යන ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.

කෘෂිකර්ම අමාත්‍යාංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල (17 සමග), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය, වී අලෙවි මණ්ඩලය, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ව්‍යාපෘතියේ ප්‍රගති පාලන කටයුතු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

| අ/අ | ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිදහස් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 1 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 11 | 34.30 | **57.65** | **32** |
| 2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල (17 ක් මඟින්) | 60 | 156.23 | | |
| 3 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 52 | 252.58 | | |
| 4 | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය | 07 | 26.20 | | |
| 5 | වී අලෙවි මණ්ඩලය | 02 | 15.96 | | |
| 6 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 02 | 7.00 | | |
| 7 | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව | 01 | 2.00 | | |

| අ/අ | ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | නිදහස් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 8 | ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය (හදබිම අධිකාරිය) | 01 | 8.73 | | |
| 9 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 06 | 27.67 | | |
| | **එකතුව** | **142** | **530.66** | | |

**02. අතිරේක බෝග වගා වැඩසටහන**
**වැය ශීර්ෂ අංක 118-2-03-071-2202**

ප්‍රාදේශීය වශයෙන් පවතින විභවතාවයන් මත ව්‍යාප්ත වී පවතින අතිරේක ආහාර බෝග වගාවන් හඳුනාගෙන ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමත් එමගින් ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමට දායකත්වය ලබා ගැනීමත් වෙනුවෙන් අදාළ වගාකරුවන් වෙත දිරි ගැන්වීම් සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

2025 වර්ෂයේ අතිරේක ආහාර බෝග වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.150 ක ප්‍රතිපාදන වෙන් වූ අතර, උඳු, මුං, රටකජු හා කව්පි යන අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා බීජ සහනාධාර ලබා දීම සිදු විය. තවද මෙම වැඩසටහන යටතේ තුන්වන කන්නයේ මුං වගා වැඩසටහන්ද ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන යටතේ යාපනය, කිලිනොච්චි, මොනරාගල, අම්පාර, කුරුණෑගල, මන්නාරම, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මුලතිව්, පුත්තලම, මඩකලපුව, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වූ අතර මේ වන විට රු.මි. 25.69 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වේ.

ඡායාරූප අංක 01

**03. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම විශ්ව විද්‍යාල සමග ක්‍රියාත්මක කිරීම**
**වැය ශීර්ෂ අංක 118-2-03-026-2507 (SLCARP)**

ආයතනය යටතේ දක්වා ඇත (පිටු අංක 76 - 79).

**04. බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය**
**වැය ශීර්ෂ අංක 118-2-03-043-2202**

ආයතනය යටතේ දක්වා ඇත (පිටු අංක 70 - 71).

**05. ආරක්ෂිත වී තොගයක් පවත්වාගෙන යාම**
**වැය ශීර්ෂ අංක 118-2-03-094-2509**

අතිගරු ජනාධිපතිතුමා විසින් 2025 වර්ෂය සඳහා 2025.02.17 දින ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා මගින් වී අළෙවි මණ්ඩලය විසින් ප්‍රමාණවත් ආරක්ෂක වී තොගයක් පවත්වා ගැනීම සඳහා රු.මි. 6,000.00 ක් වෙන් කර ඇත.

වී මිලෙහි නිරන්තරයෙන් පවතින අස්ථායීතාවයෙන් මිදීම සඳහා සහ වෙළෙඳපොළේ සහල් ඉල්ලුම සහ සැපයුම සීමා කිරීමේදී ඊට ඔරොත්තු දීමේ පියවරක් ලෙසත් 2024/2025 මහ කන්නයේ සිට ප්‍රමාණවත් ආරක්ෂණ තොගයක් පවත්වා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, 2024/2025 මහ

කන්නය සඳහා රු.මි 5,000.00 ක් වෙන් කර ඇති අතර වෙළඳපොලේ වී සහ සහල් තොග එකතු කිරීම සහ ගබඩා කිරීම නියාමනය කිරීම නියාමන රාමුවක් සකස් කර ඇත.

මෙම වැඩසටහනෙහි 2025.09.30 දිනට වියදම රු.මි. 5,949.80 කි. වාර්ෂික භෞතික ඉලක්කය මෙ.ටො. 48,000 ක් වන අතර 2025.09.30 වන විට මෙ.ටො. 49,571.50 ක් මිලදී ගෙන ඇත. එය ප්‍රතිශතයක් ලෙස 103%කි.

## 06. කෘෂිකර්ම හා කර්මාන්ත අංශවල තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය
## වැය ශීර්ෂ අංක 118-2-03-095-2202

කෘෂිකර්මාන්තය හා පශු සම්පත් ක්ෂේත්‍ර පදනම් කර ගත් ව්‍යාපාර ආරම්භ කිරිමට, සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයින් ප්‍රවර්ධනය සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ සඳහා රු. මි. 500.00 ක් වෙන් කර ඇත. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාවයක් වන තරුණ ව්‍යවසායකයින් 50,000 ක් බිහි කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සෘජුව දායක වේ.

**ව්‍යාපෘතියෙහි මූලික අරමුණු**

i.) 2025 දී අවම වශයෙන් කෘෂිකාර්මික ව්‍යවසායකින් 100 ක් නිර්මාණය කිරිම. සඳහා උපරිම වශයෙන් රු. මි. 05.00 ක් දක්වා වූ අඩු පොලියක් සහිත (වාර්ෂිකව 4%ක්) මූල්‍ය පහසුකම් ලබා දීම.
ii.) අගය එකතු කළ සහ නව්‍ය කෘෂිකාර්මික සහ පශු සම්පත් නිෂ්පාදන වැඩි කිරිම සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල අපනයන පරිමාව වැඩි කිරිම.
iii.) ව්‍යාපෘතියේ සෘජු ප්‍රතිලාභින්ගේ ආදායම් මට්ටම වැඩි කිරිම.

මෙම සහනදායි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා ලංකා බැංකුව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන යන බැංකු හරහා පහසුකම් සපයනු ලැබේ.

කෘෂිකාර්මික බෝග හා ධාන්‍ය වර්ග ආශ්‍රිත වගා කිරීමේ, වගා ආරක්ෂිත උපකරණ ඇතුළුව අනෙකුත් කෘෂිකාර්මික උපකරණ මිලදී ගැනීමේ, දේශීය කෘෂි නිෂ්පාදන පාදක කොට ආහාර සැකසීමේ කර්මාන්ත, අපනයනය ප්‍රමුඛ කොටගත් කුඩා හා මධ්‍යම පරිමාණ කෘෂිකර්මික ව්‍යාපෘති, කෘෂිකර්මාන්තය ආශ්‍රිත අගය එකතු කිරීමේ ව්‍යාපෘති සහ පශු සම්පත් ආශ්‍රිත ව්‍යාපෘති මේ යටතේ මූල්‍යනය කෙරේ.

**ප්‍රගතිය**
ප්‍රතිලාභීන් වෙත ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

# වැය ශීර්ෂ අංක 118 පුනරාවර්තන වියදම් යටතේ සිදුකරන ලද ප්‍රධාන වැඩසටහනෙහි ප්‍රගතිය

## 1. පොහොර සහනාධාර වැඩසටහන

ඉහළ ඵලදායිතාවයක් - ආහාර සුරක්ෂිත රටක් යන ප්‍රතිපත්තියට අනුව කෘෂිකාර්මික (කුඹුරු ) ඉඩම් වල වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කරන ගොවීන් වෙත අවශ්‍ය පොහොර සපයා ගැනීම සඳහා පොහොර මූල්‍ය සහනාධාරය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක වන අතර එකී වැඩසටහන මගින් කෘෂි යෙදවුම් කළමනාකරණය හා නිවැරදි පරිදි ශාක පෝෂක යෙදීම දිරිමත් කිරිම තුලින් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට ඇති හැකියාව සහ ගොවීන්ගේ ආදායම් උත්පාදනය ඉහළ නැංවීමටත්, පෝෂණ ඌණතාවයන් මඟ හරවා ගනිමින් ආහාර අර්බුදය සමනය කර ගැනීමටත්, ආහාර බෝග

ආනයනය වෙනුවෙන් වාර්ෂිකව විදේශයන් වෙත ඇදී යන විදේශ විනිමය අවම කර ගැනීමටත් හැකියාව ලැබේ.

වර්තමානයේදී කෘෂිකාර්මික (කුඹුරු) ඉඩම් වල සිදු කරනු ලබන වී වගාව සඳහා හෙක්ටයාරයකට රු.25,000ක් ද කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් නිර්දේශ කරනු ලබන හා කන්න රැස්වීම් වලදී තීරණය කරනු ලබන අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාවන් සඳහා රු.15,000 ක්ද වන සේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එක් ගොවියෙක් වෙත උපරිම වශයෙන් හෙක්ටයාර දෙකක් (02) සඳහා පොහොර මූල්‍ය සහනාධාරය ලබා දීම සිදු වේ.

ඒ අනුව, කෘෂිකාර්මික, ආර්ථික හා සාමාජ සංවර්ධනය මෙන්ම තිරසාර සංවර්ධනය ඇතුළු ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම සහ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන පොහොර ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් සාධාරණ මිලකට ලබා දීම යනාදී අරමුණු සඵල කර ගැනීම උක්ත පොහොර මූල්‍ය සහනාධාරය ගොවීන් වෙත ලබා දීමේ වැඩසටහන මගින් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරන කෙරේ.

- **මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | වෙන් කළ මුදල (රු.මි) | වියදම් කළ මුදල (රු.මි) 2025.09.30 දිනට | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 35,000.00 | 22,727.74 | 65 |

- **භෞතික ප්‍රගතිය**

**2025 යල කන්නය**

**i.)** 2025 යල කන්නය වෙනුවෙන් වී වගා කරනු ලබන ගොවීන් වෙත පොහොර සපයා ගැනීම සඳහා හෙක්ටයාර 01 ක් වෙනුවෙන් රු. 25,000.00 බැගින් උපරිම වගා හෙක්ටයාර 2 ක් සඳහා රු. 50,000.00 ක මුදලක් ද අනෙකුත් බෝග වගා කරන ගොවීන් හට හෙක්ටයාර 01 ක් වෙනුවෙන් රු. 15,000.00 බැගින් උපරිම වගා හෙක්ටයාර 2 ක් සඳහා රු. 30,000.00 ක මුදලක්ද ගොවීන්ගේ පුද්ගලික ගිණුම්වලට බැර කරන ලදී.

**ii.)** ඒ අනුව, 2025 යල කන්නයට අදාලව සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වී වගා කරන ගොවීන් වෙත පොහොර මූල්‍ය සහනාධාර ලබා දීම සිදු කර ඇති අතර කොළඹ, කළුතර, ගාල්ල, මාතර, කිලිනොච්චිය, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්ක හැර අනෙකුත් සියළුම දිස්ත්‍රික්ක වල අනෙකුත් බෝග වගා කරන ගොවීන් වෙත පොහොර මූල්‍ය සහනාධාරය ලබා දී ඇත.

| කන්නය | බෝග වර්ගය | වියදම් කළ මුදල (රු.මි.) | බිම් ප්‍රමාණය (හෙක්.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 2025 යල කන්නය | වී | 13,229.06 | 527,514.09 | 868,808 |
| | අනෙකුත් බෝග | 212.71 | 14,180.63 | 48,870 |

ඒ අනුව, 2025 යල කන්නය වෙනුවෙන් වී සහ අනෙකුත් බෝග වගා කරන ගොවීන් වෙත පොහොර මූල්‍ය සහනාධාරය ලබා දීම සඳහා රජය විසින් දරන ලද මුළු වියදම රු.මි.13,441.77 කි.

# 2025 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය

## 01. කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (ASMP)

### 1.1. හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර මෙම වර්ෂයේ අයවැය මගින් වෙන් කළ සංශෝධිත ප්‍රතිපාදනය වන රු.මි 2,829.50 ක අරමුදල නිරවුල් නොකළ බිල්පත් ගෙවීම සහ ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාර්යයන් සඳහා යොදවා ඇත.

2025.09.30 දින වන විට මූල්‍ය ප්‍රගතිය රු.මි 2,421.50 වේ.

ඡායාරූප අංක 02

## 02. දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය (CSIAP)

### 2.1. හැඳින්වීම

දේශගුණික අවදානමට ලක්වූ ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ප්‍රදේශවල සිටින කුඩා පරිමාණ ගොවි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහ වාරි කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අරමුණින්, ලෝක බැංකු මූල්‍ය සහයෝගීතාව (ඇමරිකානු ඩොලර් මිලියන 125ක) ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2019 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලබයි. දේශගුණයට ඔරොත්තු දෙන කෘෂි පිළිවෙත් සහ තාක්ෂණය භාවිත කරමින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ඉලක්කගත කුඩා ගොවි නිෂ්පාදන ප්‍රජාව සඳහා වෙළඳපොල ප්‍රවේශය වැඩි දියුණු කිරීම තුළින් මෙම අරමුණ සාක්ෂාත් කරගනු ඇත. ශ්‍රී ලංකාවේ උතුරු පළාත (කිලිනොච්චිය සහ මුලතිව්), නැගෙනහිර පළාත (මඩකළපුව, අම්පාර සහ ත්‍රිකුණාමලය), උතුරුමැද පළාත (අනුරාධපුර සහ පොළොන්නරුව), වයඹ පළාත (කුරුණෑගල සහ පුත්තලම), දකුණු පළාත (හම්බන්තොට) සහ ඌව පළාත (මොණරාගල) යන පළාත් 6 ආවරණය වන පරිදි පරිපාලන දිස්ත්‍රික්ක 11ක තෝරාගත් ප්‍රදේශවල දේශගුණික විපර්යාසයන්හි බලපෑම නිසා අවදානමට ලක්වන කුඩා පරිමාණ 350,000කට අධික ප්‍රමාණයකට සහ ගොවි පවුල් 70,000කට පමණ සෘජු ප්‍රතිලාභ සලසමින් හෙක්ටයාර් 375,000ක වගා බිම් ප්‍රමාණයක් ආවරණය කිරීම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

### 2.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 4,000.00 |

### 2.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | දේශගුණ සුහුරු වාරි කෘෂි ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය අවසන් කිරීමට අදාළ බිල්පත් පියවීම | | 4,000.00 | 4,000.00 |
| | මුළු එකතුව | | | | **4,000.00** |

**2.4. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/ අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | 8,775,00 | 2,832.23 | 32 |

**2.5. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

- 2025 සඳහා වෙන්කළ රු.මි. 8,775.00 ක් වන අතර, එම මුදලින් රු.මි. 2,832.23ක් මේ වනවිට වැය කර ඇත. ඒ අනුව සමස්ත ව්‍යාපෘති මූල්‍ය වෙන්කිරීම වූ රු.මි.37,014 න් (ඩොලරයේ සාමාන්‍ය අගය රුපියල් 300/= ක් ලෙස සලකා) 26,934.12 ක් වැයකර ඇත.
- තුන්වන කාර්තුව අවසානය වනවිට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 90% ක් විය.
- කෘෂි යෙදවුම් හා උපකරණ ලබා ගෙවතු වගා වැඩසටහන සඳහා යොමු වූ සමස්ත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 66,039ක් වේ. යල සහ මහ වගාකන්න පිළිවෙලින් හෙක්. 14,700ක් හා 19,600ක් වගාකර ආසන්න වශයෙන් අස්වනු මෙ.ටො. 29,100 හා 46,100 ලබා ඇති අතර, අතරමැදි කන්න වගාවට ගොවීන් යොමුකිරීමෙන් හෙක්. 5,613ක වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සාර්ථකව සිදු කෙරේ.
- දේශගුණ සුහුරු ගොවි පුහුණු පාසලේ වැඩසටහන් 127කින් ගොවීන් 2861ක් පුහුණු වී ඇති අතර එම දැනුම ඔවුන් තම අසල්වැසි ගොවි ප්‍රජාව වෙත ව්‍යාප්ත කිරීම අපේක්ෂා කෙරේ. ගොවි ව්‍යාපාර පාසල් පිළිබඳ මොඩියුල 12කින් යුත් පැකේජයක් සකස්කර, කෘෂි උපදේශකවරුන් 113ක් සහ කෘෂි පහසුකාරවරුන් 47ක් පුහුණුකරුවන් ලෙස පුහුණුකර, ඔවුන් මඟින් ගොවීන් 15,000ක් පුහුණු කිරීමට කටයුතු කර ඇති අතර දැනට ගොවීන් 11,200ක් පමණ එම පුහුණුව ලබා ඇත.
- 2025 වසරේ දී දේශගුණ සුහුරු කෘෂි ආදර්ශ ගම්මාන 30ක් පිහිටුවීම පිණිස මූලික කටයුතු කර ඇත.
- කෘෂි නිෂ්පාදන සමිති 544ක් සහ සරිලන පරිදි එම සමිති එකතුකර නිෂ්පාදන සමාගම් 45ක් පිහිටුවා එම සාමාජිකයින් වෙත පුහුණුව ලබා දේ. අස්වනු අලෙවිය හා තරඟකාරී වෙළඳපොළ මිල අරමුණුගතව, මෙම නිෂ්පාදන සමාගම්, ප්‍රධාන ව්‍යාපාරික සමාගම් සමඟ ව්‍යාපාර සම්බන්ධතා ස්ථාපිත කිරීමට යොමුකර ඇති අතර ඒ යටතේ ප්‍රධාන වෙළඳ ව්‍යාපාර වෙත කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම දිරිගන්වා ඇත.
- මුලතිව්, ඔඩ්ඩුසුඩාන් කුලාම්පුරෙයිහි මෙටො. 1,000ක පරිමාණයෙන් යුත් මධ්‍යම ප්‍රමාණයේ ධාන්‍ය ගබඩාවක් සම්පූර්ණ කර භාර දී ඇත. ප්‍රවේශ මාර්ගය ව්‍යාපෘතිය ආධාරයෙන් පිළිසකර කරමින් පවතී,
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන පළාත් 06 තුළ ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 ක් වෙත කෘෂි යන්ත්‍රෝපකරණ හා කෘෂි යෙදවුම් ලබා දී ඇත. ව්‍යාපෘතිය ආරම්භයේදීම සියලුම සේවා මධ්‍යස්ථාන නවීකරණය කරන ලදී.
- කෘෂි ළිං 1,316ක් ප්‍රතිසංස්කරණය කර ඒ යටතේ වගාවන් සිදුකෙරේ. තවත් ළිං 200ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරමින් පවතී. දෙවන අදියර යටතේ කෘෂි-මාවත් 52ක් ප්‍රතිසංස්කරණය කිරීමට ආරම්භ කර ඇත.
- සූර්යබල ජල සම්පාදන පද්ධති ලබා දී වගාවට යොමු කර ඇති ගොවීන් 300ක් පමණ වේ.

– ප්‍රතිලාභී පවුල් හා වගාවන්ගේ සුරක්ෂිතතාව පිණිස වගා ආරක්ෂිත විදුලිවැට කි.මී. 1,400ක් නිම කිරීමට සැලසුම් කරඇති අතර කි.මී. 765ක් ආවරණය කෙරෙන පරිදි වගාවැට සඳහා සහාට ලබා දී තවත් කි.මී.740ක් පමණ ආවරණය කිරීමට හැකි පරිද අවාශ උපකරණ බෙදා දෙමින් පවතී.
– සිදු කරනු ලබන සියලුම ව්‍යාපෘති ඉදිකිරීම් වලට අදාලව සමාජ විගණන කමිටු 519ක් ස්ථාපිතකර ඇත.
– වාරි කෘෂි සංවර්ධනය පිණිස එල්ලංගා පද්ධති 72ක් තුළ ප්‍රතිසංස්කරණයට නියමිතව ඇති වැව් 476කි. එම අදියර-1 හි වැව් අතරින් වැව් 461ක ප්‍රතිසංස්කරණ කටයුතු නිමකර ඇත. ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු මෙම වසර අවසන් වීමට පෙර නිම කිරීමට සැලසුම් කර ඇත. අදියර-2 සඳහා වැව් 177ක ප්‍රතිසංස්කරණ කටයුතු අරඹා ඇති අතර වසර අවසන් වනවිට නිම කිරීමට අපේක්ෂිතයි.
– වගාවට අවශ්‍ය ජලය නිසි ප්‍රමාණයෙන් නිකුත් කිරීම පිළිබඳව අවබෝධය ලබා දෙන වාරි පද්ධති මෙහෙයුම් හා කළමනාකරණය/ජල කළමනාකරණය සඳහා ගොවි සමාගම් මූලිකව පුහුණු සැසි 260ක් පවත්වා ඇත. ගොවි සමාගම් වෙත ජල කළමනාකරණය සම්බන්ධ අත්පොත්/දත්ත සටහන් පොත් 8500ක් බෙදා දී ඇති අතර තවත් 5200ක් සැපයීමට කටයුතු කර ඇත.
– කාර්යක්ෂම වාරි ජල භාවිතය අරමුණු කරගත් ලේසර් තාක්ෂණය යොදා ගෙන කුඹුරු මට්ටම් කිරීම පිළිබඳව මූලික දැනුවත් කිරීම සිදුකර ඇති අතර මේ වන විට එසේ වගා කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 21කි. ලේසර් තාක්ෂණික උපකරණ පද්ධති දෙකක් හා අදාළ ට්‍රැක්ටර් සමග මිලදී ගෙන උතුර හා වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත භාරදීමට නියමිතයි.
– එල්ලංගා පද්ධති මූලිකව ජල කළමනාකරණ සැලසුම් 35ක් මේ වන විට සකස් කර ඇත.
– මෙහෙයුම් කළමනාකරණය හා තිරසාර පැවැත්ම අරමුණු කර එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු 60ක් පිහිටුවා ඇත. පළාත් 06තුළ පාර්ශවකරුවන් සහභාගිත්වයෙන් හරස්කඩ චාරිකා (Transect Walk) සිදුකර සකස්කළ එල්ලංගා පද්ධති පැතිකඩ අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ සැලසුම් 60කින් මේ වන විට 59ක් නිමකර ඇත. එම සැලසුම්වල අඩංගු ක්‍රියාකාරකම් 149ක් ක්‍රියාත්මක කිරීම පිණිස හඳුනාගෙන ඇත.
– පාරිසරික සහ සමාජ ආරක්ෂණය යටතේ, ව්‍යාපෘතියේ ක්‍රියාත්මක මැදිහත්වීම් සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා 328ක් සැකසීම, ජලපෝෂක ප්‍රදේශ කළමනාකරණය ඉලක්ක කරගත් රුක් රෝපන වැඩසටහන තුළින් නැවත වන සංරක්ෂණය, කෘෂි වන සංරක්ෂණය, සුළං බාධක ස්ථාපනය, කට්ටකඩුව සංවර්ධනය, වන්දි ගස් සිටුවීම යනාදී ලෙස පැල 17,100ක් රෝපනය කිරීමට කටයුතු කර ඇත.
– ප්‍රතිලාභීන්ගෙන් ඉදිරිපත්වන දුක් ගැනවිලි සඳහා විසඳුම් ලබාදීමේ යාන්ත්‍රණය තුළින් ඉදිරිපත්වී ඇති ගැටළුකාරී අවස්ථා 317න් 316ක් සඳහා විසඳුම් ලබා දී ඇත.

ඡායාරූප අංක 03 - 06

## 03. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP)

### 3.1. හැඳින්වීම

කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) දිවයින පුරා කුඩා පරිමාණ කෘෂිකාර්මික ප්‍රතිලාභීන් 57,500 කගේ ආදායම සහ ගුණාත්මකභාවය තිරසාර ලෙස ඉහළ නැංවීම ප්‍රධාන අරමුණුකොට ගත් වැඩසටහනකි. මේ සඳහා ශ්‍රී ලංකා රජය (GOSL) සහ කෘෂිකාර්මික සංවර්ධනය

සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) ඒකාබද්ධව අරමුදල් සපයනු ලැබේ. මෙම වැඩසටහන මගින් රාජ්‍ය, පුද්ගලික, නිෂ්පාදක හා හවුල්කාරිත්වය යන 4P ප්‍රවේශය හරහා කුඩා පරිමාණ කෘෂිකාර්මික ප්‍රතිලාභීන් වෙත සහනදායී පොලී අනුපාත යටතේ ප්‍රදාන සහ ණය ලබා දීම සිදුකෙරේ. එසේම කුඩා පරිමාණ ගොවීන්ට ඔවුන්ගේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණුව සහ තාක්ෂණික දැනුම ලබා දීම සහ කෘෂිකර්ම මාර්ග, අමුණු ආදි යටිතල පහසුකම් ව්‍යුහය වැඩිදියුණු කිරීම හා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් ඇති කිරීම සඳහා ද සහාය වේ. මෙම ක්‍රියාමාර්ගය මඟින් කෘෂිකාර්මිකයින් අතර හා කෘෂිකර්මාන්තයේ තිරසාර ව්‍යාපාරික සංවර්ධනයක් ඇති කිරීම සහ ගොවීන්ගේ සමාජ හා ආර්ථික ස්වයංපෝෂිතභාවය වර්ධනය කිරීම වැඩසටහනේ ප්‍රධාන ඉලක්කය වේ.

### 3.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල - (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 1,590.00 |
| 2 | පුනරාවර්තන වියදම් | 80.00 |

### 3.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩ සටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | වාණිජ හවුල්කාරිත්වය සඳහා ප්‍රවේශය (4P ව්‍යාපෘති හරහා) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 3,500 | 0.44 | 1,533.00 |
| 2 | තරුණ ව්‍යවසායක සංවර්ධනය | ප්රතිලාභීන් සංඛ්‍යාව | 250 | 0.23 | 57.00 |

### 3.4. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | සංවර්ධන වැඩසටහන් | 1,690.00 | 783.00 | 46 |
| 2 | ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් | 1,780.00 | 384.00 | 22 |
| | **එකතුව** | **3,470.00** | **1,167.00** | **34** |

### 3.5. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

කුඩාපරිමාණ කෘෂිව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) ඇමරිකානු ඩොලර් මිලියන 105 ක මුළු පිරිවැයක් සහිත වසර හයක ව්‍යාපෘතියක් ලෙස 2017 දී ආරම්භ කරන ලදී. එසේ වුවද, කොවිඩ් වසංගතය සහ මෑතකාලීන ආර්ථික අර්බුදයේ බලපෑම සැලකිල්ලට ගනිමින් මෙම වැඩසටහන සඳහා 2023 සිට 2026 දක්වා තවත් වසර තුනක දිගුවක් දෙවරකදී ලබා දෙන ලදී. ශ්‍රී ලංකා රජය (GOSL), කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD), පෞද්ගලික අංශය (කෘෂි ව්‍යාපාර සමාගම්), කුඩා වතු හිමියන්, සහභාගීත්ව මූල්‍ය ආයතන (PFIs) ඒකාබද්ධව දියත් වන මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ කුඩා කෘෂි ව්‍යවසායකයින් 57,500 ක් වෙළඳපල වෙත සම්බන්ධ කිරීමෙන් ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීමත් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන වැඩිදියුණු කිරීමත්වේ. මෙම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික සබැඳියාව සමඟ කෘෂි ව්‍යවසායකයින් සඳහා ලබා දෙන අඛණ්ඩ පුහුණුව තුළින් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ

සහ තාක්ෂණික දැනුම ලබා දීමෙන් වඩාත් හොඳ වෙළඳපොළක් හඳුන්වා දීමට SAPP ආයතනය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත.

වැඩසටහන ආරම්භයේ සිට පුද්ගලික කෘෂි ව්‍යාපාරික ආයතන සහ ගොවි නිෂ්පාදක සංවිධානවල සහයෝගීතාවයෙන් කිරි නිෂ්පාදන, කුළුබඩු, ධාන්‍ය සහ රනිල කුලයට අයත් බෝග, තේ, මල් වගාව සහ එළවළු වැනි ප්‍රධාන කෘෂිකාර්මික අංශ ආවරණය කරමින් 4P (රාජ්‍ය, පුද්ගලික හා නිෂ්පාදක හවුල්කාරිත්ව) ව්‍යාපෘති 39 ක් ස්ථාපිත කිරීමට වැඩසටහන සමත් වී ඇත.

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩ සටහන යටතේ 2025 සැප්තැම්බර් 30 දිනට 4P අගයදාම (රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදක,හවුල්කාරීත්ව යන අංශවල සහභාගීත්වයෙන්), තරුණ සහ ආදායම් උත්පාදන ණය යටතේ ප්‍රතිලාභීන් 48,617 ක් ප්‍රතිලාභ ලබා ඇත. මෙය සමස්ත ව්‍යාපෘති ඉලක්කය වන කෘෂි ව්‍යවසායකයින් 57,500 න් සියයට 84.6 ක ප්‍රතිශතයක් වේ.

2025 සැප්තැම්බර් 30 වන විට වැඩසටහන මඟින් 4P ආකෘතිය දැනට ඉලක්ක කර ඇති ප්‍රතිලාභීන් 43,000 කින් 38,298 දෙනෙකුට ප්‍රතිලාභ ලැබී ඇත. තරුණ කෘෂි ව්‍යවසායකයින් නඟා සිටුවීමේ (YED) වැඩසටහන යටතේ SAPP තරුණ ප්‍රතිලාභීන් 3,590 දෙනෙකුට ද, ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය (IG) හරහා ප්‍රතිලාභීන් 6,729 දෙනෙකුටද ප්‍රතිලාභ ලබා දී ඇත.

තවද, SAPP වැඩසටහන විසින් රේඛීය ආයතනවල සහය ඇතිව කෘෂි ඇළ සහ කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය වැනි ගොවිපලින් බැහැර කෘෂි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘතීන් 94 න් 2025 සැප්තැම්බර් 30 වන විට ව්‍යාපෘතීන් 89 ක් සාර්ථකව අවසන්කර ඇති අතර මේ වනවිට මේ සඳහා රු. මි. 207.80 ක් ආයෝජනය කර ඇත.

මීට අමතරව ගොවි නිෂ්පාදක සංවිධාන වඩාත් තිරසාර ව්‍යාපාරික ආයතන බවට පත් කිරීම සඳහා SAPP මඟින් සපයනු ලබන ආයතනික ශක්තිමත් කිරීමේ (IS) සේවා යටතේ මේ වන විට ක්‍රියාකාරකම් 07 ක් අවශ්‍ය ප්‍රතිදානයන් සහිතව සම්පූර්ණ කර ඇති අතර 2025 වසර තුළ ක්‍රියාත්මක වෙමින් පවතින තවත් එවැනි IS සේවා 13 ක් 2025 වර්ෂය තුල අවසන් කිරීමට නියමිත අතර දැනට මෙම සංරචකය යටතේ රු. මි. 133.00 කට වැඩි ප්‍රගතියක් ලබාගෙන ඇත.

සමස්ත SAPP වැඩසටහන සඳහා IFAD ප්‍රතිපාදන ඉලක්කය වන ඇමරිකානු ඩොලර් මිලියන 54.4 න් මිලියන 40.21 ක් ආයෝජනය කර සියයට 74.1 ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගෙන ඇත. ප්‍රතිලාභීන් සහ ප්‍රවර්ධකයින්ගෙන් වැඩසටහන සඳහා තවදුරටත් දායකත්වය මිලියන 13.62 කි. GoSL, IFAD සහ දායකත්ව ඉලක්කය වන ඩොලර් මිලියන 105 න් 2025 සැප්තැම්බර් 30 වන විට ඩොලර් මිලියන 75.09 (72%) ක් වැය වී ඇත.

මෙතෙක් ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇති ක්ෂුද්‍ර ණය වලින් නැවත අයකර කරගත් මුදල් මූලික ප්‍රාග්ධනය ලෙස යොදවා ශ්‍රී ලංකාවේ කෘෂිකර්මික පද්ධතිය තිරසර කිරීමේ අරමුදලක්, FSSF (Farming System Sustainability Fund) නමින් පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට අවසන් කර ඇති අතර මෙම වසර තුලදී එම අරමුදල හරහා ගොවි සහන ණය ලබා දීම ක්‍රියාත්මක කිරීමට නියමිතය.

SAPP ප්‍රතිලාභීන් ගේ දැනුම වැඩිදියුණු කිරීම සහ මූල්‍ය සංරචක සහ කුසලතා පිළිබඳව දැනගැනීම සඳහා "මූල්‍ය සාක්ෂරතාව" පිලිබඳ පුහුණු වැඩමුළු පැවැත්විණි. 2025 සැප්තැම්බර් 30 වන විට පුහුණු වැඩමුළු 62 ක් පවත්වා ප්‍රතිලාභීන් 2,106 ක් සඳහා මූල්‍ය සාක්ෂරතාව පිලිබඳ මනා පුහුණුවක් ලබා දී ඇත. මෙම පුහුණුව සඳහා සම්පත් දායකත්වය ජාතික ව්‍යවසායක සංවර්ධන අධිකාරියේ (NEDA) නිලධාරින් දරන ලද අතර මෙයට SAPP අගයදාම සජීවීකාරක නිලධාරින්ද සහභාගීවේ.

අඟුනුකොලපැලැස්ස කොට්ඨාශය තුල තරුණ ව්‍යවසායකත්ව ප්‍රතිලාභීන් සඳහා අළුත්වැව විහාරයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිලිබඳ පුහුණුවක් පවත්වන ලද අතර CBL බඩ ඉරිගු ව්‍යාපෘතිය, මිරිස් ව්‍යාපෘතිය සහ මිල්කෝ දියර කිරි ව්‍යාපෘතියේ ගොවින් හට මුල්‍යය සාක්ෂරතා පුහුණුවක් ගලෙන්බිඳුණුවැව මහකැලැගම ප්‍රජාශාලාවේ දී පවත්වන ලදි.

ඡායාරූප අංක 07 – 11

## 04. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ ව්‍යාපෘතිය (SARP)

### 4.1. හැඳින්වීම

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පුත්තලම, කුරුණෑගල, මාතලේ, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම යන වියළි කලාපීය දිස්ත්‍රික්ක 06 ද එම දිස්ත්‍රික්ක අයත්වන මල්වතු ඔය, දැදුරු ඔය සහ මී ඔය යන ගංගාවල පෝෂක ප්‍රදේශවල පිහිටි එල්ලංගා පද්ධතිද පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වේ. මෙමගින් ගොවිපළ වාණිජකරණය ප්‍රවර්ධනය කරන අතරම, කුඩා පරිමාණ ගොවි පවුල් 40,000ක් හෝ පුද්ගලයන් 148,000ක් සඳහා දේශගුණික විපර්යාස මගින් ඇති කරන ලද අභියෝගවලට තිරසර විසඳුම් ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වන්නේ දේශගුණික විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සේවා සපයනු ලබන ආයතනවල හා ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ හැකියා සංවර්ධනය සහ තෝරාගත් යටිතල පහසුකම් අළුතින් ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමයි. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතිය මගින් ඇමරිකානු ඩොලර් මිලියන 82ක් ආයෝජනය කිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘති කාලසීමාව වසර 06 වේ.

### 4.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 9,316.07 |

### 4.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| 1 | දේශගුණික විපර්යාස සඳහා සේවා සපයන්නන්ගේ සහ ගොවීන්ගේ ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීම | වැඩසටහන් | 406.47 |
| 2 | කෘෂිකර්මය ආශ්‍රිත අගයදාම සංවර්ධන කටයුතු සඳහා යොමු වීමට අවශ්‍ය ධාරිතා ශක්තිමත් කිරීම | වැඩසටහන් | 39.49 |
| 3 | දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දෙන නිෂ්පාදන සහ යටිතල පහසුකම් සඳහා ආයෝජනය | ගෘහ ඒකක | 3,075.69 |
| 4 | අගයදාම සංවර්ධනය සඳහා ආයෝජනය | ගෘහ ඒකක | 5,474.42 |
| 5 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | - | 320.00 |

**4.4. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | 2025 වර්ෂය සඳහා අයවැය මගින් වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි.) | සංශෝධිත ප්‍රතිපාදනය | 2025.09.30 වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP) ප්‍රාග්ධන වියදම් | 5,947.00 | 4,443.45 | 709.34 | 16 |

- **වැව් ප්‍රතිසංස්කරණ කටයුතු**

මෙම ව්‍යාපෘතිය මගින් වැව් 260 ක් ප්‍රතිසංස්කරණ කිරීමට සැලසුම් කර ඇති අතර ඒ අතරින් 2025 වර්ෂයේදී වැව් 171 ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට අපේක්ෂිතය. ඒ අනුව මේ වන විට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වැව් 14 ක්, වව්නියාව දිස්ත්‍රික්කයේ වැව් 5 ක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් 2 හා මාතලේ දිස්ත්‍රික්කයේ වැව් 2 වශයෙන් වැව් 23 ක ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත. ඒ අනුව මේ වන විට ඉතිරි වැව් 148 හි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතී. මේ වන විට ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇති හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් වැව් පවතින වැව් 171 සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා ඇති මුදල රු. මි. 624.65 කි. මේ වන විට ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ප්‍රදානය කර ඇති ටෙන්ඩර් වල වටිනාකම රු. මි. 1,928.30 කි.

ඡායාරූප අංක 12

- **අගයදාම සංවර්ධනය සඳහා සැපයුම් මාර්ග ඉදි කිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ 4P ව්‍යාපාර කටයුතු සඳහා මෙන්ම එමගින් ලැබෙන අස්වැන්න අගයදාම සංවර්ධනය සඳහා අවශ්‍ය යටිතල පහසුකමක් ලෙස සැපයුම් මාර්ග ඉදි කිරීම සඳහා 2025 වර්ෂය සඳහා රු. මි. 624.00 ක් වෙන් කර ඇත. ඒ යටතේ කිලෝමීටර් 266 ක දිගකින් යුත් මාර්ග සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. ඒ යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු. මි. 3.10 මුදලක් නිදහස් කර ඇත.

- **ජල පෝෂක ප්‍රදේශ තුළ නැවත වන වගා කිරීම**

මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන වැව් වලට අයත් හෙක්ටයාර් 834 ක් ආවරණය වන පරිදි ජල පෝෂක ප්‍රදේශ වල නැවත වන වගා ස්ථාපනය කිරීම යටතේ මී, කුඹුක්, කළුවර සහ කරඳ යන ශාක වර්ග රෝපණය කිරීම සඳහා රු. මි. 13.53 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී එම දෙපාර්තමේන්තුව මගින් මෙම ශාක වර්ග රෝපණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. මෙම නැවන වන වගා කිරීම සඳහා රු. මි. 376.19 ක මුදලක් වැය කිරීමට අපේක්ෂිතය.

ඡායාරූප අංක 13

- **පශු සම්පත් ව්‍යාපෘතිය (4පී)**

මෙම ව්‍යාපෘතිය 4පී ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත් පුද්ගලික සමාගමක් සමඟින් ගිවිසුම් ගතව කුරුණෑගල , පුත්තලම, අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රු. මි. 592.63 කි. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,000 කි. මේ වන විට මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරමින් පවතී.

- **ගර්කින් ව්‍යාපෘතිය (4පී)**

අනුරාධපුර හා වවුනියාව යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන ව්‍යපෘතියකි. මෙම මෙම ව්‍යාපෘතිය 4පී ව්‍යාපෘතියක් ලෙස සමාගමක් සමඟ ගිවිසුම්ගතව ක්‍රියාත්මක වේ. ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 1,000 කි. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 256.72 කි.

- **දේශගුණ සුහුරු පශු සම්පත් බල ගැන්වීමේ ව්‍යාපෘතිය (4පී)**

තෝරාගත් කිරි නිෂ්පාදන සමාගමක් සමාගම ගිවිසුම් ගතව ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රු. මි. 106.00 කි. මෙම ව්‍යාපෘතිය යටතේ ගොවීන් 255 කට සෘජු ප්‍රතිලාභ හිමි වේ.

- **බඩ ඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතිය (4පී)**

මෙම ව්‍යාපෘතිය අහිතකර දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව සමඟින් ක්‍රියාවට නැංවේ. ව්‍යාපෘති පිරිවැය රු. මි. 101.00 කි. අනුරාධපුර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය සමාගමක් සමඟින් ගිවිසුම් ගතව ක්‍රියාත්මක වේ.

- **ආයුර්වේද ශාක වගා කිරීමේ ව්‍යපෘතිය (4පී)**

ආයුර්වේද නිෂ්පාදන පුද්ගලික සමාගමක් සමඟින් ගිවිසුම් ගතව 4 පී ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වේ. මේ යටතේ ගොවීන් 200 ක් ප්‍රතිලාභීන් වශයෙන් තෝරා ගැනීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය රු. මි. 94.02 කි.

- **මිරිදිය මත්ස්‍ය වගාව**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා මිරිදිය මත්ස්‍ය වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය මිරිදිය මත්ස්‍ය වගාව වැව් 72 ආවරණය වන පරිදි සිදු කරමින් පවතින අතර වැව් 29 ක් සඳහා මිරිදිය මත්ස්‍යයින් හඳුන්වා දීම සිදු කර අවසන්ය. එහි මත්ස්‍ය අස්වැන්න නෙලීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. මෙම මත්ස්‍ය වගාව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් සිදු කරන අතර ඒ සඳහා මේ වන විට රු. මි. 5.00 ක මුදලක් වැය කොට ඇත.

ඡායාරූප අංක 14

- **නිදැළි කුකුළු පාලනය**

මෙම ව්‍යාපෘතිය වව්නියාව, පුත්තලම, කුරුණෑගල. අනුරාධපුරය, මන්නාරම සහ මාතලේ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාවට නැංවේ. මේ යටතේ තෝරා ගත් ගොවි පවුල් 1,100 ක් වෙත කුකුළු පැටවුන් සහ කුකුළු කූඩු ඇතුළු අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය අඩු ආදායම්ලාභීන් කාන්තාවන් ඉලක්ක ගත කර ඇති අතර පවුල් වන පෝෂණ අවශ්‍යතා සහ පවුලේ ආදායම ඉහල නැංවීම අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල රු. මි. 52.50 කි. මේ වන විට මෙහි පළමු අදියර යටතේ ප්‍රතිලාභීන් වෙත කුකුළු පැටවුන් හා කුකුළු කූඩු ලබා

දීමේ කටයුතු අවසන් කර ඇත. එසේම දෙවන අදියර යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු අවසන් කර කුකුළු පැටවුන් හා කුකුළු කූඩු ප්‍රතිලාභීන් වෙත බෙදා දීමේ කටයුතු සිදු කරමින් පවතී.

ඡායාරූප අංක 15

- **බඩ ඉරිඟු වගා ව්‍යාපෘතිය**

දේශගුණ විපර්යාස වලින් ඇති කරන අහිතකර බලපෑම් වලට ඔරොත්තු දීමේ ව්‍යාපෘතියක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවේ. මේ යටතේ ප්‍රතිලාභීන් 800 ක් වෙත ප්‍රතිලාභ ලබා දීමට සැලසුම් කර ඇත.
ඡායාරූප අංක 16

- **දෙමුහුම් මිරිස් වගා කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය අහිතකර දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දෙන ව්‍යාපෘතියක් වශයෙන් අනුරාධපුර, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික් ආවරණය වන පරිදි ගොවීන් 250 ක් ප්‍රතිලාභීන් වශයෙන් තෝරා ගැනීමට සැලසුම් කර ඇත. වගා කිරීමට අපේක්ෂිත භූමි ප්‍රමාණය අක්කර 75 කි. මෙම ව්‍යාපෘතිය සඳහා යෝජිත පිරිවැය රු. මි. 44.62 කි.

- **අර්ධ ආරක්ෂිත කොමඩු වගා කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියද අහිතකර දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තු දෙන ව්‍යාපෘතියක් වශයෙන් අනුරාධපුර, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික් තුළ ගොවීන් 200 වෙත ප්‍රතිලාභ ලබා දෙමින් ක්‍රියාත්මක වේ. මේ සඳහා රු. මි. 30.78 වැය කෙරේ.

- 2024 වර්ෂයේදී, **උඳු වගා ව්‍යාපෘතිය** -ව්‍යාපෘතියේ පිරිවැය රු. මි. 7.50 කි. ගොවීන් 600 සඳහා අවශ්‍ය බීජ හා ගොවි ක්ෂේත්‍ර පාසැල් හරහා අවශ්‍ය පුහුණුව ලබා දී ඇත , **මුං ඇට ව්‍යාපෘතිය -** ගොවීන් 750 හා අක්කර 391.5 ක් ආවරණය පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. 2024 යල කන්නයේ මුං අස්වැන්න කිලෝ 46,000 කි, රට **කජු ව්‍යාපෘතිය** - ගොවීන් 1500 ක් සඳහා ප්‍රතිලාභ ලබා දෙමින් ක්‍රියාත්මක කරන ලදී. පිරිවැය රු. මි. 25.00 කි. **වී වගාව සඳහා නියැදි ක්ෂේත්‍ර ස්ථාපනය -** මේ යටතේ නියදි ක්ෂේත්‍ර 17 ස්ථාපනය කරන ලදී. වැය කර ඇති මුදල රු. මි. 0.60 කි.

## 05. ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය

### 5.1. හැඳින්වීම

ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)–සඳහා ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව එක්ව අරමුදල් සපයයි. සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 103ක් වන අතර, ගොවිපලේ සිට පාරිභෝගිකයා දක්වා වන අගයදාමය තුළ–කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා වැවිලි යන ක්ෂේත්‍රයන්හි නියුතු කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යවසායකයින්ට සහය වීමට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශයන්හි පදිංචි කෘෂි ආහාර නිෂ්පාදකයින්ගේ ඵලදායිතාව, තරඟකාරීත්වය සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම මෙම පස් අවුරුදු ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

**5.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 1400 .00 |
| 2 | පුනරාවර්තන වියදම් | 100.00 |

**5.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | වැව් හා වාරිමාර්ග පද්ධති සංවර්ධනය | වැව්/ පොකුණු / ජල සම්පාදන යෝජනා ක්‍රම | 46 | 19.57 | 900.00 |
| 2 | කෘෂි බෝග වගා සංවර්ධනය | වගා වපසරිය (හෙක්ටයාර්) | 100 | 2.00 | 200.00 |
| 3 | අගයදාම සංවර්ධනය | ඒකක | 15 | 13.33 | 200.00 |
| 4 | ආහාර සුරක්ෂිතාව හා වෙළෙඳාම සඳහා ජාතික තත්ත්ව සංවර්ධනය | ඇගයීම | 01 | 50.00 | 50.00 |
| 5 | කෘෂි තොරතුරු සඳහා දත්ත පද්ධතියක් පිහිටුවීම | පද්ධති | 01 | 50.00 | 50.00 |

**5.4. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | 118-02-03-093-2509-(12) (ක්‍රියාකාරි මූල්‍යකරන) | 30.00 | 1.69 | 06 |
| 2 | 118-02-03-093-2509-(17) (Additional Budget Line) | 10.00 | 3.83 | 38 |

**5.5. 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

- මෙම ව්‍යාපෘතිය 2025.06.05 දින මූලික කටයුතු ආරම්භ කරන ලද අතර ව්‍යපෘති අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලයේ සීමිත පිරිසක් පමණක් මේ වන විට බඳවා ගෙන ඇති අතර අවශ්‍ය අනෙකුත් කාර්ය මණඩල බඳවා ගැනීමට අනුමැතිය අපේක්ෂාවෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමුකර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු කඩිනමින් අවශ්‍ය පිරිස් තෝරා ගැනීමට සැලසුම් කර ඇත.
- 30.09.2025 වන විට රජයේ අරමුදලින් රු. මි. 1.69 ක් ක්‍රියාකාරි මූල්‍යකරන (Retroactive Financing) ලෙස වියදම් දරා ඇත.
- ලෝක බැංකුව සමඟ 2025 09.08 දින ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම අත්සන් කර ඇති අතර 2025 වර්ෂය සඳහා 118-02-03-093-2509-(12) වැය ශීර්ෂය යටතේ රු. මි. 30.00 ක ප්‍රතිපාදන ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇත. විදේශ අරමුදල් ලැබෙන තෙක් එම වැය ශීර්ෂය භාවිතා කල නොහැකි බැවින් 2025 වර්ෂය සඳහා 118-02-03-093-2509-(17) යටතේ රු. මි. 10.00 ක අමතර වැය ශීර්ෂයක් අනුමත කර ගන්නා ලදි. එම වැය ශීර්ෂය යටතේ ව්‍යාපෘතිය වෙත රු. මිලි 4.2 ක මුදලක් ලද අතර ඉන් රු. මිලි 3.832 වියදම් දරා ඇත.

- විදේශ අරමුදල් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
- තෝරා ගත් වැව් 9ක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයන් සිදු කර ඇති අතර, ඉන් 03ක් සඳහා පාරිසරික හා සමාජ ආරක්ෂණ වාර්තා සැකසීම අවසන් කර ඇති අතර, ඒවායේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. ඉතිරි වාර්තා සැකසීම සිදුකරමින් පවතී.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු (උතුරු, වයඹ, නැගෙනහිර) හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ව්‍යාපෘති යෝජනා ලැබෙමින් පවතින අතර ඒවා අධ්‍යනය කිරීමෙන් පසු සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

## 06. කොළඹ - කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත් වැඩියාව හා ප්‍රතිසංස්කරණය (JICA)

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ශාක ආරක්ෂණ සම්මුතියට අතුලත්ව ඇත. ඒ අනුව ශාක, ශාකමය කොටස් හෝ කෘෂි නිෂ්පාදන නියමිත ප්‍රමිතීන්ට අනුගතව ආනයනය හා අපනයනය කිරීමට කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ ශාක නිරෝධායන විෂය පථයට ඇතුළත් වේ. එසේම, ගොවීන්ගේ දරිද්‍රතාවය අවම කිරීම, විදේශ මුදල් ඉපයීම ඉහළ දැමීම වැනි පරමාර්ථ පදනම් කර වඩාත් නිවැරදිව හා ඉහළ කාර්යක්ෂමතාවයක් පවත්වා ගනිමින් ශාක නිරෝධායන කාර්ය ඉටුකිරීමත්, ආනයන හෝ අපනයන ජාත්‍යන්තර වෙළඳපල සමග සම්බන්ධීකරනයේදී භාණ්ඩවල ප්‍රමිතීන් වඩාත් නිවැරදිව හඳුනාගැනීමට ඇති අවස්ථාවන් වැඩි දියුණු කිරීමට ශාක නිරෝධායන සේවයේ පවතින උපකරණ අලුත්වැඩියාව සහ ප්‍රතිස්ථාපනය සඳහා රු.මි. 259.6 ක ආධාර මුදලක් ජපන් රජය (JICA) මගින් 2017 වර්ෂයේදී ලබාදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. 2024 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතව තිබුණ නමුත් එසේ කිරීමට නොහැකි වූ නිසා 2025 වර්ෂය තුළදී ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය සඳහා මේ වන විට වියදම් කර ඇති මුදල රු.මි. 254.69 ක් වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටුනායක ජාතික ශාක නිරෝධායන මධ්‍යස්ථානය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

නැවුම් පළතුරු හා එළවළු අපනයනයේදී ඇතැම් විදේශ රටවල් ශාක සනීපාරක්ෂක නියාමනය ලෙස අත්‍යාවශ්‍ය සනීපාරක්ෂණ ක්‍රියාවලියක් ලෙස VHT (Vapour Heat Treatment) නිරෝධායන පිලිවෙත් සපුරාගත යුතු වීම මත පළතුරු හා එළවළු අපනයනයේදී එකී පිළිවෙත් සපුරාලීම සඳහා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට ජපානයෙන් අධාර ලෙස VHT machine එකක් ලබාදී ඇති අතර, ජාතික ශාක නිරෝධායන සේවය (NPQS) එහි පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කරමින් ඇත.

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1. | කොළඹ-කටුනායක ජාතික ශාක නිරෝධායන සේවයේ උපකරණ අලුත්වැඩියාව හා ප්‍රතිස්ථාපනය කිරීම (JICA) | 6.24 | 1.33 | 21 |

# කෘෂිකර්ම අංශය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

# 01. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA)

## 1.1. ඉදිරි දැක්ම

"ජාතික සමෘද්ධිය සඳහා කෘෂිකර්මාන්තයේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම".

## 1.2. මෙහෙවර

"සමානාත්මතාවයෙන් හා තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්කර ගැනීම, වැඩිදියුණු කළ කෘෂිකාර්මික තාක්ෂණය සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම තුළින් ජාතීන්ට ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම සහ ගොවීන්ට වැඩි අවධානයක් යොමු කරමින් සියලු පාර්ශවකරුවන්ට අදාළ සේවාවන් සැපයීම".

## 1.3. අරමුණු

ගොවියාගේ ආදායම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට ආහාර ලබා දීම සඳහා ආහාර බෝග අංශයේ ඵලදායිතාව සහ නිෂ්පාදනය පවත්වාගෙන යාම සහ වැඩි කිරීම.

## 1.4. කාර්යයන්

- කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන
- කෘෂි තාක්ෂණ ව්‍යාප්ති හා පුහුණු
- බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම
- බීජ සහතික කිරීම හා ශාක ආරක්ෂණය
- නියාමන සේවා

## 1.5. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) | 2025.08.07 දින ගරු ජනාධිපතිතුමා සමග පැවති සාකච්ඡාවේදී වාචිකව එකඟවූ අමතර ප්‍රතිපාදන (රු.මි.) |
|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම | 4,499.00 | 1,797.00 |
| 2 | පුනරාවර්තන වියදම | 7,874.16 | 390.00 |

## 1.6. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| | **I. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන** | | | | |
| 1 | ජාතික කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති (NARP) | පර්යේෂණ සංඛ්‍යාව | 100 | | 100.00 |
| 2 | සුළු පරිමාණ පර්යේෂණ ව්‍යාපෘති - JICA | පර්යේෂණ සංඛ්‍යාව | 14 | | 150.00 |
| 3 | ගස් හෙලීමේ පාලන පනත සහ පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම | ආදර්ශන සංඛ්‍යාව | 33 | | 5.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 4 | නව දෙමුහුම් හා විවෘත පරාගිත මිරිස්, බඩඉරිඟු හා ඇණු ප්‍රභේද බිහි කිරීම හා බීජ නිෂ්පාදනය | පර්යේෂණ සංඛ්‍යාව | නව විවෘත පරාගිත සහ දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීමේ පර්යේෂණ 70ක් | | 175.00 |
| 5 | ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කරමින් ආහාර බෝග නිෂ්පාදනය සඳහා දේශගුණයට ඔරොත්තු දෙන හරිත තාක්ෂණික වැඩිදියුණු කිරීම | පර්යේෂණ සංඛ්‍යාව | දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන ප්‍රභේද නිෂ්පාදනයට අදාළ පර්යේෂණ 42ක් | | 50.00 |
| | **II. ව්‍යාප්ති හා පුහුණු** | | | | |
| 6 | මාධ්‍ය වැඩසටහන | රූපවාහිනි හා ගුවන් විදුලි වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් 1555ක් නිෂ්පාදනය (ගුවන් විදුලි - 1403 රූපවාහිනී - 152 කෘෂි රූපවාහිනී තාක්ෂණික කෙටි පණිවිඩ, වාණිජ කෙටි පණිවිඩ සහ 1920 ගොවි ගැටළු පාදක කෙටි පණිවිඩ) | | 72.00 |
| 7 | කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සම්මේලනය (ASDA) | සම්මේලන සංඛ්‍යාව | කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සම්මේලනයක් (ASDA) පැවැත්වීම | | 9.00 |
| 8 | කෘෂි තාක්ෂණික උද්‍යාන නඩත්තුව | කෘෂි තාක්ෂණ උද්‍යාන සංඛ්‍යාව | ගන්නෝරුව, බටඅත හා දියගම කෘෂි තාක්ෂණ උද්‍යාන 3 ආදර්ශන ලෙස පවත්වාගෙන යාම | | 18.00 |
| 9 | කෘෂිකර්ම විද්‍යාල වැඩිදියුණු කිරීම | කෘෂි විද්‍යාල සංඛ්‍යාව | කෘෂිකර්ම විද්‍යාල 11 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | | 240.00 |
| 10 | පාංශු සාරවත්බව පරීක්ෂා කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම | පාංශු සෞඛ්‍ය කාඩ් පත් සංඛ්‍යාව | 20,000 | | 40.00 |
| 11 | යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) හා ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් වස විස නැති ආහාර නිෂ්පාදනයට සහාය වීම | GAP සහතිකලත් ගොවිපල සංඛ්‍යාව | GAP සහතිකලත් ගොවිපල - 5000 | | 20.00 |
| 12 | කෘමිනාශක සහ පොහොර ආරක්ෂිතව සහ සුදුසු ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම | රු. | වාහනයේ තීරු බද්ද ගෙවීම | | 12.00 |
| 13 | වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම | ප්‍රතිශතය | අතිරේක ආහාර බෝගවල නිෂ්පාදනය ඉහළ නැංවීම | | 800.00 |
| | **III. බීජ සහතික කිරීම හා ශාක ආරක්ෂණය** | | | | |
| 14 | බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීමේ ජාතික වැඩසටහන | ලියාපදිංචි සහ සහතික කළ බීජ ප්‍රමාණය | වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙට්‍රික් ටොන් 700ක්ද, බීජ වී බුසල් 75,000ක්ද, සහ එළවළු බීජ මෙට්‍රික් ටොන් 70 | | 1,250.00 |
| 15 | බීජ පනත ක්‍රියාත්මක කිරීම තුළින් බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහතික කිරීම | සංඛ්‍යාව | බීජ පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 15ක්, නව ලියාපදිංචි කිරීම් 1400ක් හා බීජ පනත යටතේ ලියාපදිංචි දීර්ඝ කිරීම් 1600ක් සිදු කිරීම | | 40.00 |
| 16 | කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන | බීජ ගොවිපළ සංඛ්‍යාව | බීජ ගොවිපල් 29ක යටිතල පහසුකම් සංවර්ධනය | | 500.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 17 | බීජ සහතික කිරීමේ කටයුතු සවිබල ගැන්වීම | සංඛ්‍යාව | මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාර පහසුකම් සංවර්ධනය කිරීම, ගන්නොරුව බීජ සහතික කිරීමේ සේවයේ කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | | 50.00 |
| 18 | කෘෂි රසායන වලින් ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම | සංඛ්‍යාව | ASTA පුහුණු පන්ති, රාජසන්තක කළ පලිබෝධනාශක විනාශ කිරීම හා බැර ලෝහ සඳහා සාම්පල විශ්ලේෂණය | | 50.00 |
| 19 | දේශීය බීජ අර්තාපල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම | සංඛ්‍යාව | බීජ අර්තාපල් ගොවිපල 3ක යටිතල පහසුකම් සංවර්ධනය | | 30.00 |
| 20 | පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ වත්මන් ශාක ජාන සම්පත් බැංකුව අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම | සංඛ්‍යාව | ජාන සම්පත් බැංකුව අළුත්වැඩියා කිරීම | | 8.00 |
| 21 | ජෛව ආරක්ෂණ සහ ශාක ස්වස්ථතා අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රී ලංකාවේ ශාක හා ශාක නිෂ්පාදන පිවිසුම්පල හරහා වෙළෙඳාම ශක්තිමත් කිරීම | සංඛ්‍යාව | ගුවන් තොටුපල ශාක නිරෝධායන ස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීම | | 25.00 |

## 1.7. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | සංවර්ධන වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 1,175.53 | 466.99 | 40 |
| 2 | පුනරාවර්තන වියදම් | 7,128.00 | 5,166.34 | 72 |
| 3.1 | **කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘති** | | | |
| 3.1.1 | කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන | 161.50 | 48.77 | 30 |
| 3.1.2 | ව්‍යාප්ති හා පුහුණු | 952.00 | 141.67 | 15 |
| 3.1.3 | බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ | 2,113.00 | 561.03 | 27 |
| 3.2 | ජාතික කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති (NARP) | 115.00 | 28.97 | 25 |
| 3.3 | විදේශ ව්‍යාපෘති | 152.50 | 40.50 | 27 |
| | **ප්‍රාග්ධන උප එකතුව** | **3,494.00** | **820.94** | **23** |
| 4 | කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ඇති විශේෂ ව්‍යාපෘති | 247.56 | 12.84 | 5 |
| | මුළු එකතුව | **3,741.56** | **833.78** | **22** |

**1.8. කෘෂිකර්ම දෙපාර්තමේන්තු (285) වැය ශීර්ෂය යටතේ ඇති විශේෂ ව්‍යාපෘතිවල 2025.09.30 දිනට භෞතික ප්‍රගතිය - සමස්ත වැඩසටහන් වල සංක්ෂිප්තය**

**1.8.1. පර්යේෂණ හා සංවර්ධන**

**i.) මිරිස්, බඩඉරිඟු, ළූණු, එළවළු, පලතුරු වල නව දෙමුහුම් සහ විවෘත පරාගිත ප්‍රභේද සංවර්ධනය කිරීම සහ බීජ නිෂ්පාදනය**

<u>ක්ෂේත්‍ර බෝග</u>

- පළිබෝධ සහ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, මිරිස්, බඩ ඉරිඟු සහ ළූණු යන බෝග වලට අදාළව බලාපොරොත්තු තැබිය හැකි ආර හඳුනාගන්නා ලදී.
- හඳුනාගන්නා ලද උසස් ලක්ෂණ සහිත බලාපොරොත්තු තැබිය හැකි ආර ජාතික සම්බන්ධීකාරක ප්‍රභේද අත්හදා බැලීම (NCVT) සහ ප්‍රභේද අනුවර්තිතා අත්හදා බැලීම් (VAT) යටතේ තවදුරටත් පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර ස්ථාපනය කරන ලදී.
- වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා බීජ වප්කරය සහ ළූණු අස්වනු නෙළන යන්ත්‍රය හඳුන්වා දීම සඳහා මූලික සැලසුම් කිරීම හා පිරිසැකසුම් කටයුතු සම්පූර්ණ කරන ලදී.

<u>වී</u>

- 2025 දී නිකුත් කිරීමට නියමිත ප්‍රභේද 3ක් (Bw 15-971 සහ Bw 14-509, Bw BLB 72-1) සහ 2025/26 මහ කන්නය ප්‍රභේද අනුවර්තිතා අත්හදා බැලීම් (VAT) සඳහා ප්‍රවර්ධනය කරන ලද වර්ග 3ක් (Bg 15-1027, At 18-1322, Bw 17-764) හඳුනා ගෙන ඇත.
- මහා පරිමාණ ප්‍රභේද අනුවර්තිතා අත්හදා බැලීම් (LSVAT) හි වර්ග 4ක් (Bw 16-1567, Bg 16-2062, Bw 18-604,At 13-1532) සහ ප්‍රභේද අනුවර්තිතා අත්හදා බැලීම් (VAT) හි වර්ග 2ක් (Bw 18-1541,At 21-1088) මෙන්ම නව වර්ග 8ක් ජාතික සම්බන්ධීකාරක ප්‍රභේද අත්හදා බැලීම (NCVT) යටතේ ස්ථාන 13 ක පරීක්ෂා කරන ලදී.
- ප්‍රභේද 25ක ගුණාත්මක බව සහතික කළ අභිජනන බීජ නිෂ්පාදනය කර ඇත.
- ලබුදූව පර්යේෂණ ආයතනය මගින් පැළ විසිකිරීමේ ක්‍රමය සඳහා නව විකල්ප ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර සහල් ආශ්‍රිත නව නිෂ්පාදන 2ක් අධ්‍යනය කරමින් පවතී.
- පර්යේෂණ හා බීජ නිෂ්පාදනය සඳහා බෙන්තොට, බෝඹුවල පර්යේෂණ භූමි සංවර්ධන කටයුතු, පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා රසායනාගාර උපකරණ මිලදී ගැනීම, ක්ෂේත්‍ර දින වැඩසටහන් පැවැත්වීම, ප්‍රකාශන මුද්‍රණය මගින් තාක්ෂණය ප්‍රචාරණය සඳහා කටයුතු කරමින් පවතී.

<u>එළවළු</u>

- එළවළු වර්ග 20ක් (බෝංචි, තක්කාලි, වට්ටක්කා, කරවිල, පිපිඤ්ඤා, වැටකොලු, මාළු මිරිස්, තක්කාලි, වම්බටු, එළබටු, කැරට්, කැකිරි, දඹල, මෑ, පතෝල, අල බෝග, පලා වර්ග) සඳහා දෙමුහුම් හා විවෘත පරාගිත නව ප්‍රභේද අභිජනන පර්යේෂණ හා ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතින අතර නිර්දේශිත එළවළු ප්‍රභේද සහ දෙමුහුම් ප්‍රභේද සඳහා ප්‍රමිතියෙන් යුතු අභිජනන බීජ නිෂ්පාදනය සිදු කරමින් පවතී.

- එළවළු වගාව සඳහා අදාල පාංශු පර්යේෂණ, රසායනික පර්යේෂණ, රෝග හා පලිබෝධ පිලිබඳ පර්යේෂණ හා පාලන ක්‍රමවේද පිලිබඳ පර්යේෂණ සිදු කිරීම හා නිර්දේශයන් ලබා දීම සිදු වෙමින් පවතී.

<u>පලතුරු</u>

- පර්යේෂණ මධ්‍යස්ථාන 9 ක ස්ථානීය සහ බහු-ස්ථානීය අත්හදා බැලීම් වලදී බලාපොරොත්තු තැබිය හැකි පලතුරු බෝග අභිජනන ආර (පළතුරු බෝග විශේෂ 14 - අභිජනන ආර 2000 ක් පමණ) ඇගයීම, තෝරා ගැනීම සහ ප්‍රවේණිය උසස් කිරීම සිදු කරන ලදී.
- හොරණ පැපොල් දෙමුහුම් සහ හොරණ ගෝල්ඩ් පැෂන් ෆෘට් වල මාපිය පරම්පරාවේ අභිජනන බීජ නිෂ්පාදනය සිදු කරන ලදී.
- නිකුත් කරන ලද පලතුරු ප්‍රභේදවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය - ශාක 5000 ක් සඳහා මුල් කඳ සිටුවීම, අංකුර කිරීම සහ බද්ධ කිරීම සහ ලේයර් කිරීම අඛණ්ඩව සිදු කෙරේ.
- පලතුරු බෝග විශේෂ 10ක ක්ෂේත්‍ර ජාන බැංකු 5 ක් සහ මව් ශාක පළතුරු උද්‍යාන නඩත්තු කිරීම සිදු කෙරේ.

**ii.) ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කරමින් ආහාර බෝග නිෂ්පාදනය සඳහා දේශගුණයට ඔරොත්තු දෙන හරිත තාක්ෂණික වැඩිදියුණු කිරීම**

<u>වී</u>

- ලවණතාව සහ ජලයෙන් යටවීම සඳහා Ld අභිජනන පෙළ 98ක් පරීක්ෂා කරන ලද අතර සීතල සහ තාපය සඳහා ඔරොත්තු දෙන පෙළ අස්වනු නෙලන ලදී.
- නියඟය සඳහා ඔරොත්තු දෙන පෙළ ක්‍රියාත්මක වන අතර ක්ෂේත්‍ර තත්ත්වය තුළ අජීවී ආතතීන් සඳහා තෝරාගත් වී පෙළ අනුවර්තනය වීමේ හැකියාව අත්හදා බැලීම යටතේ අස්වනු නෙලනු ලැබ දත්ත විශ්ලේෂණය කරමින් පවතී.
- ප්‍රධාන රෝග සඳහා පෙළ පරීක්ෂා කිරීම යටතේ අත්හදා බැලීම් අවසන් කර දත්ත විශ්ලේෂණය සිදුවෙමින් පවතින අතර ප්‍රධාන පළිබෝධකයන් සඳහා පෙළ පරීක්ෂාව යටතේ දත්ත රැස් කිරීම අවසන් කර ඇත.

<u>ක්ෂේත්‍ර බෝග</u>

- රනිල බෝග වගාවේ ප්‍රධාන පලිබෝධකයින් හඳුනා ගැනීම සහ පලිබෝධ ගහනය සහ කාලගුණ පරාමිතීන් අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර එම දත්ත විශ්ලේෂණ කරමින් පවතී.
- ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ රතු දුඹුරු පසෙහි කැන්ටලූප් වගාව (*Cucumis melo* L.) සඳහා සුදුසු ජලසම්පාදන ක්‍රම අධ්‍යනය කිරීම සඳහා පර්යේෂණාත්මක කටයුතු සිදුකරගෙන යන අතර එම දත්ත විශ්ලේෂණ කරමින් පවතී.
- වියළි තත්ත්ව යටතේ ඇතිවන ආතතිය (Drought Stress) සඳහා සෝයා බෝංචි සහ කව්පී දක්වන ප්‍රතිචාරය ඇගයීම සිදු කරන අතර සෝයා බෝංචි දර්ශක 15ක් අතරින් දර්ශක 05ක් තෝරා ගෙන තිබේ.
- විශාල බීජ සහිත රටකජු වර්ගවල කරල් පිරීම සඳහා විවිධ පස් කාණ්ඩ යටතේ භාවිතා කළ හැකි පෝෂක කළමනාකරණ පැකේජයක් සංවර්ධනය සිදු කරන අතර චූර්ණමය නොවන දුඹුරු පසේ දී

ජිප්සම් හෙක්ටයාරයකට කි. ග්‍රෑ. 200 බැගින් යොදාගත් අවස්ථාවේ දී රටකජු අස්වැන්නේ සැලකිය යුතු වැඩිවීමක් ඇති වන බව නිරීක්ෂණය කර තිබේ.

- සංරක්ෂණ සහ සම්ප්‍රදායික කෘෂි පද්ධති යටතේ තෝරාගත් ක්ෂේත්‍ර බෝගවල වර්ධනය හා අස්වැන්න සංසන්දනය කිරීම සිදු කරන අතර සංරක්ෂණ ගොවිතැනේ දී පිදුරු භාවිතා කිරීම මගින් ශාකයේ වර්ධනය වැඩිවන අතර තිරසාර ස්ථාවර අස්වැන්නක් ලබා ගත හැකිය.
- මඩකලපුව දිස්ත්‍රික්කයේ මිරිස් වගාව සිදු කරන රෙගසොල් පසෙහි ජලය රඳවා ගැනීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කිරීමට ඇති හැකියාව පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කරයි.

<u>එළවළු</u>

- ශෂ්‍ය විද්‍යා, පෝෂක කළමනාකරණය සහ රෝග ප්‍රතිරෝධී අධ්‍යයන ඇතුළු බෝග අත්හදා බැලීම් සිදුවෙමින් පවතින අතර වැටකොළු සහ කරවිල බීජ නිෂ්පාදන පැකේජ සහ ජෛව පාදක අර්තාපල් ආලේපන වැනි අත්හදා බැලීම් කිහිපයක් සාර්ථකව අවසන් කර ඇත.
- රසායනාගාර ප්‍රතිසංස්කරණය, පර්යේෂණ උපකරණ ප්‍රසම්පාදනය සහ වාරිමාර්ග වැඩිදියුණු කිරීම් මෙන්ම පර්යේෂණ සහ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

<u>පලතුරු</u>

- විවිධ කෘෂි-පාරිසරික කලාප හරහා අජෛව ආතතිනට ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා, මහඉලුප්පල්ලම, රහංගල සහ මදුරුකැටිය ක්ෂේත්‍ර නඩත්තුව සිදුවෙමින් පවතී. තෝරාගත් ප්‍රවේශයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කෙරේ.
- තෝරාගත් ප්‍රවේශ 3 කින් බද්ධ කරන ලද ශාක 150 ක් නිෂ්පාදනය කර ක්ෂේත්‍ර ස්ථාපනය සඳහා ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල සහ මාෂ හා තෙල් බෝග පර්යේෂණ මධ්‍යස්ථානය, අඟුණකොලපැලැස්ස යන ස්ථාන දෙකක ඉඩම් සකස් කිරීම සිදු කරන ලදී.
- විවිධ කෘෂි-පාරිසරික කලාපවල අඹ සහ අලිගැට පේර ප්‍රවේශයන් ඇගයීම සිදු කෙරෙන අතර ක්ෂේත්‍රයේ පැළවල ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා අන්නාසි පැළ ක්ෂේත්‍රයේ ස්ථාපිත කර නඩත්තු කරන ලදී.
- උගුල් එකතු කිරීම් වලින් තවත් පලතුරු මැස්සන් විශේෂයක් (බැක්ට්‍රොසෙරා විශේෂය) සොයා ගන්නා ලද අතර විශේෂ හඳුනාගැනීම සිදු කළ යුතුය.

<u>පාංශු</u>

- මධ්‍ය කඳුකරයේ එළවලු වගාවේදී සිදුවන පාංශු ඛාදනය අවම කරලීමත්, පාංශු පෝෂණය වැඩි දියුණු කරලීමත් සඳහා මිශ්‍ර බෝග වගාවක් ලෙස රනිල ධාන්‍ය යොදාගැනීමේ හැකියාව අත්හදා බැලීම සඳහා පර්යේෂණ සිදුකරමින් සිටියි.
- පාංශු සංරක්ෂණ ව්‍යූහ වන ගල් වැටි සහ SALT වැටි දැමීම ආර්ථික වශයෙන් ලාභදායි නොවන බැවින්, එම ව්‍යූහ සඳහා විකල්පයක් ලෙස ආර්ථික වශයෙන් ලාභදායි වන බහු බෝග වැටියක් හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදුකරමින් සිටියි.

**iii.) පාංශු සංරක්ෂණ පනත**

- නුවරඑළිය, මොනරාගල , බදුල්ල, කෑගල්ල , රත්නපුරයේ ක්ෂේත්‍ර ආදර්ශන සංවර්ධනය කිරීම සඳහා හඳුනාගෙන ඇති අතර සංරක්ෂණ කටයුතු සිදුවෙමින් පවතී.
- මාතලේ - බලකඩුව, රොසල්ල, පහළ කඩුගන්නාව, කිරිඇල්ල – මාදම්පේ, ගොඩකවෙල හා කලවාන ප්‍රදේශ වල මාර්ග දෙපස පුවරු වල බැනර් 6 ක් සවි කර ඇත.
- සංරක්ෂණ ප්‍රදේශවල තාක්ෂණික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත.

**iv.) ජාතික කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති (NARP)**

මේ යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති පහත දක්වා ඇත.

- උසස් තත්ත්වයේ සහ දිගුකාලීන බීජ සහිත වම්බටු බීජ නිෂ්පාදනය සඳහා කෘෂි විද්‍යාත්මක කළමනාකරණ පැකේජයක් සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ මඤ්ඤොක්කා ලේස් මකුණන් (*Hemiptera tingidea*) පිළිබඳ ශ්‍රී ලංකාවේ පළමු වාර්තාව හා සම්බන්ධ ආර්ථික වැදගත්කම සහ පළිබෝධ ගහනය අවම කිරීම තක්සේරු කිරීම
- තිබ්බටු (*Solanum turvum*) වල ඵලදායිතාව සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක කළමනාකරණ පිළිවෙත් ප්‍රශස්තකරණය කිරීම
- සාම්ප්‍රදායික හා අණුක අභිජනනය හරහා වගා කරන ලද බෝංචි වලට ඇන්ත්‍රැක්නෝස් ප්‍රතිරෝධය හඳුන්වා දීම
- ආහාර බෝග වල ප්‍රධාන කෘමි පලිබෝධකයන් පාලනය කිරීම සඳහා අඩු ශක්ති ඉමල්සිකරණ ක්‍රමය භාවිතා කරමින් ශාකසාර නැනෝ ඉමල්ෂන් කෘමිනාශක සංයෝග සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ මාළුමිරිස් වගාවේ ඇන්ත්‍රැක්නෝස් රෝග පාලනය සඳහා ශාඛය තුළ ජීවත් වන හිතකර දිලීර මගින් ජෛව දිලීරනාශකයක් නිෂ්පාදනය
- ඉහළ මට්ටමේ අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් වම්බටු, මිරිස්, බණ්ඩක්කා සහ කොළ එළවළු සඳහා ඒකාබද්ධ බෝග නිෂ්පාදන පැකේජ සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම
- අර්තාපල් සහ උඩරට එළවළු වල මෘදු කුණුවීමේ රෝගයට (*Pectobacterium carotavorum*) එරෙහිව රෝග කළමනාකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම
- *Ralastonia solanacerium* (රැල්ස්ටෝනියා සොලනේසියරම්) නිසා ඇති වන කරවිල බැක්ටීරියා මැලවීමේ රෝගය සඳහා ඒකාබද්ධ රෝග කළමනාකරණ ප්‍රොටෝකෝලයක් සංවර්ධනය කිරීම.
- වම්බටු බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී දර්ශවල ජාන ප්ලාස්ම ඇගයීම හා නුමුහුම් පෙළ සංවර්ධනය
- ඌන උපයෝගිතා පලතුරු වලින් රසකැවිලි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම: ජෙලි කැන්ඩි සහ සම් ටොෆි නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනයක්.
- දේශීය තත්ත්වයන්ට ගැළපෙන පරිදි වැඩි පෝෂණ අගයක් සහ බතල ගුල්ලාට ප්‍රතිරෝධයක් සහිත ඉහළ අස්වැන්නක් ලබා දෙන බතල දර්ශ සංවර්ධනය කිරීම.
- ප්‍රෝබියොටික් ගුණාංග පැසුණු සහල් අතුරුපස පොහොසත් කරයි - කාලය, උෂ්ණත්වය සහ ක්ෂුද්‍රජීවී මාධ්‍ය බලපෑම.
- ආහාර කර්මාන්තයේ භාවිතා කිරීම සඳහා දෙහි (*Citrus aurantifolia*) වලින් ලබාගත් අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කිරීමේ තාක්ෂණය සහ තත්ත්ව ඇගයීම.
- ශ්‍රී ලංකාවේ නව කොළ එළවළු ප්‍රභේද හඳුන්වාදීම සහ ප්‍රධාන කොළ එළවළු වගා කරන ප්‍රදේශ සිතියම්ගත කිරීම.

- එළවළු භෝග වල බහුලව දක්නට ලැබෙන කෘමි පලිබෝධකයන් පාලනය සඳහා දිලීර කීය ව්‍යාධිජනක ක්ෂුද්‍ර කෘමිනාශක (බියුවේරියා විශේෂ, මෙටාර්හිසියම් විශේෂ, ඉසාරියා විශේෂ) සංවර්ධනය කිරීම
- ජීව අඟුරු මිශ්‍ර කළ කොම්පෝට් නිෂ්පාදනයේදී පාංශු පෝෂ්‍ය වැඩි දියුණු වන ආකාරයට හා වගාවේදී එහි බලපෑම අධ්‍යයනය
- කටු අනෝදා මල් උත්තේජනයෙන් එලදාව වැඩිකර ගැනීමට හා එල වර්ධනය සුප්ත අවධිය අඩු කර ගැනීමට එකවර වැඩි ගෙඩි ප්‍රමාණයක් නෙලා ගැනීම හා ගුණාත්මයෙන් යුතු ඇට රහිත ගෙඩි නිපදවා ගැනීමට
- F1 දෙමුහුන් ප්‍රභේද සංවර්ධනය කිරීම සඳහා ඉහළ අස්වැන්නක් සහ හොඳ තත්ත්වයේ නුමුහුම් පෙළපත් සංවර්ධනය කිරීම.
- කොස් ජාන ප්ලාස්මය එකතු කිරීම, ඇගයීම, ගුණාංගීකරණය සහ තෝරා ගැනීම.
- ශ්‍රී ලංකාවේ දෙහි (citrus) වගාව ආශ්‍රිත වෛරස් සහ වයිරොයිඩ් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම.
- ලංකාවේ පැෂන් ෆෘට් වගාව ආශ්‍රිත වෛරස් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම සහ නව වෛරස් වල ලක්ෂණ හඳුනා ගැනීම.
- විදේශීය ජාන මූලාශ්‍ර භාවිතයෙන් පැපොල් (*Carica papaya*) නුමුහුම් පෙලපත් සංවර්ධනය කිරීම.
- හොඳම තත්ත්වයේ අන්නාසි සඳහා වඩාත් සුදුසු ස්ථාන හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි-පාරිසරික කලාපවල වගා කරන ලද අන්නාසි ප්‍රභේද දෙකක භෞතික රසායනික හා ප්‍රතිඔක්සිකාරක ගුණාංග ඇගයීම.
- බඩ ඉරිඟු වගාවේ සේනා දළඹුවා පාලනයට (*Spodoptera frugiperda*) (J.E. Smith) (Lepidoptera: Noctuidae) වර්තමාන ඒකාබද්ධ පළිබෝධ පාලන පැකේජය වැඩි දියුණු කිරීම
- කාබනික වගාව යටතේ තල සහ මුං ඇට වල එලදායිතාව වැඩි දියුණු කිරීම.
- මුරුංගා කොළ සහ කරල් නිෂ්පාදනය සඳහා මුරුංගා (*Moringa olefera*) ප්‍රභේද සංවර්ධනය කිරීම.
- රටකජු වල ඇස්පර්ගිලස් (*Aspergillus* spp.) විශේෂ මඟින් ඇෆ්ලටොක්සීන් (aflatoxin) හානි වන අවධිය හඳුනා ගැනීම හා පාලනය
- ගොවීන්ගේ සහභාගීත්ව ප්‍රවේශය භාවිතා කරමින් වර්ෂා පෝෂිත පද්ධති සඳහා කෙටි කාලීන රටකජු ප්‍රභේද සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ සියඹලා සහ පැණි රස සියඹලා සංරක්ෂණය, ඇගයීම සහ නිර්දේශ කිරීම.
- ආනයනික ටැංජරීන් වෙනුවට ශ්‍රී ලංකාවේ ටැංජරීන් (හීන් නාරන්) වාණිජ වගාව සඳහා තාක්ෂණික සංවර්ධනය, රූපානුදර්ශී ලක්ෂණ විද්‍යාත්මක අධ්‍යයනය කිරීම පසු අස්වනු නිෂ්පාදන සංවර්ධනය කිරීම.
- නියඟයට ඔරොත්තු දෙන සෝයා බෝංචි ප්‍රභේද/ ප්‍රභේදයන් සංවර්ධනය කිරීම.
- උසස් ගුණාත්මයෙන් යුතු බීජ (විශාල දිලිසෙන කොළපාට, යක් ඇට අඩු ) මුං ප්‍රභේද නිපද වීම හා එම ප්‍රභේදවල පත්‍ර විචිත්‍ර වෛරස් රෝගය හා පිටිපුස් රෝගයට ඔරොත්තුදීමේ හැකියාව වැඩි දියුණු කිරීම.
- ශ්‍රී ලංකාවේ වී වගාවේ පළිබෝධනාශක භාවිතය අඩු කිරීම සඳහා දුඹුරු පැල කීඩෑවා (*Nilapavata lugens*) සහ පිට සුදු පැල කීඩෑවා (*Sogatella furcifera*) සඳහා පරිසර හිතකාමී කළමනාකරණ පැකේජය තක්සේරු කිරීම.

- වී වගාවේදී නයිට්‍රජන් පොහොර කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා නව අභිජනන වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා දායක මව් පිය පරම්පරාව ලෙස භාවිතා කිරීම සඳහා වී වගාවේ නයිට්‍රජන් භාවිත කාර්යක්ෂමතා ලක්ෂණ අධ්‍යයනය කිරීම.
- වල් බීජ සංචිතය අවම කිරීමට අතර මැදි කන්නයේදී බෝග වගාව පිළිබඳ අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ සහල් වල රුක්මල් පිදීමේ රෝගය සහ එහි කළමනාකරණ උපාය මාර්ග පිළිබඳ අධ්‍යයනය.
- යකඩ විෂ වීමට ඔරොත්තු දෙන සහල් ජාන ප්ලාස්මයේ රූපානුදර්ශ සහ ප්‍රවේණි දර්ශ පරීක්ෂාව.
- වල් වී බීජ සංචිතය අවම කිරීමෙන් වල් වී පාලන පැකේජයක් සංවර්ධනය කිරීම.
- පහතරට තෙත් කලාපයට අනුවර්තනය විය හැකි නව ශාක වර්ගය සමඟ වී ප්‍රභේදවල මූල මණ්ඩල ලක්ෂණ වැඩිදියුණු කිරීම.
- ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයේ වී වගාවේ නයිට්‍රජන් භාවිතයේ කාර්යක්ෂමතාව, පාංශු ගුණාංග, වර්ධනය, අස්වැන්න සහ ගුණාත්මකභාවය කෙරෙහි කර දහයියා සහ යූරියා පොහොරවල විවිධ මට්ටම්වල බලපෑම.
- දුඹුරු පැල කිඩෑවා (BPH) බැක්ටීරියා කොළ අංගමාරය (BLB) සහ කොළ පාළුව සඳහා අණුක අභිජනන ප්‍රවේශයන් සහිත පිපිරීම සඳහා බහු-ප්‍රතිරෝධී පෙළපත් සංවර්ධනය කිරීම.
- ආහාර සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සඳහා ප්‍රයෝජනවත් ගුණාංග හඳුනා ගැනීම සඳහා තෝරාගත් වී ප්‍රභේදවල භෞතික, භෞත රසායනික ගුණාංග, ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරීත්වය, සහ ග්ලයිසමික් දර්ශකය පිළිබඳ පරීක්ෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම.
- බහුවිධ ප්‍රතිලාභ සහිත නවීකරණය කරන ලද බෝග සංස්ථාපන ක්‍රමයක් ලෙස හයිඩ්‍රොජෙල් ආවරණිත බීජ වී සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ සහල් වල බැක්ටීරියා කොළ අංගමාරයට හේතු වන සැන්තොමොනාස් ඔරිසා පීවී ඔරිසා වල ව්‍යාධි වර්ග රූප විද්‍යාත්මකව සහ අණුක ලෙස හඳුනා ගැනීම.
- අස්වනු පරතරය අවම කිරීම සඳහා දේශගුණ බලපෑම අවම කරමින් ලක්ෂණ තහවුරු කිරීම හා ප්‍රශස්තකරණය
- විවිධ පාරිසරික හා ගබඩා තත්ත්ව යටතේ නිෂ්පාදිත එළවළු හා අතරේක ආහාර බෝගවල බීජ ජීව්‍යතාව ආරක්ෂා වන පරිදි ගබඩා කාලය පුරෝකථනය කිරීම
- එළවළු බෝගවල (මාළු මිරිස්, තක්කාලි සහ කරවිල) බීජ දිරිය, ශක්තිය සහ අස්වැන්න වැඩි දියුණු කිරීම සඳහා බීජ තත්ත්ව තාක්ෂණයන් (priming technology ) සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවේ ඇති රතු දත්ත ලැයිස්තුගත සහ අනෙකුත් වැල් අල විශේෂ ගවේෂණය, රූපාණුදර්ශ සහ ප්‍රවේණිදර්ශ ලාක්ෂණිකරණය සහ සංරක්ෂණය.

### 1.8.2. කෘෂිකර්ම ව්‍යාප්ති සහ පුහුණු

**v.) කෘෂිකර්ම විද්‍යාල සංවර්ධනය**

- කෘෂිකර්ම විද්‍යාල 11 ක (පැල්වෙහෙර, කුණ්ඩසාලේ, වවුනියාව, අගුණකොළපැලැස්ස, කරපිංච, අනුරාධපුරය, බිබිල, වාරියපොල, ලබුදූව, පාලමුනේ සහ පරන්තන්) යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යයන කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම සිදු කරන ලදී.
- අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාලයේ නේවාසිකාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය (අදියර 2) කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

- අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලයේ 1 වන සහ 2 වන දේශන ශාලා ප්‍රතිසංස්කරණය කිරීම හා පරිපාලන ගොඩනැගිල්ලේ සම්මන්ත්‍රණ ශාලාව සනීපාරක්ෂක පහසුකම් සහිතව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩරය ප්‍රධානය කර ඇති අතර පිරිමි නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
- පරන්තන් කෘෂිකර්ම විද්‍යාලයේ මුළුතැන්ගෙය සහ කෑම ශාලාව ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් පවතින අතර ලබුදුව කෘෂිකර්ම විද්‍යාලයේ ගබඩා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.
- වාරියපොළ කෘෂිකර්ම විද්‍යාලයේ නව නේවාසිකාගාරයක් ඉදිකිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර පාලමුනේ කෘෂිකර්ම විද්‍යාලයේ කාන්තා නේවාසිකාගාර ඉදිකිරීම (අදියර II) අවසන් කර ඇත.
- වවුනියා කෘෂිකර්ම විද්‍යාලයේ වැසිකිළි පහසුකම් සහිත නව මුර කුටි 2 ක් ඉදිකිරීම, කාර්ය මණ්ඩල විවේකාගාරය සම්පූර්ණ කිරීම හා වැසිකිළි අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇති අතර සාද නිවාස අලුත්වැඩියාව (අදියර 1) සඳහා ටෙන්ඩරය කැඳවා ඇත.
- කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ වැසිකිළි අලුත්වැඩියාව අවසන් කර ඇති අතර ප්‍රධාන පිවිසුම් වහල යේ වැඩ කටයුතු සිදුවෙමින් පවතී
- කරපිංච කෘෂිකර්ම විද්‍යාලයේ නේවාසිකාගාර වහල අලුත්වැඩියා  කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර  පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාලයේ නිල නිවාස අංක 1,4,5,20 අලුත්වැඩියා කටයුතු සිදු වෙමින් පවතී.

**vi.) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සම්මන්ත්‍රණය (ASDA)**

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සම්මන්ත්‍රණය 2025 සැප්තැම්බර් 12 වන දින සාර්ථකව පැවැත්විණි.

**vii.) මාධ්‍ය වැඩසටහන්**

- ගුවන්විදුලි වැඩසටහන් 1923ක් (කොළඹ - 496, රජරට - 151, කඳුරට - 494, රුහුණු - 749, යාපනය - 33) විකාශනය කිරීම සහ රූපවාහිනී වැඩසටහන් 114ක් විකාශය කිරීම (ගොවිබිමට අරුණළු - 38, මිහිකත දිනුවෝ - 37, උයරුම් උලවුම් - 39) සම්පූර්ණ කරන ලදී.
- මුළු නරඹන්නන් සංඛ්‍යාව මිහිකත දිනුවෝ - 58,761, ගොවිබිමට අරුණළු - 48,233, උයරුම් උලවුම්  - 29,493, යූ ටියුබ් - 1,308,221 සහ ෆේස්බුක් - 334,307.
- කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය මගින් පොත් 19,742 ක්, නැවත මුද්‍රණ 7450 සහ පත්‍රිකා 5000 ක් මුද්‍රණය කෙරුණු අතර ප්‍රකාශන අලෙවියෙන් ලද ආදායම රු. 1,918,844 කි.

**viii.) කෘෂි තාක්ෂණ උද්‍යාන පවත්වාගෙන යාම**

- ප්‍රජාව අතර නිසි කෘෂිකාර්මික තාක්ෂණ ප්‍රචලිත කිරීම සඳහා ගන්නොරුව සහ, බටඅත කෘෂි තාක්ෂණ උද්‍යාන ආදර්ශන ලෙස පවත්වාගෙන යාම  සිදු කෙරේ. ගන්නොරුවට පැමිණි අමුත්තන්ගේ මුළු සංඛ්‍යාව 52,968 ක් (දේශීය - 52,421, විදේශීය - 547) වන අතර එයින් රුපියල් 1,324,200.00 ක ආදායමක් ද බටඅතට පැමිණි 17,380 අමුත්තන්ගෙන් (දේශීය - 17,259, විදේශිය - 121) රුපියල් 742,948.72 ක ආදායමක් ද උපයා ඇත. (ප්‍රවේශපත්‍ර/ ගොවිපල නිෂ්පාදන/ මත්ස්‍ය චිකිත්සාව)

**ix.) පසේ සරුබව පරීක්ෂා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම**

- වී වගාකරන ඉඩම්වලට පාංශු පරීක්ෂාව මත පදනම් වූ පොහොර නිර්දේශ හඳුන්වාදීම සඳහා පස් සාම්පල එකතු කිරීම ආරම්භ කර ඇති අතර වර්ණාවලි දීප්තමාන (Spectrophotometers) 4ක් සහ ඩිජිටල් pH මීටරයක් මිලදී ගැනීම සඳහා ටෙන්ඩරය කැඳවන ලදී.
- මොනරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය සඳහා ආනයනය කිරීමට නියමිත රසායනාගාර උපකරණ සඳහා මිලදී ගැනීමේ නියෝගය නිකුත් කර ඇති අතර දිස්ත්‍රික් මට්ටමේ පාංශු රසායනාගාර 3ක් (අම්පාර, මොනරාගල සහ හසලක) පරීක්ෂා කරන ලදී.

**x.) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් විෂ රහිත ආහාර නිෂ්පාදනය ආහාර නිෂ්පාදනය සඳහා ගොවීන්ට සහාය වීම**

- "යහපත් කෘෂිකාර්මික පිළිවෙත්" (GAP) ගොවිපොළ 236ක් සඳහා සහතික නිකුත්කොට ඇති අතර තවත් ගොවිපොළ 586ක් සම්පූර්ණයෙන් සංවර්ධනය කොට GAP සහතිකකරණය සඳහා අයදුම් කොට ඇත. තවත් GAP ගොවිපොළ 1927ක සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතී.
- බිම් මල් සහ මහ කන්නයේ වී වගා යාය සඳහා GAP වැඩසටහන් දියත් කොට එහි නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනය සඳහා සන්නාම කරණය කරන ලද බිම්මල් බෑග් 100,000ක් සහ කි.ග්‍රෑම් 5 සහල් බෑග් 60,000ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කොට ඇති අතර ඒවා ගොවීන් වෙත ලබාදීමට නියමිතය. අදාළ අගය එකතුකළ GAP බිම්මල් සහ සහල් බෑග් සුපිරි වෙළඳසල් වල අලෙවියට යෝජිතය.
- ගොවීන් සඳහා පුහුණු වැඩමුළු 300ක් සහ අලෙවි ප්‍රවර්ධනය අරමුණුකොටගෙන ප්‍රධාන සුපිරි වෙළඳසල් ජාල 2 ක් සමග GAP අලෙවි ප්‍රවර්ධන වැඩමුළු පවත්වා ඇත.
- යුරෝපීය සංගමයේ රටවල් සඳහා එළවලු හා පලතුරු මෙ.ටො. 137ක් අපනයනය සඳහා කටයුතු කොට ඇත.

**xi.) වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය**

- **මිරිස් වගාවේ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම**

MICHHY1 දෙමුහුම් මිරිස් බීජ කිලෝග්‍රෑම් 15ක් සහ ජල පොම්ප 14 ක් ගොවීන්ට 50% සහනාධාරය යටතේ බෙදා දුන් අතර, ගෙවතු මට්ටමින් වියළි මිරිස් නිෂ්පාදනය සඳහා වගා මලු 200,000 ක් මිලදී ගැනීම අවසන් කරන ලදී. අස්වනු සමීක්ෂණ දත්ත නිවැරදිතාවය වැඩි දියුණු කිරීම සඳහා අස්වනු සමීක්ෂණ පුහුණු 7 ක් සහ භූමි සාධක ගණනය කිරීම් 32 ක් සිදු කරන ලද අතර අම්පාර, අනුරාධපුර සහ මොනරාගල යන ප්‍රදේශවල තාක්‍ෂණික ව්‍යාප්ති පුහුණු 15 ක් සිදු කරන ලදී.

- **ශ්‍රී ලංකාවේ ළූණු වගා කළ හැකි ප්‍රදේශවල තෝරාගත් ගොවීන්ට සහනාධාර යෙදවුම් සැපයුම් යෝජනා ක්‍රමයක් හරහා ලොකු ළූණු සහ සත්‍ය බීජ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම**

ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා, බිංදු ජල සම්පාදන පද්ධති 100 ක් සඳහා ටෙන්ඩරයක් ප්‍රදානය කෙරෙන අතර සහනාධාර මත ලොකු ළූණු නිෂ්පාදන ඒකක 163 ක් ස්ථාපිත කිරීමටත්, ගලෙන්බිඳුණුවැව ගොවි සමිති සඳහා පාත්ති සකස් කිරීමේ යන්ත්‍ර දෙකක් සඳහා මිල ගණන් කැඳවීමටත් කටයුතු කරන ලදී.

සහතික කළ බීජ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ඒකක 30 ක් පිහිටුවීම සඳහා සහනාධාර ලබා දෙන ලද අතර ප්ලාස්ටික් කූඩ 2,250 ක් සඳහා ප්‍රසම්පාදනය ආරම්භ කරන ලදී. දෙසැම්බර් මාසය වන විට මව් බල්බ කිලෝග්‍රෑම් 60,000 ක් නිෂ්පාදනය කිරීම සඳහා බීජ නිෂ්පාදන ඒකක 600 ක් තෝරා ගන්නා ලද අතර, පොලිතින් සහ මල් ආධාරක දැල් මිලදී ගැනීම ද සිදු විය.

සත්‍ය බීජ නිෂ්පාදනය සඳහා 50% ක ගොවි දායකත්වය යටතේ තාවකාලික වැසි ආවරණ ලබාදීමට අදාල ටෙන්ඩරය ප්‍රදානය කරන ලද අතර, කුඩා ප්‍රමාණයේ වැසි ආවරණ සඳහා තාක්ෂණික ඇගයීම සිදු කර ඇත. සමුපකාර පිහිටුවීම මඟින් අලෙවිකරණය ශක්තිමත් කිරීම සඳහා ශීත ගබඩා කාමරයක් පිහිටුවීම සහ ඇසුරුම් සඳහා යෙදවුම් සැපයීමට අදාල පුවත් පත් දැන්වීම ප්‍රකාශයට පත් කරන ලද අතර, ගොවි පුහුණු සහ අස්වනු සමීක්ෂණ පුහුණු සිදු කර ඇත.

- **දේශීය දෙමුහුම් බඩ ඉරිඟු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචලිත කිරීම සඳහා වූ ව්‍යාපෘතිය - 2025**

දේශීය දෙමුහුම් බඩ ඉරිඟු බීජ සහ මාපිය ආර නිෂ්පාදනය අක්කර 150 ක නිම කරන ලද අතර, අධි-ඝනත්ව ක්‍රමය භාවිතා කරමින් අක්කරයක ආදර්ශන 8,891 ක් ස්ථාපිත කරන ලදී. ගොවි පුහුණු හතක් පවත්වන ලද අතර, පෝස්ටර් 3,000 ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. බඩ ඉරිඟු බීජවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා තෙතමනය මීටර මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- **අර්තාපල් නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම**

ක්ෂේත්‍ර මට්ටමේ අර්තාපල් බීජ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3,000 සිට මෙට්‍රික් ටොන් 10,000 දක්වා ඉහළ නැංවීම සඳහා 50% සහනාධාර යටතේ G0 බීජ මිලියන 0.25 ක් සපයන ලදී. දැනට, බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 120 ක් සීතාඑළියේ ශීතාගාරවල ගබඩා කර ඇති අතර, සීතාඑළිය සහ පිදුරුතලාගල ගොවිපලවල බීජ සහ ශීතාගාර පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර ඇත. බොහෝ ක්‍රියාකාරකම් 2025 නොවැම්බර් මාසයේදී සිදු කිරීමට නියමිතය.

- **2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුං නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම.**

ස්වයංමුං බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ වගාව පුළුල් කිරීම සඳහා ක්ෂේත්‍ර ආදර්ශන සඳහා බීජ කිලෝග්‍රෑම් 4,620 ක් බෙදා හරින ලද / මිලදී ගන්නා ලද අතර, ඵලදායිතාව වැඩි කිරීමේ ආදර්ශන සඳහා බීජ කිලෝග්‍රෑම් 320 ක් සහ කෘෂි රසායන ලබා දෙන ලදී. පිරිවැය අඩු කිරීමට සහ ගබඩා තත්ව වැඩි දියුණු කිරීම සඳහා 50% සහනාධාරය යටතේ බීජ වප්කර 100 ක්, සූර්ය විදුලි වැට සඳහා වන ජනක යන්ත්‍ර 50 ක්, බීජ වෙන් කිරීමේ යන්ත්‍ර සහ ත්‍රිත්ව ස්ථර බෑග් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරේ. පුහුණු වැඩසටහන්, ඉහළ අස්වැන්නක් ලබා දෙන ආදර්ශන සහ මුං ඇට අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යස්ථානවල සිදුවෙමින් පවතී. ඊට අමතරව, පෝස්ටර් 2,000 ක් සහ අත්පත්‍රිකා 4,000 ක් මුද්‍රණය කරන ලද අතර, දැනුවත්භාවය වැඩි කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලද අතර, ගොවීන් සහ නිලධාරීන් සඳහා පුහුණු 51 ක් සම්පූර්ණ කර ඇත.

- **උඳු නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ නැංවීම**

හසලක ප්‍රදේශයේ ගොවීන්ට සහතික උඳු බීජ කිලෝග්‍රෑම් 100ක් ස්වයං බීජ නිෂ්පාදනය සඳහා බෙදා දුන් අතර, 50%ක ගොවි දායකත්වයක් යටතේ විදුලි වැටවල් 50ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් ඇගයීම සිදු කරයි. පොළොන්නරුව, හසලක සහ අනුරාධපුරය දිස්ත්‍රික්ක වල ගොවි පුහුණු

වැඩසටහන් 12ක් පවත්වන ලද අතර, දැනුවත්භාවය වැඩි කිරීම සඳහා උඳු අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳ වීඩියෝවක් නිෂ්පාදනය කර ඇත.

- **කව්පි නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම**

හසලක කව්පි ගොවීන්ට බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 60ක් නොමිලේ බෙදා හරින ලද අතර, මහ කන්නයේ බීජ නිෂ්පාදනය සඳහා තෝරා ගැනීම් සිදු කරන ලදී. නිෂ්පාදන ඒකක 10 ක් සඳහා 50% සහනාධාර යටතේ මීටර් 100 ඇල්කතීන් හෝස් සඳහා ටෙන්ඩර් කැඳවීමට නියමිතය. නව තාක්ෂණයන් සහ අගය එකතු කිරීම පිළිබඳ තාක්ෂණික පැකේජ ආදර්ශන 10ක් සහ ගොවි පුහුණු 6ක් පොළොන්නරුව, මොනරාගල, අනුරාධපුර සහ රත්නපුර යන ප්‍රදේශවල පවත්වා ඇත.

- **ශ්‍රී ලංකාවේ රටකජු නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම.**

සහතික කළ රටකජු බීජ නිෂ්පාදනය සඳහා ගොවීන්ට නොමිලේ බෙදා හැරීමට ලියාපදිංචි බීජ කිලෝග්‍රෑම් 1,600 ක් ඇණවුම් කරන ලදී. අභිජනන බීජ නිෂ්පාදනයට සහාය වීම සඳහා කරදියනාරු ප්‍රාදේශීය පර්යේෂණ ස්ථානයේ නල ළිඳක් ඉදිවෙමින් පවතින අතර, රටකජු නිෂ්පාදන සමිතිවලට නොමිලේ රටකජු ගැලවීමේ යන්ත්‍ර 10 ක් ලබා දීම සඳහා පුවත්පත් දැන්වීමක් සූදානම් කර ඇත.

- **සෝයා නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම**

සෝයා බීජ කිලෝග්‍රෑම් 10,000 ක් නොමිලේ නිකුත් කිරීම මගින් දෙසැම්බර් මාසයේදී බීජ නිෂ්පාදන වැඩසටහනක් පවත්වන ලෙස මහවැලි අධිකාරියට දැනුම් දෙන ලද අතර, අවශ්‍ය බීජ, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයෙන් ඇණවුම් කර ඇත.

- **ශ්‍රී ලංකාවේ කුරක්කන් නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි දියුණු කිරීම.**

මහ සහ සුළු වාරි යටතේ නව උස්බිම් ප්‍රදේශවලට කුරක්කන් වගාව ව්‍යාප්ත කිරීම සඳහා නොමිලේ ලබාදෙන ලද සහතික කළ බීජ භාවිතා කරමින් අන්තර් පළාත් සහ පළාත් බල ප්‍රදේශවල වගා කිරීම සිදු කරමින් පවතී.

මහ / සුළු වාරි යටතේ උස්බිම් වල යල කන්නයේ පැල සිටුවීම මඟින් ක්ෂේත්‍ර සංස්ථාපනය ප්‍රවර්ධනය ද ක්‍රියාත්මක වන අතර, සහතික කළ බීජ නොමිලේ ලබාදීම , 50% සහනාධාර යටතේ බිම් සකස් කිරීම, පැල සිටුවීම සහ කමත් අතුරන ලබා දීම සිදු වේ.

ගොවි පුහුණු වැඩසටහන් තුනක් සම්පූර්ණ කරන ලදී.

- **රතු ළූණු නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.**

ගොවි ක්ෂේත්‍රවල සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතනවල රතු ළූණු සත්‍ය බීජ නිෂ්පාදන ඒකක 101ක් සහ බීජ බල්බ නිෂ්පාදන ඒකක 55ක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් 50,000ක් වටිනා යෙදවුම් ලබා දෙන ලදී. 50% සහනාධාර යටතේ රතු ළූණු බල්බ ගබඩා කුටි 10ක් සහ විසුරුම් ජල සම්පාදන පද්ධති 10ක් ඉදිකිරීම සිදුවෙමින් පවතින අතර, අම්පාර අන්තර් පළාතෙහි ගොවි පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- **තල සංවර්ධන වැඩසටහන**

මහ කන්නයේ තල ස්වයං-බීජ නිෂ්පාදන වැඩසටහන යටතේ නොමිලේ බෙදා හැරීම සඳහා ලියාපදිංචි බීජ ඇණවුම් කරන ලද අතර එමඟින් නව වැඩිදියුණු කරන ලද ප්‍රභේද සුලභතාවය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. අනුරාධපුර, හම්බන්තොට සහ මොනරාගල යන ප්‍රදේශවල නිෂ්පාදන ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ අගය දාම සංවර්ධනයට සහාය වීම සඳහා 50% සහනාධාර

යටතේ ටාපෝලින්, පිරිසිදු කිරීමේ යන්ත්‍ර සහ ගබඩා කෑන් මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන ලදී. ඊට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපලට අතිරේක ජල සම්පාදනය මඟින් ඉහළ අස්වැන්නක් ලබා දෙන පැකේජ අත්හදා බැලීම් සඳහා ජල සම්පාදන පද්ධති මිලදී ගැනීමට ටෙන්ඩර කැඳවන ලදී.

- **ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා නිවර්තන අල බෝග - බතල (Ipomoea batatas), ඉන්නල (Coleus rotundifollius), රාජ අල (Dioscorea Spp.), කිරි අල (Xanthosoma Spp.), මඤ්ඤොක්කා (Manihot esculenta) නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.**

තෙලිජ්ජවිල, වල්පිට, උල්පතගම සහ අඹේපුස්ස යන රජයේ බීජ ගොවිපලවල බතල, කිරි අල, වැල් අල, ඉන්නල, අර්තාපල් සහ මඤ්ඤොක්කා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදුවෙමින් පවතී. වඩා හොඳ ප්‍රභේද භාවිතා කරමින් ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ ආයතන සහ ගොවිපලවල ඉඩම් සංවර්ධනය, ජල සම්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම්, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, අභිජනනය සහ පර්යේෂණ සිදුවෙමින් පවතී. ප්‍රධාන පළිබෝධ සහ රෝග හඳුනා ගැනීම සහ ඵලදායී පාලන උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදුවෙමින් පවතී. අනුරාධපුර, හසලක සහ අම්පාර යන ප්‍රදේශවල ගොවීන් සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින් තෝරා ගන්නා ලද අතර, දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ. 50% ක ගොවි දායකත්වයක් යටතේ ගොවීන් 210 දෙනෙකු සඳහා ආරක්ෂිත වැටවල් ලබා දීමට දැන්වීම් පල කර ඇත. ගෙවතු මට්ටමේ අල බෝග නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා හසලක ප්‍රදේශයේ බතල සහ ඩයොස්කෝරියා රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම ආරම්භ කර ඇත.

### 1.8.3. බීජ සහතික කිරීම සහ ශාක ආරක්ෂණය

**xii.) ජාතික බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීමේ වැඩසටහන**

- ගොවීන් අතර ගුණාත්මක බීජ ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ වගා කරන ලද (ලියාපදිංචි සහ සහතික කළ) වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙට්‍රික් ටොන් 261.13 ක්ද, කොන්ත්‍රාත් පදනම යටතේ වගා කරන ලද ලියාපදිංචි සහ සහතික කළ වී බීජ බුසල් 27,847 ක්ද, සහ කොන්ත්‍රාත් පදනම යටතේ වගා කරන ලද සම්මත එළවළු බීජ කිලෝග්‍රෑම් 11,330.85 ක්ද මිලදී ගන්නා ලදී.
- බීජ ගබඩා කිරීම සහ ප්‍රවාහනය සඳහා ස්ටිකර්, රසායනික ද්‍රව්‍ය සහ ධූමකරණ කටයුතු සම්බන්ධ මිලදී ගැනීම් සිදු කර ඇත.

**xiii.) කඩිනම් බීජ ගොවිපල සංවර්ධන වැඩසටහන**

- කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ වාරිමාර්ග පද්ධතිය ස්ථාපනය කර ඇති අතර අඹේපුස්ස බීජ නිෂ්පාදන ගොවිපලේ සූර්ය බලශක්ති පොම්ප පද්ධතිය ස්ථාපනය කිරීම හා ජල ප්‍රවාහන මාර්ගය සැකසීම සඳහා ටෙන්ඩරය ප්‍රදානය කර ඇත.
- රහංගල, උඩරදැල්ල, පිදුරුතලාගල, මීපිලිමාන හා කඳපොල රජයේ බීජ නිෂ්පාදන ගොවිපල, කහගොල්ල අලෙවි මධ්‍යස්ථානය, සීතාඑළිය කෘෂි තාක්ෂණ උද්‍යානය හා හරිතාගාර සංකීර්ණය සඳහා සූර්ය බලශක්ති වීදි ලාම්පු 132 ක් ස්ථාපනය කර ඇත.
- කන්තලේ හා නිකවැරටිය රජයේ බීජ නිෂ්පාදන ගොවිපල සඳහා අවශ්‍ය බීජ වියලන (පිළිවෙළින් මෙ.ටො. 6.5 සහ මෙ.ටො. 3.5) 2ක් මිලදී ගැනීමට අදාළ ටෙන්ඩරය ප්‍රදානය කර ඇත.

- පරන්තන් රජයේ බීජ නිෂ්පාදන ගොවිපලහි වියලන තට්ටුව ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීම හා දම්වැල් වැට (Chain link fence) අවසන් කර ඇති අතර පොලොන්නරුව බීජ නිෂ්පාදන ගොවිපලහි පාර කොන්ක්‍රීට් කිරීම හා බටඅත බීජ නිෂ්පාදන ගොවිපල පාර ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවෙමින් පවතී.
- පැල්වෙහෙර රජයේ බීජ නිෂ්පාදන ගොවිපලහි GI ගබඩාව, කාර්යාලීය ගොඩනැගිල්ල හා නිල නිවස අංක 55 III B ප්‍රතිසංස්කරණය මෙන්ම පොලොන්නරුව රජයේ බීජ නිෂ්පාදන ගොවිපලහි කාර්යයාලීය ගොඩනැගිල්ලේ හා සංචාරක බංගලාව (අදියර III) හි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇත.
- තවද මීපිලිමාන රජයේ බීජ නිෂ්පාදන ගොවිපල නිල නිවාස අංක 3 (III B), කිලිනොච්චි නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ බීජ ගබඩාව ඉදි කිරීම, අලුත්තරම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය (අදියර IV) හා කන්තලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ නිල නිවාස අංක 2 හි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇත.

**xiv.) දේශීය අල බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම**

- සීතාඑළිය හරිතාගාර සංකීර්ණයේ පැළ ගෘහ ප්‍රතිසංස්කරණය කිරීම, උපකරණ මිලදී ගැනීම සහ අලුත්වැඩියා කිරීම, පැළ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම, සීතාඑළිය පර්යේෂණ ස්ථානයේ පටක රෝපණ විද්‍යාගාරයක්, දැල් නිවාස සහ සිසිල් කාමරයක් සංවර්ධනය කිරීම සහ බණ්ඩාරවෙල පර්යේෂණ මධ්‍යස්ථානයේ අල මුල් ඇද්දූ කඳ කැබලි පැළ නිෂ්පාදන පද්ධතියක්, දැල් නිවසක්, රසායනික ද්‍රව්‍ය, පොහොර සහ දෛනික නඩත්තු කටයුතු සිදු වෙමින් පවතී.
- සීතාඑළිය බීජ අර්තාපල් ගබඩාවේ ගබඩා පහසුකම් සහ අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර දැනට 45% වැඩ අවසන් කර ඇත.

**xv.) බීජ සහතික කිරීමේ කටයුතු ශක්තිමත් ශක්තිමත් කිරීම**

- මහඉලුප්පල්ලම බීජ පරීක්ෂණාගාර පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු, ගන්නොරුව බීජ සෞඛ්‍ය පරීක්ෂණ ඒකකයේ පැළ නිවසක් සහ බටඅත බීජ පරීක්ෂණාගාරයේ තවාන් මඩුව ඉදිකිරීම් සම්පූර්ණ කර ඇති අතර බීජ සහතික කිරීමේ සේවය ගන්නෝරුවේ හි කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් පවතී
- ගන්නෝරුව පැරණි වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු, හිඟුරක්ගොඩ බීජ සහතික කිරීමේ සේවයහි කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් පවති

**xvi.) බීජ පනත ක්‍රියාත්මක කිරීම තුළින් බීජ සහ රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහතික කිරීම**

- බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 674 ක් ලියාපදිංචි කර ඇති අතර බීජ හසුරුවන්නන්ගේ ලියාපදිංචි කිරීම් 1156 ක් අලුත් කර ඇත.
- බීජ ලේබල් 1704 ක් අනුමත කර ඇති අතර බීජ හසුරුවන්නන්ගේ පරිශ්‍ර 2290 ක් අහඹු ලෙස පරීක්ෂාවට ලක් කරන ලදී.
- වී බීජ හෙක්ටයාර 6,314 ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ හෙක්ටයාර 966 ක්, එළවළු බීජ හෙක්ටයාර 93 ක් සහ අල බීජ හෙක්ටයාර 87 ක් සහතික කරන ලදී.රසායනාගාර පරීක්ෂණ සහ විශ්ලේෂණ 10,874 ක් සහ පශ්චාත් පාලන බීජ පරීක්ෂණ 1786 ක් පවත්වන ලදී.

- තවාන් 271 ක් ලියාපදිංචි කිරීමෙන් සහ පළතුරු පැල 638,075 ක් සහතික කිරීමෙන් පළතුරු පැල සහතික කිරීම සිදු කරන ලදී.

**xvii.) කෘෂි රසායනික ද්‍රව්‍ය හේතුවෙන් මිනිසාගේ සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවිය හැකි දැඩි අහිතකර බලපෑම් අවම කිරීම**

- කෘෂි රසායනික අලෙවි තාක්ෂණික සහකාර (ASTA) පුහුණු වැඩසටහන් 16ක් ආරම්භ කර ඇත.
- පරිසර ආරක්ෂණ බලපත්‍රය (Environment Protection License) හා නියමිත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය (Scheduled Waste Management License) ලබා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් මධ්‍යම පරිසර අධිකාරිය ඉදිරිපත් කරන ලදී.
- ලියාපදිංචි කිරීම සඳහා පළිබෝධනාශක ජෛව කාර්යක්ෂමතා පරීක්ෂණ 86ක් සහ ක්ෂේත්‍ර සාම්පල පරීක්ෂණ 522ක් සම්පූර්ණ කරන ලදී.
- යාපනයේ කලාපීය හිස් පළිබෝධනාශක බහාලුම් එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කරන ලද අතර රාජසන්තක කරන ලද පළිබෝධනාශක (මෙට්‍රික් ටොන් 4) පූර්ව සැකසුම් සහ සම-සැකසීම සඳහා ලංසු ඇගයීම සිදුවෙමින් පවතී.
- ඩ්‍රෝන යානා යොදා ගෙන පළිබෝධනාශක යෙදීම සඳහා ප්‍රොටෝකෝල සංවර්ධනය කිරීම යටතේ අත්හදා බැලීම් සිදුවෙමින් පවතී.

**xviii.) සැපයුම් දාම ව්‍යුහය ශක්තිමත් කිරීම තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි නිෂ්පාදකයින්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම (JICA)**

- වෙළඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදන තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂිකාර්මික නිෂ්පාදකයින්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් 3 ක් ද, ගොවි පුහුණු වැඩසටහන් 90 ක් ද, රටවල් 11ක සහභාගීත්වයෙන් ජාත්‍යන්තර SHEP වැඩමුළුවක් ද පවත්වන ලදී.
- ජාත්‍යන්තර නියෝජිතයින් සමඟ ක්ෂේත්‍ර චාරිකා 4ක් ඇතුළුව ක්ෂේත්‍ර චාරිකා 86 ක්ද පවත්වන ලද අතර JICA විසින් සපයන ලද KDH වෑන් රථය සහ ද්විත්ව කැබ් රථය සඳහා ඇණවුම ලබා දී ඇත.

**xix.) ගන්නොරුවේ ශාක ජාන සම්පත් බැංකුව නඩත්තු කිරීම**

- ජාන සම්පත් බැංකුව සඳහා අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍රයක්, GPS යන්ත්‍රයක්, Vacuum cleaner, ශීතකරණයක්, Hotplate with magnetic starrer, adjustable hook මිලදී ගන්නා ලද අතර රසායනාගාර උපකරණ 12ක් ක්‍රමාංකනය කරන ලදී.
- Epoxy පින්තාරු කිරීම සහ වහලය ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත.
- AC යන්ත්‍ර 2ක් අලුත්වැඩියා කිරීම සඳහා සම්පීඩක 2ක් සහ අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගන්නා ලද අතර බීජ ප්‍රදර්ශන කැබිනට්ටුව, රසායනාගාර කබා 12 සහ ඩිජිටල් මීටර සඳහා ඇණවුමක් ලබා දී ඇත

**xx.) ජෛව ආරක්ෂාව සහ ශාක සනීපාරක්ෂක අවශ්‍යතා සහතික කරමින් දේශසීමා වෙළඳාම ශක්තිමත් කිරීම**

- අපනයන සහතික කිරීම් සහ ආනයන නිෂ්කාශනයට අදාළ ශාක නිරෝධායන මෙහෙයුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක වෙමින් පවතින අතර රසායනාගාර සහ පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය සහ උපකරණ ප්‍රසම්පාදනය සිදුවෙමින් පවතී.

- කොටස්කරුවන් සහ නිරෝධායන නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය සඳහා වැඩසටහන් පවත්වනු ලබයි.
- ශාක සනීපාරක්ෂක අවශ්‍යතාවලට අනුකූල වීම, සහතික කිරීම සහ ජාතික ජෛව ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ඇතුල්වීමේ සහ පිටවීමේ ස්ථානවල රසායනාගාර යටිතල පහසුකම් සහ පරීක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

**xxi.) ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර ආරක්ෂිත සහ යෝග්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම (JICA ව්‍යාපෘතිය)**

- JICA විසින් සපයන ව්‍යාපෘති කාර්යයන් සඳහා අවශ්‍ය වාහනය මිලදී ගැනීම සඳහා ටෙන්ඩරය සකස් කරමින් පවතී.
- කුකබිටේසියේ කුලයේ බෝග සඳහා ඒකාබද්ධ පළිබෝධ සහ පෝෂක කළමනාකරණ පැකේජයේ සාර්ථකත්වය පරීක්ෂා කිරීම යටතේ ගොවි ක්ෂේත්‍ර 3 ක් සහ පර්යේෂණ ක්ෂේත්‍රයක් තෝරා ගන්නා ලදී, ගොවීන් තාක්ෂණයන් පිළිබඳව දැනුවත් කරන ලදී. ගොවි ක්ෂේත්‍ර අත්හදාබැලීම් 2ක් සිදු කරන ලද අතර ක්ෂේත්‍ර අත්හදාබැලීම් 1ක් සිදු කරන ලදී.
- ගෝවා, තක්කාලි සහ මාලු මිරිස් සඳහා පෝෂක කළමනාකරණ පැකේජයක් හඳුන්වා දීම යටතේ බදුල්ලේ ගෝවා සඳහා ගොවි ක්ෂේත්‍ර 2 ක් සහ තක්කාලි සඳහා ක්ෂේත්‍ර 2 ක් සහ කල්පිටියේ මාලු මිරිස් ක්ෂේත්‍ර 2 ක් සහ ගෝවා ක්ෂේත්‍ර 2 ක් හඳුනාගෙන, තවාන් ස්ථාපිත කිරීම සඳහා බීජ භාර දෙන ලදී.

**xxii.) සුළු පරිමාණ විදේශාධාර පර්යේෂණ ව්‍යාපෘති**

- **AFACI- Asian Food and Agriculture Cooperation Initiative**
  - AFACI සාමාජික රටවල් සඳහා අහිතකර පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙන, ඉහළ අස්වැන්නක් ලබා දෙන වී ප්‍රභේද හඳුනා ගැනීම.
  - ආසියාවේ එළවළු ප්‍රභේද සංවර්ධනය
  - ආසියාවේ පාංශු සිතියම සහ ජාතික පාංශු තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම.
  - ආසියාවේ ග්‍රාමීය කෘෂිකාර්මික තාක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම (RATES).
  - ආසියානු කලාපීය සේනා දළඹුවන් හා දුඹුරු පැල කීඩැවන් නිශ්චය කිරීමේ හා නිරීක්ෂණ වැඩසටහන

- **KOPIA (Korea Program on International Agriculture)**
  - ශ්‍රී ලංකාවේ ගොවි සහභාගීත්ව තක්කාලි දෙමුහුන් බීජ නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය කිරීම.
  - දෙමුහුම් මිරිස් බීජ නිෂ්පාදනය ඉහල නැංවීම තුලින් මිරිස් නිෂ්පාදන ගම්මාන ඇති කිරීම.

- **IAEA (International Atomic Energy Agency )**
  - ප්‍රේරිත විකෘති භාවිතයෙන් කුරක්කන් බෝගයේ අස්වැන්න සහ අස්වැන්න හා සම්බන්ධ අනෙකුත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ වැඩිදියුණු කිරීම .
  - ශ්‍රී ලංකාවේ සුවිශේෂී පරිසර දූෂණ කලාප තුනක වායුගෝලීය නයිට්‍රජන් දූෂණ මූලාශ්‍ර තක්සේරු කිරීම, පාරිසරික තිරසාර භාවය කෙරෙහි හා මානව සෞඛ්‍ය කෙරෙහි ඇති කරන්නා වූ බලපෑම සඳහා පිළියම් ක්‍රියාමාර්ග සෙවීම.

- ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත සංරක්ෂණ ප්‍රදේශ වල කඳුකර කෘෂිකාර්මික ජල පෝෂක වල කෘෂි දූෂක ප්‍රභවයන් හා ප්‍රවාහනය හඳුනා ගැනීම.

- **SDF (SAARC Development Fund)**
  - දකුණු ආසියාවේ දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය ඉහළ නැංවීම සඳහා වූ සම්මේලනය
  - සුළු පරිමාණ කෘෂි ව්‍යාපාර ඉලක්ක කොටගත් අගය දාම සංවර්ධනය තුලින් සාර්ක් කලාපීය රටවල ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමේ ව්‍යාපෘතිය

- **NARO – National Agricultural Research Organization**
  - ආසියානු හා අප්‍රිකානු වී වගා ක්ෂේත්‍ර වල මීතේන් විමෝචනය හා නිෂ්පාදනය අවම කිරීමේ හා අනුවර්තන වීමේ උපාය මාර්ග තුලින් නියාමනය කිරීම

- **AVRDC - Asian Vegetable Research and Development Center**
  - FRESH ව්‍යාපෘතිය යටතේ සහභාගීත්ව ඇගයීම් ප්‍රවේශය හරහා ශ්‍රී ලංකාවේ තක්කාලි සහ මාළු මිරිස් ප්‍රභේද සංවර්ධනය කිරීම

- **Asian Food Composition Database – AFCD**
  - ආසියානු ආහාර සංයුති දත්ත සමුදායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම

- **The Borlaug Institute for South Asia - BISA**
  - දකුණු ආසියාවේ කෘෂිකර්ම අනුවර්තන සිතියම: දේශගුණික අවදානම්, භාවිතයන්, තාක්ෂණයන් සහ ප්‍රතිපත්ති අතර අන්තර් සම්බන්ධතා

- **CABI- Commonwealth Agricultural Bureau**
  - ශාක අනුව ස්ථිර බෝග සායන වැඩසටහන

**1.9. ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික ප්‍රවර්ධන විශේෂ වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

- **2025.09.30 දිනට ප්‍රගතිය**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ 118-02-03-020-2202 වැය ශීර්ෂය යටතේ ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික ප්‍රවර්ධන විශේෂ වැඩ සටහන් මගින් රු. මි. 247.56 ලබාදී ඇත. මේ යටතේ රජයේ පහත සඳහන් උපාය මාර්ගික ප්‍රමුඛතා ආවරණය වන ලෙස ව්‍යාපෘති 46 ක් මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

i.) ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා කෘෂිකාර්මික යෙදවුම් හා තාක්ෂණික ප්‍රවර්ධනය.
ii.) කෘෂිකර්ම පද්ධතිවල ඉහල නිෂ්පාදනමය හා කාර්යක්ෂමතාවය සහතික කිරීම.
iii.) කෘෂිකාර්මික ව්‍යවසායකයන් සහ තිරසාර වෙළඳපල ප්‍රවර්ධනය කිරීම.
iv.) කෘෂිකාර්මික හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ ඉඩම් විද්‍යාත්මකව සංවර්ධනය කර තිරසර ඉඩම් පරිහරණය සකස් කිරීම.
v.) කෘෂිකාර්මික පිළිවෙත් නිසි ලෙස කළමනාකරණයට පහසුකම් සැලසීම.
vi.) කෘෂිකර්මාන්තයට අදාළ මෙහෙයුම් පරිසර හිතකාමී ලෙස මෙහෙය වීම.
vii.) ව්‍යවසායකත්වයට සහ ආර්ථික වර්ධනය සඳහා ගොවීන් සවිබල ගැන්වීම.
viii.) කෘෂිකාර්මික පර්යේෂණ හා දැනුම කළමනාකරණය කිරීම.

ix.) ආනයනික බෝග සඳහා සුදුසු ආදේශන බෝග වගා කිරීම සහ දිරිමත් කිරීම.
x.) කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා ගබඩා, ශීතාගාර සැකසීම.

ඉහත ප්‍රමුඛතා ආවරණය වන ලෙස ක්ෂේත්‍ර බෝග ප්‍රවර්ධනය , මී මැසි පාලනය, දේශගුණික සුහුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම, කෘෂි කර්මාන්තය ආශ්‍රිත ව්‍යාප්ති සේවා වැඩි දියුණු කිරීම, යහපත් කෘෂි කාර්මික පිළිවෙත් හඳුන්වා දීම. රජයේ බීජ ගොවිපල වැඩි දියුණු කිරීම, පංගු සංරක්ෂන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම, පලතුරු බෝගයන්ගේ අපනයන විභවයන් වර්ධනය කිරීම, කෘෂි යෙදවුම් වලට අදාළ නවීන තාක්ෂණය හඳුන්වා දීම, කෘමි උවදුරු හා රෝග පාලනය සඳහා වන නවීන ක්‍රමවේද හඳුන්වා දීම වැනි ව්‍යාපෘති 46 ක් දැනට ක්‍රියාත්මක වේ.

ඡායාරූප අංක 17 - 33

## 02. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.1. දෙපාර්තමේන්තුව පිළිබඳ කෙටි හැඳින්වීම

ශ්‍රී ලාංකීය ගොවිජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 1957 ඔක්තෝම්බර් 01 වන දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ එතෙක් පැවති ආහාර දෙපාර්තමේන්තුව අහෝසි කරමිනි. 1958 අංක 01 දරණ කුඹුරු ඉඩම් පනතින් බල ගන්වන ලද මෙම දෙපාර්තමේන්තුව මේ වන විට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ක්‍රියාත්මක වේ.

### 2.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 4,794.50 |
| 2 | පුනරාවර්තන වියදම් | 13,083.10 |

### 2.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| 1 | | | |
| | අත්හැර දමනු ලැබූ වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහන | වැව් සංඛ්‍යාව | 345.00 |
| | සුළු වාරිමාර්ග සුළු ප්‍රතිසංස්කරණ වැඩසටහන (Kick Start) | ව්‍යාපෘති සංඛ්‍යාව | 335.00 |
| | ගංවතුර හානි ප්‍රතිසංස්කරණය | ව්‍යාපෘති සංඛ්‍යාව | 517.00 |
| | වැව් හා අමුණු ප්‍රතිසංස්කරණ වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | 595.00 |
| | කෘෂි මාර්ග අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | 313.00 |
| | කෘෂි ළිං අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | 28.00 |
| | සෘතුමය වගා වැට ඉදිකිරීම | ව්‍යාපෘති සංඛ්‍යාව | 145.00 |
| | ක්ෂුද්‍රවාරි ජල පද්ධති ක්‍රමය හඳුන්වාදීම | | 30.00 |
| | පැරෂුට් භාවිතයෙන් වගා කිරීම වැඩසටහන | අක්කර සංඛ්‍යාව | 110.00 |
| | වැව් වල මාළු පැටවුන් වගා කිරීම | වැව් සංඛ්‍යාව | 22.00 |
| | එකමිටට ගොවිබිමට වැඩසටහන සඳහා | | 250.00 |
| | විශේෂ ව්‍යාපෘති යෝජනා සඳහා | | 265.00 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| | ව්‍යාපෘති ආධාරක පිරිවැය | | 45.00 |
| | **එකතුව** | | **3,000.00** |
| | | | |
| 2 | ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලය අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | 60.00 |
| 3 | වාහන අළුත්වැඩියාව | වාහන සංඛ්‍යාව | 40.00 |
| 4 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | ඒකක සංඛ්‍යාව | 14.50 |
| 5 | පුහුණු හා හැකියා වර්ධනය | වැඩසටහන් සංඛ්‍යාව | 10.00 |
| 6 | ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියාව | ව්‍යාපෘති සංඛ්‍යාව | 500.00 |
| 7 | යන්ත්‍ර පුනරුත්ථාපනය | යන්ත්‍ර සංඛ්‍යාව | 50.00 |
| 8 | වාහන අළුත්වැඩියාව | වාහන සංඛ්‍යාව | 50.00 |
| 9 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | ඒකක සංඛ්‍යාව | 20.00 |
| 10 | යන්ත්‍ර අත්පත් කර ගැනීම | යන්ත්‍ර සංඛ්‍යාව | 600.00 |
| 11 | ගොඩනැගිලි නව ඉදිකිරීම | ව්‍යාපෘති සංඛ්‍යාව | 400.00 |
| 12 | බෝග විවිධාංගීකරණය | වැඩසටහන් සංඛ්‍යාව | 50.00 |

## 2.4. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 4,256.00 | 503.83 | 12 |
| 2 | පුනරාවර්තන වියදම් | 11,275.00 | 8,656.10 | 77 |
| **සංවර්ධන වැඩසටහන්** | | | | |
| 1 | සුළු වාරි මාර්ග සංවර්ධනය හා පුරන් කුඹුරු අස්වැද්දීම (ඉඩම් හා ඉඩම් සංවර්ධනය) | | | |
| | අත්හැර දමනු ලැබූ වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහන | 215.00 | 8.35 | 2 |
| | සුළු වාරිමාර්ග සුළු ප්‍රතිසංස්කරණ වැඩසටහන (Kick Start) | 335.00 | 18.41 | 6 |
| | ගංවතුර හානි ප්‍රතිසංස්කරණය | 660.00 | 29.31 | 5 |
| | වැව් හා අමුණු ප්‍රතිසංස්කරණ වැඩසටහන | 660.00 | 41.55 | 7 |
| | ක්ෂුද්‍රවාරි ජල පද්ධති ඇතිකිරීම | 15.00 | - | - |
| | කෘෂි මාර්ග අළුත්වැඩියාව | 315.00 | 16.51 | 5 |
| | පැරණි වගාව ප්‍රචලිත කිරීම | 163.00 | - | - |
| | වැව් වල මාළු පැටවුන් වගා කිරීම | 2.00 | - | - |
| | කැවන්ඩිස් කෙසෙල් වගා කිරීමේ වැඩසටහන | 50.00 | - | - |
| | එක මිටට ගොවි බිමට වැඩසටහන | 392.50 | 21.33 | 5 |
| | අතැතිබිල් පියවීම | 220.00 | 198.81 | 90 |
| | බැදීම් ව්‍යාපෘති | 170.00 | 58.23 | 35 |
| | ව්‍යාපෘති ආධාරක පිරිවැය | 52.50 | 0.20 | 0 |
| 2 | ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලය අළුත්වැඩියාව | 30.00 | 1.97 | 7 |
| 3 | වාහන අළුත්වැඩියාව | 25.00 | 13.70 | 55 |
| 4 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 8.00 | 6.28 | 78 |
| 5 | පුහුණු හා හැකියා වර්ධනය | 10.00 | 3.70 | 37 |

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 6 | ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියාව | 400.00 | 69.00 | 18 |
| 7 | යන්ත්‍ර පුනරුත්ථාපනය | 72.00 | 6.27 | 8 |
| 8 | වාහන අළුත්වැඩියාව | 38.00 | 1.94 | 5 |
| 9 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 15.00 | 3.34 | 22 |
| 10 | යන්ත්‍ර අත්පත් කර ගැනීම | 8.00 | වැඩසටහන ක්‍රියාත්මක නොවේ | |
| 11 | ගොඩනැගිලි නව ඉදිකිරීම | 100.00 | 4.93 | 5 |
| 12 | බෝග විවිධාංගීකරණය | 50.00 | - | - |

**2.4. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය**

- **ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල අළුත්වැඩියාව**

ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් 281-1-1-0-2001 වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි. 30.00 ක ප්‍රතිපාදන යටතේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව දිස්ත්‍රික් කාර්යාල 08 ක ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කෙරේ. 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 01.97 කි. භෞතික ප්‍රගතිය 30% කි.

- **ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල වාහන අළුත්වැඩියාව**

වාහන කාර්යක්ෂමව භාවිතයට ගත හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයේ පවතින වාහන අළුත්වැඩියාව සඳහා 281-1-1-0-2003 වැය ශීර්ෂය යටතේ රු.මි. 25.00 ක් වෙන් කරන ලදී 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 13.70කි. භෞතික ප්‍රගතිය 50% කි

දිස්ත්‍රික් කාර්යාලවල පවතින වාහන අළුත්වැඩියාව සඳහා 281-2-2-0-2003 වැය ශීර්ෂය යටතේ රු.මි. 38.00 ක් වෙන් කරන ලද අතර 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 01.94 කි. භෞතික ප්‍රගතිය 10% කි.

- **ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අවශ්‍යතා.**

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් 281-1-1-0-2102 වැය ශීර්ෂය යටතේ රු.මි. 08 ක ප්‍රතිපාදන යටතේ ප්‍රධාන කාර්යාලයේ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අවශ්‍යතා මිලදී ගැනීම සඳහා 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 06.28කි. භෞතික ප්‍රගතිය 78% කි.

දිස්ත්‍රික් කාර්යාලවල ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ අවශ්‍යතා සඳහා 281-2-2-0-2102 වැය ශීර්ෂය යටතේ රු.මි. 15.00 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 03.34 කි. භෞතික ප්‍රගතිය 25% කි.

- **පුහුණු හා හැකියා වර්ධනය**

ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම හා කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් 281-1-1-0-2401 වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි. 10.00 ක ප්‍රතිපාදන යටතේ පුහුණු වැඩසටහන් 07 ක් ක්‍රියාත්මක කරන ලද අතර 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 03.70 කි භෞතික ප්‍රගතිය 30% කි.

- **ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියාව**

ගොවිජන සේවා මධ්‍යස්ථානවල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් සහ පොහොර ගබඩා ධාරිතාවය වැඩි කිරීමේ අරමුණින් 281-2-2-0-2001 වැය ශීර්ෂයෙන් වෙන් කරන ලද රු.මි. 400.00 ක ප්‍රතිපාදන යටතේ ප්‍රධාන කාර්යාලය, ගොවිජන සේවා මධ්‍යස්ථාන හා පොහොර ගබඩා අළුත්වැඩියා කටයුතු 114 ක් ක්‍රියාත්මක කරන ලද අතර 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 69.00 කි. භෞතික ප්‍රගතිය 40% කි

- **යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව හා අත්පත් කර ගැනීම.**

භාවිතයට ගත හැකි කෘෂි යන්ත්‍රෝපකරණ නඩත්තුව හා නව කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා 281-2-2-0-2002 වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද රු. මි. 72.00 ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් කෘෂි යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව කරන ලද අතර 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 6.27 කි. භෞතික ප්‍රගතිය 10% කි. 281-2-2-0-2103 යටතේ වෙන් කරන ලද රු.මි. 08.00 යටතේ නව මිලදී ගැනීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු කර නොමැත.

- **මධ්‍යස්ථාන නව ඉදිකිරීම**

ගොවිජන සේවා මධ්‍යස්ථාන වල සේවය කරන නිලධාරීන්ගේ හා සේවාලාභීන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේ අරමුණින් අරමුණින් 281-2-2-0-2104 වැයශීර්ෂය සඳහා වෙන් කල මුදල රු.මි. 100.00 කි. මේ යටතේ ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කරන අතර 2025.09.30 දිනට වැය කළ මුදල රු.මි. 04.93 කි භෞතික ප්‍රගතිය 30% කි

- **භෝග විවිධාංගීකරණය**

මෙම වැය ශීර්ෂය යටතේ 2025 වර්ෂයේ වෙන්කර ඇති ප්‍රතිපාදන මුදල රු. මි. 50.00 කි. මේ යටතේ සිදුකරන ක්‍රියාකාරකම් වන්නේ තෝරාගත් වැව් 12 ක ජලකළමනාකරණ අධ්‍යනය සඳහා රු.මි. 45.00 ක් හා නුවරඑළිය කිතුල්පාගමුව ඇලේ ජලය බෙදා ගැනිමේ ගැටලුව අධ්‍යනය කර විසඳුම් ලබාදීම සඳහා රු.මි. 05.00 ක් ලබාදීමයි.

- **සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය හා පුරන් කුඹුරු අස්වැද්දීම**

| ක්‍රියාකාරකම | සංශෝධිත ප්‍රතිපාදන මුදල (රු.මි.) | වියදම 2025.09.30 දිනට (රු.මි.) | අතැති බිල් (රු.මි.) | සංශෝධිත භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| අත්හැර දමනු ලැබූ වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහන | 215.00 | 8.35 | 0.00 | වාරි ව්‍යාපෘති 19 | ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරෙමින් පවතී |
| සුළු වාරිමාර්ග සුළු ප්‍රතිසංස්කරණ වැඩසටහන (Kick Start) | 335.00 | 18.41 | 22.61 | ව්‍යාපෘති 820 | ව්‍යාපෘති 386ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. |
| ගංවතුර හානි ප්‍රතිසංස්කරණය | 660.00 | 29.31 | 15.57 | ව්‍යාපෘති 270 | ව්‍යාපෘති 59ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. |
| වැව් හා අමුණු ප්‍රතිසංස්කරණ වැඩසටහන | 660.00 | 41.55 | 27.13 | ව්‍යාපෘති 235 | ව්‍යාපෘති 39ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී |
| ක්ෂුද්‍රවාරි ජල පද්ධති ඇති කිරීම | 15.00 | 0.00 | - | අක්කර 30 | ක්‍රියාත්මක වෙමින් පවතී |

| ක්‍රියාකාරකම | සංශෝධිත ප්‍රතිපාදන මුදල (රු.මි.) | වියදම 2025.09.30 දිනට (රු.මි.) | අතැති බිල් (රු.මි.) | සංශෝධිත භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| කෘෂි මාර්ග අළුත්වැඩියාව | 315.00 | 16.51 | 7.88 | ව්‍යාපෘති 140 | ව්‍යාපෘති 29ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී |
| පැරෂුට් වගාව ප්‍රචලිත කිරීම | 163.00 | 0.00 | - | අක්කර 5805 | ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී |
| වැව් වල මාළු පැටවුන් වගා කිරීම | 2.00 | 0.00 | - | වැව් 80 | ක්‍රියාත්මක වෙමින් පවතී |
| කැවන්ඩිස් කෙසෙල් වගා කිරීමේ වැඩසටහන | 50.00 | 0.00 | - | අක්කර 50 | ක්‍රියාත්මක වෙමින් පවතී |
| එක මිටට ගොවි බිමට වැඩසටහන | 392.50 | 21.33 | 9.00 | | ක්‍රියාත්මක වෙමින් පවතී |
| අතැතිබිල් පියවීම | 220.00 | 198.81 | - | | බිල් පියවා අවසන් |
| බැඳීම් ව්‍යාපෘති | 170.00 | 58.23 | 15.21 | | ව්‍යාපෘති 116ක් වැඩ අවසන් කර ඇත. ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී |
| ව්‍යාපෘති ආධාරක පිරිවැය | 52.50 | 0.20 | - | | |
| ඉතිරිවේ යැයි පුරෝකථනය කර ලද ප්‍රතිපාදන ප්‍රමාණය | 250.00 | - | - | | |
| **එකතුව** | **3,500.00** | **392.70** | **97.40** | | |

ඡායාරූප අංක 34 - 36

## 03. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**3.1. දැක්ම**

කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදනයෙන් විශිෂ්ටත්වය

**3.2. මෙහෙවර හා අරමුණු**

වැඩි විදේශ විනිමයක් ඉපයීමත් අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත සියළු පාර්ශ්වකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජයීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, පරිසරය සුරකෙන අයුරින් අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන්නා වූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**3.3. හැඳින්වීම**

1971 ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය මඟින් ද පසුව 1972 දී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් තුළින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධිතව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. 1975 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට ගෙන එන ලදි. ලෝක ආහාර වැඩසටහන (WFP)සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් මූලාරම්භ කරන ලද බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහනේ කාර්යයන්වල කොටසක් දෙපාර්තමේන්තුවට පැවරීමත් සමඟ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කුළුබඩු ආශ්‍රිත බෝග සංවර්ධනය මත පදනම් වූ අපනයන සංවර්ධනයේ නියමුවා විය.

1992 අංක 46 දරණ පාර්ලිමේන්තු පනතින් මෙම දෙපාර්තමේන්තුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යනුවෙන් නැවත නම් කරන ලදි. එමඟින් කුළුබඩු සහ වෙනත් කෘෂිකාර්මික බෝග අපනයනයට අදාළව නෛතික අධිකාරි බලය දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් ඉලක්ක කරන්නේ ගම්මිරිස්,කරාබු, සාදික්කා,කරදමුංගු,කෝපි, කොකෝවා, බුලත්, පුවක් ,වැනිලා, පැඟිරි, සේර, ගොරකා, ඉඟුරු හා කහ ආදී කුළුබඩු බෝග පානීය භෝග සහ උත්තේජක භෝග අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමයි. මෙහි දී දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ අපනයන කෘෂි බෝග වගා වපසරිය වැඩි කිරීම, පවත්නා වගාවල ඵලදායීතා කටයුතු, පසු අස්වනු තාක්ෂණ ප්‍රවර්ධන වැනි සංවර්ධන කටයුතු හා නව ප්‍රභේද හඳුන්වා දීම, නව තාක්ෂණික දැනුම සහ නවෝත්පාදන අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයට හඳුන්වා දීමයි.

### 3.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01. | ප්‍රාග්ධන වියදම් | 1,579.50 |
| 02. | පුනරාවර්තන වියදම් | 1,230.30 |

### 3.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අඅ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මූළ පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | වගා වපසරිය පුළුල්කිරිම | හෙක්ටයාර් | 2350 | 762.00 |
| 2 | මධ්‍යම පැළ තවාන් සංවර්ධනය කිරිම | ඒකකය | 100 | 51.00 |
| 3 | අපනයන කෘෂි බෝග ඉඩම් ඵලදායිතාවය වැඩි කිරිම | හෙක්ටයාර් / සංඛ්‍යාව | 4075 | 150.00 |
| 4 | බෝග අගයදාම සංවර්ධන වැඩසටහන | ඒකක | 350 | 98.00 |
| 5 | ජනමාධ්‍ය සහ සන්නිවේදනය | වැඩසටහන්/ ඒකක | 200 | 48.00 |
| 6 | ධාරිතා සංවර්ධන වැඩසටහන | වැඩසටහන්/ඒකක | 3500 | 20.00 |
| 7 | පරිපාලන වියදම් | | | 35.00 |
| 8 | ගොඩනැගිලි අළුත්වැඩියාවන් 2001 | ගොඩනැගිලි | 100 | 72.00 |
| 9 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරිම 2002 | යන්ත්‍ර උපකරණ (ගොවිපල, කාර්යාල, විද්‍යාගාර) | 21 | 11.00 |
| 10 | වාහන අළුත්වැඩියාව 2003 | වාහන | 33 | 18.00 |
| 11 | කාර්යාලීය උපකරණ මිලදීගැනිම 2102 | කාර්යාලීය උපකරණ | 182 | 42.00 |
| 12 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම 2103 | උපකරණ (විද්‍යාගාර, කාර්යාල) | 66 | 23.00 |
| 13 | නව ගොඩනැගිලි ඉදිකිරීම් 2104 | ගොඩනැගිලි (නව) | 29 | 140.00 |
| 14 | ඉඩම් සහ ඉඩම් සංවර්ධනය 2105 | සංවර්ධනය කරනු ලබන ඉඩම් | 47 | 47.00 |
| 15 | කාර්ය මණ්ඩල පුහුණු 2401 | පුහුණු වැඩසටහන් | 01 | 2.00 |
| 16 | යටිතල පහසුකම් සංවර්ධනය 2506 | සංවර්ධනය කරනු ලබන යටිතල පහසුකම් | 25 | 40.00 |
| 17 | පර්යේෂණ හා සංවර්ධන2507 | පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා කරනු ලබන මිලදී ගැනීම් | 43 | 20.05 |
| | එකතුව | | | **1,579.05** |

### 3.4. 2025.09.30 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 1,621.00 | 102.62 | 06 |
| 2 | පුනරාවර්තන වියදම් | 1,101.00 | 756.97 | 69 |
| | | | | |
| | සංවර්ධන වැඩසටහන් | | | |
| 1 | අපනයන කෘෂිබෝග සංවර්ධන වැඩසටහන | 1,000.00 | 83.51 | 08 |
| 2 | අපනයන කෘෂි භෝග පර්යේෂණ හා සමෝධානික රෝග පළිබෝධ පාලන / | 10.00 | 1.96 | 20 |
| 3 | වෙනත්(2001,2104,2105,2506,2002,2003,2102, 2103 සහ 2401 වැය විෂයන් සඳහා ) | 361.00 | 17.15 | 05 |

### 3.5. 2025.09.30 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

දෙපාර්තමේන්තුවට අදාළව ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන වැඩසටහන් සඳහා රු.මි. 1,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2025 වර්ෂය සඳහා වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදන වලින් රු.මි. 83.51 මූල්‍ය වියදමක් ළඟා කර ගැනීමට 2025.09.30 තුළදී දෙපාර්තමේන්තුවට හැකි විය. එම වැඩසටහන් මහනුවර, නුවරඑළිය, බදුල්ල, ගම්පහ, කොළඹ, කළුතර, හම්බන්තොට, මාතලේ, මාතර, පොළොන්නරුව, අම්පාර, අනුරාධපුර, රත්නපුර, මොණරාගල, කෑගල්ල, ගාල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්ක ආශ්‍රිතව සිදුකරන ලද අතර සමස්තයක් ලෙස මෙම සංවර්ධන වැඩසටහන් සඳහා 71,973 ක ප්‍රතිලාභීන් සම්බන්ධ වී ඇත.

දෙපාර්තමේන්තුවට අදාළව සමස්ත සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් වෙන් වශයෙන් වෙන් කළ ප්‍රතිපාදන, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

- අපනයන කෘෂිභෝග සංවර්ධන වැඩසටහනේ **2025.09.30** දිනට ප්‍රගතිය

| වැඩසටහන/ ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | | වැය කළ මුදල (රු.මි.) | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | වැඩසටහන් | සහනාධාර | වැඩසටහන් | සහනාධාර | වැඩසටහන් | සහනාධාර |
| **01.** අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන | | | | | | |
| 1.1 අපනයන කෘෂිබෝග නව වගා ප්‍රවර්ධන වැඩසටහන | 103.76 | 168.00 | 13.67 | - | ගම්මිරිස් හෙක්ටයාර් 148.91, කෝපි ඇරබිකා හෙක්ටයාර් 112.04, කොකෝවා හෙක්ටයාර් 14.83, එනසාල් හෙක්ටයාර් 9.41, කහ හෙක්ටයාර් 10.49, කෝපි රොබස්ටා හෙක්ටයාර් 17.59, ඉඟුරු හෙක්ටයාර් 24.68, සාදික්කා හෙක්ටයාර් 12.58, කරාබු හෙක්ටයාර් 11, වැනිලා හෙක්ටයාර් 2.54, පැඟිරි හෙක්ටයාර් 0.7, සේර හෙක්ටයාර් 0.10 ක් වගා කර ඇත. (සම්පූර්ණ හෙක්ටයාර 382.24වගා කර ඇත.) | ගම්මිරිස් හෙක්ටයාර් 3.75, කෝපි ඇරබිකා හෙක්ටයාර් 3.71, කහ හෙක්ටයාර් 44.48, ඉඟුරු හෙක්ටයාර් 61.8, සාදික්කා හෙක්ටයාර් 0.4 ක් වගා කර ඇත. (සම්පූර්ණ හෙක්ටයාර 114.29 වගා කර ඇත.) |
| 1.2 කුඩා පරිමාන වගා ප්‍රවර්ධන වැඩසටහන | 101.08 | - | 16.39 | - | ගම්මිරිස් පැල 438,393, කෝපි ( ඇරබිකා) පැල 39235, කොකෝවා පැල 9130 , එනසාල් 90,237, කෝපි පැල (රොබස්ටා ) 26,643, සාදික්කා පැල 7,297, කරාබු පැල 5646, වැනිලා 35,573, බුලත් (දඬු) 75,635, බුලත් දඬු 4688, ගොරක පැල 13,746 ක් නිකුත් කර ඇත . සම්පූර්ණ පැළ 1,492,448 ක් නිකුත් කර ඇත | - |
| 1.3 අපනයන කෘෂිබෝග ප්‍රවර්ධන වැඩසටහන | 5.06 | - | 0.273 | - | ගම්මිරිස් පැල 6663 කෝපි (රොබස්ටා ) පැල 265 න් නිකුත් කර ඇත සම්පූර්ණ පැළ 6 928ක් නිකුත් කර ඇත | - |
| 1.4 පුවක් වගා ප්‍රවර්ධන වැඩසටහන | 137.81 | 1.18 | 8.68 | | පුවක් 967353 පැල නිකුත් කර ඇත | - |
| 1.5 විශේෂ ව්‍යාපෘති | 2.68 | - | - | - | - | - |
| **02.** අපනයන කෘෂි බෝග සංවර්ධන වැඩසටහන | | | | | | |
| 2.1 බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම | 1.50 | - | 0.29 | - | පුවක් පැළ 40000 සාදික්කා පැළ 6500 මිළදී ගෙන ඇත. | - |
| 2.2 පැළ නිෂ්පාදනය සඳහා යෙදවුම් මිළදී ගැනීම. | 2.20 | - | 5.90 | - | 8*5 පොලිතින් බෑග් 1050500 10*7 පොලිතින් 57500 මිලදි ගෙන ඇත. | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2.3 දැල් ගෘහ, ජල සම්පාදන හා අනෙකුත් පහසුකම් සංවර්ධනය | 8.00 | - | 4.107 | - | බඳුන් මාධ්‍ය ඒකක 400 ක් (කියුබ්) මිලදී ගෙන ඇත. | - |
| 2.4ගොවිබිම් කළමනාකරණය සඳහා යෙදවුම් මිළදී ගැනීම. | 30.53 | - | 0.01 | - | රසායනික පොහොර 74 kg මිලදී ගෙන ඇත - | - |
| 2.5 පෞද්ගලික තවාන් සංවර්ධනය | - | 116.40 | - | - | - | - |
| 2.6 ගොවිපල ඉඩම් කළමණාකරණය සඳහා යෙදවුම් මිලදී ගැනීම. | 3.00 | - | - | | - | - |
| **03. භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන** | | | | | | |
| 3.1 භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන | 16.15 | 58.88 | 0.638 | - | ගම්මිරිස් හෙක්ටයාර් 96.6 කොකෝවා හෙක්ටයාර් 4.4<br>කරාබු හෙක්ටයාර් 1.50 වගා කර ඇත.<br>(සම්පූර්ණ හෙක්ටයාර 107.5 වගා කර ඇත.) | ගම්මිරිස් හෙක්ටයාර් 7.1 කොපිරොබස්ටා හෙක්ටයාර් 1.4 වගා කර ඇත.<br>(සම්පූර්ණ හෙක්ටයාර 8.5වගා කර ඇත.) |
| 3.2 පළිබෝධ හා වගා හානි වැළැක්වීමේ උපාංග පද්ධති ලබා දීමේ වැඩසටහන | - | 10.39 | 0.26 | - | විදුලි වැට 3 දැල් වැට 1<br>(ඒකක 4 සම්පූර්ණ කර ඇත.) | - |
| 3.3 ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරිමේ වැඩසටහන | - | 10.28 | 0.18 | - | ඉසින පද්ධති 02 සම්පූර්ණ කර ඇත. | - |
| 3.4. ශාක ආරක්ෂණ වැඩසටහන | 5.00 | - | - | - | - | |
| **04. යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරිම / සහතිකරණය** | | | | | | |
| 4.1 කාබනික සහ කෘෂි කාර්මික පිළිවෙත් (GAP) කෘෂි ප්‍රමිති සහතිකලත් වගාවන් ප්රවර්ධන වැඩසටහන | - | 4.01 | - | - | - | - |
| 4.2 උචිත තාක්ෂණය භාවිතයෙන් අපනයන කෘෂි බෝග ගුණාත්මය වැඩි දියුණු කිරිම | - | 114.75 | 5.7 | - | ඇඹරුම් යන්ත්‍ර 2 වියලන යන්ත්‍ර 07 ත්‍රෙෂර් යන්ත්‍ර 16 පෙති කපන යන්ත්‍ර 01 සීලර් 01 සැකසුම් මධ්‍යස්ථාන 01 සම්පූර්ණ කර ඇත.<br>(ඒකක 28 ක් සම්පූර්ණ කර ඇත. | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4.3 අලෙවි ප්‍රවර්ධන වැඩසටහන | 5.00 | - | - | - | වැඩ සටහන් 01 පවත්වා ඇත. | - |
| 4.4 යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම / සහතිකරණය | - | 0.55 | - | - | - | . |
| 4.5 පාර්ශ්වකරුවන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන | 5.00 | - | - | - | - | .- |
| **05. අපනයන කෘෂිබෝග ප්‍රවර්ධනය** | | | | | | |
| 5.1 ජනමාධ්‍ය හා ප්‍රදර්ශන හරහා අපනයන කෘෂිබෝග ප්‍රවර්ධනය | 40.00 | - | 12.76 | - | රූපවාහිනී වැඩසටහන් 38. ගුවන් විදුලි වැඩසටහන් 75.වෙනත් වැඩසටහන් 39.ප්‍රදර්ශණ 04.ගම්මිරිස් ප්‍රකාශණ 01.මුද්‍රිත මාධ්‍ය 01. | - |
| **06. අපනයන කෘෂිකාර්මික භෝග පාර්ශ්වකරුවන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන** | | | | | | |
| 6.1 අපනයන කෘෂිකාර්මික භෝග පාර්ශ්වකරුවන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන | 12.77 | - | 4.90 | - | ගොවි පුහුණු වැඩසටහන් 2470 ක් සම්පූර්ණ කර ඇත. ප්‍රතිලාභීන් 62386ක් ක්ෂේත්‍ර වැඩසටහන් 374 ක් පවත්වා ඇත.ප්‍රතිලාභීන් 9587 ක් සහභාගී වී ඇත. | - |
| 6.2 සේවා සංස්කරණ පුහුණු වැඩසටහන් | 5.00 | | 0.263 | | නිලධාරී පුහුණු වැඩසටහන් 37 ක් පවත්වා ඇත. | - |
| 6.3 ඩිජිටල් ව්‍යාපෘති වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම | 1.00 | - | - | - | - | - |

- **අපනයන කෘෂිභෝග සංවර්ධන වැඩසටහනේ සහ අපනයන කෘෂි භෝග පර්යේෂණ හා සමෝධානික රෝග ව්‍යාපෘති පළිබෝධ පාලන ව්‍යාපෘතියේ ( 2001, 2104, 2105, 2506, 2002, 2003, 2102, 2103 සහ 2401 වැය ශීර්ෂයන්ට අදාළව) 2025.09.30 දිනට ප්‍රගතිය**

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම | 7.50 | 1.01 | පරිසනක 03 ප්‍රින්ටර් 01 ප්‍රොජෙක්ටර් 01 ෆොටෝකොපි මැෂින් 01 ජල මෝටර් 01 Desktop 01 Laptop බැට්‍රි 01 වායුසමීකරණ 02 කෝපි පල්පර් 02 අළුත්වැඩියා කිරීම |
| වාහන අළුත්වැඩියාව | 15.00 | 6.76 | වාහන 25 ක් අළුත්වැඩියා කිරීම බැටරි 03 ක් මිළදී ගැනීම |
| කාර්යාලයීය උපකරණ මිලදීගැනීම | 20.00 | 2.27 | පොත් රාක්ක 01 wifi 01 Laptop 09 Desktop 23 කැරකෙන පුටු 20 සිවිලිම් විදුලි පංකා 02 පාද පංකා 11 වොල් පංකා 06 15 ෆයිල් කැබිනට් 01 ගොනු කැබිනට් 11 සම්මන්ත්‍රණ වගු 02 සම්මන්ත්‍රණ පුටු 20 කාර්යාල මේස 20 ආරක්ෂිත කබඩ් 01 UPS 36 කාර්යාල පරිමාණ 01 නිල්ලඹට Laptop 01 වල්පිට Laptop 02 UPS 01 මාතලේට Desktop 02/Laptop 01/UPS 02 දැල්පිටිය සඳහා වානේ අල්මාරි 01 නාරම්මල Desktop 01කුණ්ඩසාලේට Desktop 01 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 7.50 | 0.94 | |
| කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන | 01 | 0.67 | නිලධාරීන් පුහුණු වැඩසටහන් 432 ලබාදී ඇත. |

ඉදිකිරිම් හා අලුත්වැඩියාවන්ට අදාලව2001 වැය ශීර්ෂය යටතේ 47% ක්ද 2104 වැය ශීර්ෂය යටතේ 24% ක්ද 2105 වැය ශීර්ෂය යටතේ 27% ක්ද 2506 වැය ශීර්ෂය යටතේ 33% ක්ද 2507 වැය ශීර්ෂය යටතේ 72% ක්ද වශයෙන් 2025.09.30 දිනට භෞතික ප්‍රගතියක් වාර්තා කර ඇත.

ඡායාරූප අංක 37 - 38

## 04. ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය

වර්ෂ 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික ව්‍යවස්ථා පනතෙහි ප්‍රතිපාදනයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2000 වර්ෂයේ ජූනි 19 වැනි දින පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය පිහිටුවන ලද අතර වර්ෂ 2018.10.27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2093/26 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ආයතනයේ නම ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය ලෙස වෙනස් කරන ලදී. ආයතනයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ කෘෂිකාර්මික බෝගයන්ගේ පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සහ කෘෂි ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පුහුණු, ව්‍යාප්ති, තාක්ෂණික උපදේශක සේවා හා රසායනාගාර සේවා සිදු කිරීමයි.

### 4.1. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් (Vote:118-02-03-073-2201) | 60.00 |
| | ප්‍රාග්ධන වියදම් (අමාත්‍යාංශය හරහා අපේක්ෂිත) | 109.23 |
| 2 | පුනරාවර්තන වියදම් | 188.40 |

### 4.2. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | පර්යේෂණ | පසු අස්වනු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා හඳුනා ගන්නා නව තාක්ෂණයන් | පර්යේෂණ ව්‍යාපාති 14ක් ක්‍රියාත්මක කිරීම හා නව සහ යෝග්‍ය පසු අස්වනු තාක්ෂණයන් හඳුනා ගැනීම | 0.41 | 6.99 |
| 2 | සංවර්ධන ව්‍යාපෘති | | | | |
| 2.1 | ග්‍රාමීය මට්ටමේ සහල් සැකසුම් කර්මාන්ත ඇතිකිරීම | ක්ෂේත්‍රයේ ස්ථාපිත කළ සහල් සැකසුම් ඒකක ගණන | දිවයින පුරා තෝරා ගත් ප්‍රදේශ වල, ගෘහස්ථ මට්ටමේ සහල් සැකසුම් ඒකක 50ක් ස්ථාපිත කිරීම | 0.06 | 2.82 |
| 2.2 | කෘෂි ආශ්‍රිත නව ව්‍යවසායයන් ඇරඹීමේ අරමුණින් සුළු හා මධ්‍ය පරිමාන කෘෂි ව්‍යවසායකයින් සවි බල ගැන්වීම සඳහා මධ්‍යස්ථානයක් (incubation center) ස්ථාපිත කිරීම | incubation center හරහා ස්ථාපිත වූ ව්‍යවසායයන් ගණන | කෘෂි ආශ්‍රිත නව ව්‍යවසායයන් ඇරඹීම සඳහා අපේක්ෂා කරන පුද්ගලයන් හට ඒ සඳහා වෙළඳපල ස්ථාවර වන තෙක් අවශ්‍ය පූර්ව තාක්ෂණික පහසුකම් සැපයීම | 7.65 | 7.65 |
| 2.3 | ගොවීන්ගේ ආදායම් ඉහල නැංවීම සඳහා සහල් බඩඉරිඟු හා ධාන්‍ය වර්ග ගබඩාකිරීමට ගෘහස්ථ ගබඩා වැඩිදියුණු කිරීම | වැඩි දියුණු කරන ලද ගෘහස්ථ ගබඩා ප්‍රමාණය හා ධාන්‍ය ගබඩාකරණයේදී පසු අස්වනු හානිය අවම වූ ප්‍රතිශතය | ධාන්‍ය වර්ග ගබඩාකිරීමට ගෘහස්ථ ගබඩා 100ක් වැඩිදියුණු කිරීම | 0.05 | 5.05 |
| 2.4 | ශ්‍රී ලංකාවේ අඹ, කෙසෙල් හා පැපොල් අගයදාමයන්හි පසු අස්වනු හානිය අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා නිවැරදි ඉදවීමේ ක්‍රම හඳුන්වා දීම | ස්ථාපිත කළ නිවැරදි හා සුරක්ෂිත ඉදවීමේ ඒකක සංඛ්‍යාව | පලතුරු ගොවීන්, එක් රැස් කරන්නන් හා වෙළඳුන් සඳහා නිවැරදි හා සුරක්ෂිත ඉදවීමේ ඒකක 30ක් ස්ථාපිත කිරීම | 0.29 | 8.65 |
| 2.5 | එළවළු පලතුරු ප්‍රවාහනයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සුරක්ෂිතක ඇසුරුම් හඳුන්වා දීම | සැපයුම් දාමයන්ට හඳුන්වා දුන් ඇසුරුම් ප්‍රමාණය හා ප්‍රමාණය හා කෘෂි බෝගයන්ගේ පසු අස්වනු හානිය අවම වූ ප්‍රතිශතය | සැපයුම් දාම පාර්ශ්වකරුවන් වෙත සුරක්ෂිත ඇසුරුම් 29000ක් ලබා දීම (වර්ග 2කින්), | 0.002 | 67.62 |
| 2.6 | ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් හඳුන්වාදීම | ක්ෂේත්‍රයේ ස්ථාපිත කළ කුළුබඩු ආශ්‍රිත ව්‍යවසායයන් ප්‍රමාණය | කුළුබඩු සැකසීමේ ඒකක 10ක් ස්ථාපිත කිරීම | 0.27 | 2.74 |
| 2.7 | කෘෂි බෝගයන්ගේ නිවැරදි පසු අස්වනු | පවත්වන ලද දැනුවත් | රාජ්‍ය නිළධාරීන් සහ | 0.002 | 3.20 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| | කළමනාකරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම | කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව, දැනුවත් වූ පුද්ගලයින් සංඛ්‍යාව | පළාත්පාලන ආයතන නියෝජිතයින් සහ කෘෂි ව්‍යවසායකයින් 1500ක් දැනුවත් කිරීම | | |
| 2.8 | කෘෂි සැපයුම් දාමයේ පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම සඳහා දිවයිනේ එක් එක් ප්‍රදේශවල විභවය පදනම් කොට ගත් පසු අස්වනු සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම | ක්ෂේත්‍රයේ ස්ථාපිත කළ නිවැරදි පසු අස්වනු තාක්ෂණයන් ගණන හා කෘෂි ආශ්‍රිත ව්‍යවසායයන් ප්‍රමාණය | එක් එක් ප්‍රදේශයේ විභවය මත පසු අස්වනු සැකසුම් ඒකක 10 ස්ථාපිත කිරීම | 0.45 | 4.50 |
| 2.9 | එළවළු පරිහරනය සඳහා නුවර එළිය දිස්ත්‍රික්කයේ ශීත දාමයක් ස්ථාපිත කිරීම | ශීත දාමය ස්ථාපිත කිරීම | එළවළු සැපයුම් දාමය සඳහා නුවර එළිය දිස්ත්‍රික්කයේ ශීත දාම කළමනාකරණය භාවිතය | 7.00 | 7.00 |

### 4.3. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 33.00 | 8.30 | 25 |
| 2 | පුනරාවර්තන වියදම් | 164.18 | 113.26 | 69 |
| | | | | |
| | සංවර්ධන වැඩසටහන් | 26.20 | 4.80 | 18 |

### 4.4. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

- **පර්යේෂණ ව්‍යාපාතීන් වල ප්‍රගතිය** (වැය විෂය -118-02-03-073-2201)

පසු අස්වනු හානිය අවම කිරීම, ආහාර සැකසීම හා අගය එකතු කිරීම සහ සුරක්ෂිත ආහා සහ පෝෂණය යන ප්‍රධාන තේමා 3 යටතේ 2025 වර්ෂයේ දී පර්යේෂණ ව්‍යාපෘතීන් 15 ක් මේ වන විට ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා වෙන් කළ මුදල රු. මි. 11.23 කි. 2025.09.30 වන විට වියදම රු. මි. 5.01 කි.

- **සංවර්ධන ව්‍යාපාතීන් වල ප්‍රගතිය (වැය විෂය -118-02-03-083-2506)**

**i.) ග්‍රාමීයව ගෘහස්ථ මට්ටමේ සහල් සැකසුම් කර්මාන්ත ඇති කිරීම**

ගොවියා සිය වී අස්වැන්න අලෙවි නොකර ඒ සඳහා අගය එකතු කිරීමක් කොට සහල් ලෙස වෙළඳ පලට එක් කිරීම මඟින් ඔහුගේ ආර්ථිකය සවිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ මේ යටතේ දිස්ත්‍රික්ක 7 ක සහල් සැකසුම් ඒකක 87 ක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. 2025.09.30 වන විට, නිවැරදි ලෙස සහල් සැකසීම පිළිබඳව ප්‍රතිලාභින් 507ක් පුහුණු කළ අතර ඒකක 47 ක් ස්ථාපිත කොට ඇත.

මෙම වැඩසටහන සඳහා වෙන් කළ මුදල රු.මි.5.92 කි. 2025.09.30 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 2.43 කි.

**ii.) ගොවීන්ගේ ආදායම් ඉහල නැංවීම සඳහා සහල් බඩඉරිඟු හා ධාන්‍ය වර්ග ගබඩාකිරීමට ගෘහස්ථ ගබඩා වැඩිදියුණු**

ධාන්‍ය ගබඩාකරණයේදී සිදු වන පසු අස්වනු හානිය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු. මි. 5.05කි. මේ යටතේ දිස්ත්‍රික්ක 7 ක ගෘහස්ථ ගබඩා 108 ක් වැඩි දියුණු කිරීමට අපේක්ෂිතය. 2025.09.30 වන විට, නිවැරදි ගබඩාකරණය පිළිබඳවගොවීන් 545 ක් පුහුණු කළ අතර ඒකක 43 ක් වැඩිදියුණු කර ඇත. වියදම් කර ඇති මුදල රු .මි. 1.59 කි.

**iii.) ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් හඳුන්වා දීම**

ග්‍රාමීය මට්ටමේ කුළුබඩු සැකසීමේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් බිහිකිරීමේ අරමුණින් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි.1.71 කි. 2025.09.30 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 0.10 කි. අතැති බිල්පත් වල වටිනාකම රු. මි. 1.44 කි. ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභින් 425 ක් කුළුබඩු සැකසීම පිළබඳව පුහුණු කොට ඇත.

**iv.) කෘෂි සැපයුම් දාමයේ පාර්ශ්වකරුවන් සවිබල ගැන්වීම සඳහා දිවයිනේ එක් එක් ප්‍රදේශ වල විභවය පදනම් කොට ගත් පසු අස්වනු සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම**

මෙම ව්‍යාපෘතිය මඟින් එක් එක් පෙදෙස් වල වැවෙන බෝග හා ඒ පෙදෙස්වල පවතින වෙළඳපල විභවය අධ්‍යයනය කොට කෘෂි ආශ්‍රිත ව්‍යවසායකයින් 10 ක් සවිබල ගැන්වීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි. 2.50 කි. 2025.09.30 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 0.35 කි. අදාළ උපකරණ මිළදී ගැනීම සිදු කෙරෙමින් පවතී. ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභින් 574 විවිධ කෘෂි ආශ්‍රිත කර්මාන්ත සඳහා පුහුණු කොට ඇත.

**v.) කෘෂි බෝගයන්ගේ නිවැරදි පසු අස්වනු කළමනාකරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා අගය එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

මෙම ව්‍යාපෘතිය මඟින් දිවයින පුරා රාජ්‍ය නිළධාරීන් සහ පළාත්පාලන ආයතන නියෝජිතයින් සහ කෘෂි ව්‍යවසායකයින් 1,000 ක් දැනුවත් කිරීමට හා කෘෂි ආශ්‍රිත නිෂ් පාදන ඒකක 4ක් ස්ථාපිත කිරීමට අපේක්ෂිත අතර 'අස්වැන්නට අරුනැල්ලක්' ලෙස මෙම වැඩසටහන් මාලාව දියත් කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි. 4.12 කි. 2025.09.30 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 0.22 කි. අදාළ උපකරණ මිලදී ගැනීම සිදු කෙරෙමින් පවතී. ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභින් 714 ක් පසු අස්වනු තාක්ෂණය පිළිබඳව දැනුවත් කොට ඇත.

**vi.) නියමු ව්‍යාපෘතියක් ලෙස එළවළු පලතුරු සඳහා ශීත දාමයක් ස්ථාපිත කිරීම**

මෙම ව්‍යාපෘතිය මඟින් නුවර එළිය හා අනුරාධපුර දිස්ත්‍රික්කයන් කේන්ද්‍ර කොට ගෙන අධ්‍යයනයක් සිදු කරන ලදී. සැපයුම් දාම පාර්ශ්වකරුවන් 69 ක් සමඟ සාකච්ඡා කොට ගැටළු හඳුනා ගෙන ඇත. ඇසුරුම් මිළදී ගැනීම හා සේදුම් ඒකක ස්ථාපිත කිරීමට අවශය කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි. 1.00 කි. 2025.09.30 වන විට වියදම් කර ඇති මුදල රු .මි. 0.11 කි.

**vii.) එළවළු පලතුරු ප්‍රවාහනයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කිරීම සඳහා සුරක්ෂිතක ඇසුරුම් හඳුන්වා දීම**

එළවළු පලතුරු පසු අස්වනු හානිය වැඩි වශයෙන් සිදු වන්නේ ප්‍රවාහනයේදීය. මෙම හානිය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල රු.මි. 5.90 කි.

ව්‍යාපෘතිය අනුමත වූයේ 2025 සැප්තැම්බර් මස බැවින් මේ දක්වා වියදමක් සිදු වී නොමැත. ඇසුරුම් මිළදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය ආරම්භ කර ඇත.

- **පුනරාවර්ථන වියදම් (වැය විෂය - 118-02-03-073-1509) යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය**

**i.) තාක්ෂණ ප්‍රචාරණ කටයුතු**

නිවැරදි පසු අස්වනු තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලා (නේවාසික හා ක්ෂේත්‍ර වැඩසටහන් ලෙස) 100 ක් පැවැත්වීම හරහා ප්‍රතිලාභීන් 2,000 ක් පුහුණු කිරීම,ඉලක්ක කොට ගෙන සිදු වන තාක්ෂණ ප්‍රචාරණ කටයුතු හරහා නේවාසික හා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 97 ක් පවත්වා පුද්ගලයින් 1754 ක් පුහුණු කොට ඇත.

**ii.) උපදේශක සේවා, ඉංජිනේරු සේවා හා විද්‍යාගාර සේවා**

පසු අස්වනු සැකසුම් යන්ත්‍ර භාවිතය හා නඩත්තු කිරිම හා එම තාක්ෂණයට අදාළව උපදේශක සේවා 20 ක් මේ දක්වා ලබා දී ඇති අතර රසායනාගාර අංශය මඟින් ආහාර නියැදින් 1,487ක් විශ්ලේෂණය කොට වාර්තා අදාළ පාර්ශ්වයන් වෙත ලබා දී ඇත.

ඡායාරූප අංක 39 - 41

## 05. හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI)

### 5.1. හැඳින්වීම

හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI) 1972 අංක 05 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද කෘෂිකර්ම අමාත්‍යංශයට අනුබද්ධිත ව්‍යවස්ථාපිත ආයතනයකි. ගොවිකටයුතු සහ ග්‍රාම සංවර්ධනයට අදාළ සමාජ ආර්ථික පර්යේෂණ සිදුකිරීම සහ එම පර්යේෂණයන්හි සොයා ගැනීම්, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත යොමු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරයකි. HARTI යනු සමාජ ආර්ථික හා ග්‍රාමීය සංවර්ධනයේ කෘෂිකාර්මික පැතිකඩන් පිළිබඳ විමර්ශනය කිරීමට එහි බලය මත පමණක් කටයුතු කරන එකම ආයතනය වේ. එම භූමිකාවෙහිදී, වසර 52ක ඉතිහාසය පුරා, එය රාජ්‍ය, පුද්ගලික සහ පුරවැසි හිතවතුන්, පර්යේෂකයන් සහ පොදු ජනතාව වෙනුවෙන් එහි අවධානයේ සීමාවන් තුළ උසස් තත්ත්වයේ දත්ත හා තොරතුරු ලබා දීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. වැඩමුළු සංවිධානය කිරීම තුළින් සියලුම පාර්ශ්වකරුවන්ට පර්යේෂණවල සොයා ගැනීම් හුවමාරු කිරීම සඳහා පහසුකම් සැපයීම අනෙකුත් ක්‍රියාකාරකම් අතර වේ. එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව සංවිධානය කෙරෙන පුහුණු වැඩසටහන් තුළින් ආකල්ප සංවර්ධනය, ගොවීන්, නිලධාරීන් සහ වෙළෙඳුන් ඇතුළු අනෙකුත් පාර්ශවයන්ගේ කුසලතා සහ දැනුවත්භාවය ඉහළ නැංවීම අප ආයතනයෙන් ඉටු කෙරෙන තවත් වැදගත් කාර්යභාරයන් වේ.

### 5.2. දැක්ම

තිරසාර ගොවිජන හා ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය කර බෙදාහැරීමේ ප්‍රමුඛයා වීම.

### 5.3. මෙහෙවර

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම.

### 5.4. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 269.22 |
| 2 | ප්‍රාග්ධන වියදම් | 55.57 |

### 5.5. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්ක | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1. | ගොවිජන සහ ග්‍රාමීය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි පර්යේෂණ පැවැත්වීම (අදාළ ක්ෂේත්‍ර හඳුනා ගනිමින් මේ වන විට සැලසුම් සකස් කරමින් පවතී). | පර්යේෂණ වාර්තා | 100% | - | 20.10 |
| 2. | අධ්‍යාපන හා පුහුණු | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 100% | - | 8.50 |
| 3. | තොරතුරු සහ සංනිවේදනය | | 100% | - | 5.10 |
| 4. | පර්යේෂණ පුහුණු කටයුතු සඳහා සම්පත් | | 100% | - | 1.80 |
| | **එකතුව** | | | | **35.50** |

### 5.6. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/ අ | වැඩසටහන | 2025 වර්ෂයට වෙන් කල මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 276.80 | 174.40 | 63 |
| 2 | ප්‍රාග්ධන වියදම් | 38.00 | 13.75 | 36.2 |
| | බාහිර අරමුදල් ඇති ව්‍යාපෘති | | | |
| 1 | කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කාන්තා ව්‍යවසායකයින් අතර ධාරිතා වර්ධනය සහ ජාලකරණය තුළින් ව්‍යාපාරික අවස්ථා සහ කර්මාන්ත සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම(DevPro) | 3.14 | 2.36 | 75 |
| 2 | ශ්‍රී ලංකාවේ තිරසාර සියල්ල ඇතුළත් ග්‍රාමීය සංවර්ධනය සඳහා කාන්තා සහ තරුණ සවිබල ගැන්වීමේ වැඩසටහන පිළිබඳ ව්‍යාපෘතිය: පහළ සිට ඉහළට ප්‍රවේශය (ආසියාව සහ පැසිෆික් ප්‍රදේශය සඳහා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය) | 1.5 | 1.13 | 75 |
| 3 | හොඳ තත්ත්වයේ බීජ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, තත්ත්ව සහතික කිරීම සහ අලෙවිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම (ආහාර හා කෘෂිකර්ම සංවිධානය) | 7.52 | 4.67 | 62 |
| 4 | ශ්‍රී ලංකාවේ තෝරාගත් කලාපවල කෙසෙල්, අඹ සහ අන්නාසි වැනි පලතුරු බෝග සඳහා වටිනාකම් දාම ශක්තිමත් කිරීම පිළිබඳ යාවත්කාලීන කරන ලද මූලික අධ්‍යයනය. (ආහාර හා කෘෂිකර්ම සංවිධානය) | 6.57 | 1.96 | 30 |

පර්යේෂණ අධ්‍යයන සහ පුහුණු වැඩසටහන් ලැයිස්තුව සහ එහි ප්‍රගතිය 5.7 සහ 5.8 වගුවල දක්වා තිබේ.

## 5.7. පර්යේෂණ අධ්‍යයන

| අ/ අ | ව්‍යාපෘතිය | මූල්‍ය (රු.මි.) | | භෞතික (%) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | ඉලක්ක | ප්‍රගතිය |
| 1 | ශ්‍රී ලංකාවේ රනිල කුලයට අයත් බෝග නිෂ්පාදනය සහ අලෙවිකරණයේ ප්‍රවණතා සහ අභියෝග: අගය දාම විශ්ලේෂණය | 2.00 | 1.60 | 60 | 40 |
| 2 | ශ්‍රී ලංකාවේ එළවළු වගාවේ පරිසර හිතකාමී පළිබෝධ කළමනාකරණය: අනුවර්තනය, අභියෝග සහ විභවයන් | 1.50 | 1.03 | 100 | 50 |
| 3 | උඩරට එළවළු වගාවේ පාංශු පෝෂණ කළමනාකරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමේ විභවයන් සහ බාධක | 1.50 | 0.46 | 100 | 40 |
| 4 | ශ්‍රී ලංකාවේ ගොවිජන ප්‍රජාවන් අතර ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා දේශගුණික පාලනය: ප්‍රතිපත්ති, රාමු සහ ආයතනික සැකසුම පිළිබඳ සමාලෝචනයක්. | 0.50 | 0.05 | 100 | 40 |
| 5 | තිරසාර නිෂ්පාදනය සඳහා පශු සම්පත් ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීම: ආයතනික රාමු, සේවා කාර්යයන් සහ ධාරිතා සංවර්ධන උපාය මාර්ග විශ්ලේෂණය කිරීම. | 1.90 | 0.86 | 100 | 40 |
| 6 | ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයනික කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය සඳහා වන ආනයන බදු පිළිබඳ සමාලෝචනය. | 1.00 | 0.08 | 100 | 35 |
| 7 | ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කාන්තාවන් සවිබල ගැන්වීම කෙරෙහි කාන්තා සංවිධානවල බලපෑම: සීමාවන්, අවස්ථා සහ උපාය මාර්ග | 1.70 | 0.60 | 100 | 40 |
| 8 | සෞඛ්‍ය සම්පන්න (CoHD) ආහාර වේලක පිරිවැය සහ දැරිය හැකි මට්ටම් විශ්ලේෂණය: ශ්‍රී ලංකාව | 0.72 | 0.14 | 65 | 45 |
| 9 | ශ්‍රී ලංකාවේ ආරක්ෂිත කෘෂිකර්මාන්තය: තත්ත්වය, අභියෝග සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් | 2.30 | 0.37 | 100 | 35 |
| 10 | ශ්‍රී ලංකාවේ වී මෝල් හිමියන්ගේ සංගණනය | 4.45 | 4.42 | 100 | 100 |
| 11 | ගොවීන්ගේ සංජානනය සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) තාක්ෂණයන් අනුගමනය කිරීම. | 0.95 | 0 | 100 | 30 |
| 12 | තෝරාගත් දිස්ත්‍රික්කවලට වායු රයිෆල් සැපයීමේ තිරසාරභාවය ඇගයීම. | 1.78 | 0 | 100 | 35 |

## 5.8. 2025 වර්ෂය සඳහා පුහුණු වැඩටහන්

| | පුහුණු වැඩටහන් | මූල්‍ය (රු.මි.) | | භෞතික (%) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ප්‍රගතිය | ඉලක්ක | ප්‍රගතිය |
| 1 | ගොවි සංවිධාන ශක්තිමත් කිරීම | 2.00 | 1.50 | 100 | 80 |
| 2 | පොල් අංශය වැඩිදියුණු කිරීම සඳහා වන පියවර පිළිබඳ වැඩමුළුව | 0.40 | 0.27 | 100 | 80 |
| 3 | කෘෂි සංචාරක කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන | 1.50 | 0.09 | 100 | 40 |
| 4 | "ග්‍රාමීය තරුණ තරුණියන් කෘෂි ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය වීමට පෙළඹවීම" යන මැයෙන් තෙදින නේවාසික පුහුණු වැඩසටහනක් | 1.50 | - | 100 | - |
| 5 | වීඩියෝ වාර්තා චිත්‍රපට | 1.60 | 0.31 | 100 | 40 |

## 5.9. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

2025 වසරේදී ගොවිජන අංශයේ විවිධ අංශ ඉලක්ක කර ගනිමින් අයවැය ප්‍රතිපාදන යොදා ගනිමින් පර්යේෂණ අධ්‍යයන 12 ක් ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනයන් ග්‍රාමීය සංවර්ධනය ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහ තිරසාර කෘෂිකර්මාන්තය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මාතෘකා කිහිපයක් යටතේ ක්‍රියාත්මක විය.

**ග්‍රාමීය අංශ සංවර්ධනය:** ග්‍රාමීය ආර්ථිකය තුළ සංවර්ධනය විය යුතු අංශ ගවේෂණය කිරීම සඳහා අධ්‍යයන දෙකක් දියත් කරන ලදී - තිරසාර නිෂ්පාදනය සඳහා පශු සම්පත් ව්‍යාප්ති සේවා ශක්තිමත්

කිරීම: ආයතනික රාමු, සේවා කාර්යයන් සහ ධාරිතා සංවර්ධන උපාය මාර්ග විශ්ලේෂණය කිරීම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කාන්තාවන් සවිබල ගැන්වීම කෙරෙහි කාන්තා සංවිධානවල බලපෑම: සීමාවන්, අවස්ථා සහ උපාය මාර්ග. 2025 සැප්තැම්බර් අවසානය වන විට, අධ්‍යයනයන් 40% භෞතික ප්‍රගතියක් ලබා ඇත.

**ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව**: ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල් මුහුණ දෙන අභියෝගයක් වන ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම ආර්ථික සැලසුම් වල මූලික අරමුණකි. මෙකී අංශය ඉලක්ක කර ගනිමින් ප්‍රතිපත්ති නිර්දේශ සැපයීම සඳහා, අධ්‍යයන තුනක් 2024 දී ආරම්භ කරන ලදී. පළමුවැන්න, ශ්‍රී ලංකාවේ රනිල කුලයට අයත් බෝග නිෂ්පාදනය සහ අලෙවිකරණයේ ප්‍රවණතා සහ අභියෝග කෙරෙහි අවධානය යොමුවිය. දෙවනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයනික කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය සඳහා වන ආනයන බදු පිළිබඳ සමාලෝචනය කෙරෙහි යොමුවිය. සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක පිරිවැය සහ ලබාගැනීමේ හැකියාව විශ්ලේෂණය ආහාර සුරක්ෂිතතාව පිළිබඳ තීරණ ගැනීමේදී ඉතා වැදගත් වන්නකි. මෙම අධ්‍යයනවල භෞතික ප්‍රගතිය පිළිවෙලින් 40%, 35% සහ 45% ක් වේ.

**තිරසර කෘෂිකර්මාන්තය**: තිරසර කෘෂිකාර්මික පිළිවෙත් ඉහළ නැංවීම අරමුණු කරගනිමින් අධ්‍යයනහතරකට 2025 දී ප්‍රමුඛත්වය දී ඇත. ශ්‍රී ලංකාවේ එළවළු වගාවේ පරිසර හිතකාමී පළිබෝධ කළමනාකරණය: අනුවර්තනය, අභියෝග සහ විභවයන් කෙරෙහි අවධානය යොමු කර ඇති මෙම අධ්‍යනයෙන් 50%ක භෞතික ප්‍රගතියක් ලබා ඇත. උඩරට එළවළු වගාවේ පාංශු පෝෂණ කළමනාකරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමේ විභවයන් සහ බාධක යන අධ්‍යනය සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂිත කෘෂිකර්මාන්තය: තත්ත්වය, අභියෝග සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් මෙන්ම යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) තාක්ෂණයන් අනුගමනය කිරීම කෙරෙහි ගොවීන්ගේ සංජානනය කෙරෙහිද මෙම වසරේදී අවධානය යොමුවිය.

දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය: දේශගුණික සුහුරු කෘෂිකාර්මික විසඳුම් ක්‍රියාවට නැංවීම අරමුණු කරගනිමින් ගොවිජන ප්‍රජාවන් අතර ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා දේශගුණික පාලනය: ප්‍රතිපත්ති, රාමු සහ ආයතනික සැකසුම පිළිබඳ සමාලෝචනයක් කෙරෙහි අවධානය යොමු විය. 2025 සැප්තැම්බර් අවසානය වන විට මෙම අධ්‍යයනය 40% භෞතික ප්‍රගතියක් ලබා ඇත.

යාවත් කාලීන නිවැරදි තොරතුරු ලබා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ වී මෝල් පිළිබඳ සංගණනය මෙම වසර තුළ සිදුකළ අතර එය 100% භෞතික ප්‍රගතියක් ලබා ඇත.

වෙළඳපොළ තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ ව්‍යාපෘතිය- කෘෂිකාර්මික වෙළඳපල තොරතුරු, විශේෂයෙන් ආහාර ද්‍රව්‍ය මිල ගණන් එකතු කිරීම, සම්පාදනය කිරීම සහ බෙදා හැරීම, එම කාල සීමාව තුළ එහි 100%ක භෞතික ප්‍රගතියක් වාර්තා විය. දිනපතා සහ සතිපතා ආහාරද්‍රව්‍ය විවරණිකා (සිංහල හා ඉංග්‍රීසි) අඛන්ඩව ප්‍රකාශයට පත් විය.

2025 දී සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයන් බහුවිධ ක්ෂේත්‍ර හරහා සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ඒවා ග්‍රාමීය සංවර්ධනය, ආහාර සුරක්ෂිතතාව, වටිනාකම් දාමය සහ තිරසාර කෘෂිකාර්මික භාවිතයන් යන පුළුල් අරමුණු සමඟ පෙළගැසී ඇති අතර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ අනාගත සංවර්ධනය සඳහා අත්‍යවශ්‍යය ප්‍රතිපත්ති නිර්දේශ ලබා දෙනු ඇත. මෙම සියලු අධ්‍යයනයන් වාර්තාවේ සහ ප්‍රතිපත්ති සංෂිප්තයේ පළමු කෙටුම්පත 2025 දෙසැම්බර් 31 වන දිනට නිම කිරීම ආයතනයේ ඉලක්කයයි.

**පුහුණු වැඩසටහන් - 2025**

2025 වර්ෂය සඳහා පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් සංඛ්‍යාව තුනකි. ඉන් ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවි ගොවිජන බලප්‍රදේශ ආශ්‍රිත සංවිධාන ශක්තිමත් කිරීමේ එක් දින පුහුණු වැඩ සටහන සඳහා රු. මි. 2.00 ක් වෙන් කරනු ලැබූ අතර දිස්ත්‍රික්කයේ ගොවිජන බලප්‍රදේශ 30 ක් තුළ වැඩසටහන් 30ක් පැවැත්වෙනු ඇත. ඒ යටතේ දැනට පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 20 කි. ඒ සඳහා සහභාගී වූ ගොවි සංවිධාන නියෝජිතයින් සහ කෘ.ප.නි.ස. නිලධාරීන් සංඛ්‍යාව 1116කි. කෘෂි සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා රු.මි. 1.50 ක් වෙන්ව ඇති අතර ඒ යටතේ මේ වනවිට හම්බන්තොට දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන් ද ඇතුළුව දැනටමත් කෘෂි සංචාරක ව්‍යාපාරයේ නියුතු සහ ඒ සඳහා රුචිකත්වයක් සහිත තරුණයන්ද ඇතුළු 75 ක් සහභාගී විය. වැඩසටහන හම්බන්තොට දිස්ත්‍රික් අන්තර් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් සංවිධානය කරන ලදී.

**2025 ප්‍රකාශන**: ආයතනය මේ වසරේ මේ දක්වා පර්යේෂණ වාර්තා හතක් ප්‍රකාශයට පත් කර ඇත. මීට අමතරව, "ගොවිජනතා" සිංහල සඟරාවේ කලාප තුනක් (වෙළුම 27, අංක 1-2 සහ සංවත්සර කලාපය) මෙන්ම ජාතික අලුත් සහල් මංගල්‍යය 2025 සඳහා විශේෂ ප්‍රකාශනයක් ද පළ විය. පාරිසරික ගොවිතැන පිළිබඳ සිංහල පොත් පිංච වසර තුළ නිකුත් කරන ලදී. තවද, ආයතනය වාර්තා චිත්‍රපට 51 සහ කෙටි වාර්තා චිත්‍රපට 234ක් නිෂ්පාදනය කරමින් සිය දැනුම ව්‍යාප්ත කිරීමේ උත්සාහයන් පුළුල් කළේය. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් SMEs අත්පොත සහ SMEs සඟරාවෙහි කලාප පහක් ප්‍රකාශයට පත්කරන ලදි. ශ්‍රී ලාංකිකයින්ට නවතම පුවත් සහ කෘෂිකාර්මික තාක්ෂණයන් වෙත ප්‍රවේශය ලබාදෙමින් ගොවිමිණ වෙබ් අඩවිය අඛණ්ඩව ක්‍රියාත්මක විය.

ඡායාරූප අංක 42 - 43

## 06. වී අලෙවි මණ්ඩලය (PMB)

### 6.1. දැක්ම

වී සහ සහල් මිලට ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අලෙවි කිරීම පිළිබඳ ප්‍රමුඛ රාජ්‍ය මැදිහත්කරු වශයෙන් කටයුතු කිරීම.

### 6.2. මෙහෙවර

නිෂ්පාදකයා හා පාරිභෝගිකයා යන දෙපාර්ශවයම තෘප්තිමත් වන අයුරින් වී සහ සහල් මිලට ගැනීමේ, ගබඩා කිරීමේ, සැකසීමේ හා අලෙවි කිරීමේ ක්‍රියාවලිය දැනුමෙන් හා කුසලතාවයෙන් පරිපූර්ණ වූ කාර්යය මණ්ඩලයක් තුලින් සාර්ථකව ඉටු කිරීම.

### 6.3. වැඩසටහන/ ව්‍යාපෘතිය පිළිබඳ කෙටි හැඳින්වීම

i) සහතික මිලට වී මිලදී ගැනීම
ii) වී මිලදී ගැනීම සඳහා හා මිලදී ගත් වී තොග සුරක්ෂිතව රැස් කර තබා ගැනීම සඳහා අවශ්‍ය ගබඩා ඉඩ පහසුකම් ඇති කර ගැනීම
iii) මිලදී ගත් වී තොග සහල්කර වෙළෙඳපොළට නිකුත් කිරීම

### 6.4. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | වී මිලදී ගැනීම - මහ හා යල කන්නය<br>මෙ.ටො. 80,000 x රු. 125 | 10,000.00 |
| 2 | ප්‍රාග්ධන වියදම්<br>ගබඩා නවීකරණය කිරීම<br>වී වියලීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම<br>සයිලෝ ඉදි කිරීම | <br>150.00<br>100.00<br>250.00 |
| 3 | පුනරාවර්තන වියදම් | 347.00 |
| 4 | හිමිකම් දායකත්වය - පැරණි ඔඩපන ණය කාලීන ණයක් ලෙස වාර්ක වශයෙන් ගෙවීම | 2,697.50 |

### 6.5. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු. මි.) | මුලු පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|---|
| 1 | වී මිලදී ගැනීම - 2025/26 මහ කන්නය<br>2026 යල කන්නය | කිලෝ ග්‍රෑම්<br>කිලෝ ග්‍රෑම් | 40,000,000<br>40,000,000 | රු. 125.00<br>රු. 125.00 | 5,000<br>5,000 |
| 2 | ප්‍රාග්ධන වියදම්<br>ගබඩා නවීකරණය කිරීම<br>වී වියලීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම<br>සයිලෝ ඉදි කිරීම | <br>ගබඩා ගණන<br>මධ්‍යස්ථාන ගණන<br>ගොඩනැගිලි ගණන | <br>100<br>5<br>5 | <br>1.50<br>20.00<br>50.00 | <br>150.0<br>100.0<br>250.0 |

### 6.6. 2025 වර්ෂයේ තුනවන කාර්තුව අවසානය වන විට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දක්වා)

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | **ප්‍රාග්ධන වියදම්**<br>118-02-03-020-2202<br>ආහාර සුරක්ෂිතතාවය හා තාක්ෂණය වැඩසටහන<br>ගබඩා අලුත්වැඩියා කිරීම - දෙවන අදියර<br>ගබඩා අලුත්වැඩිය කිරීම - තෙවන අදියර<br><br>118-02-03-094-2509<br>ගබඩා නවීකරණය කිරීම - හතරවන අදියර<br>ගබඩා සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම<br>වී වියලීමේ මධ්‍යස්ථාන ඇති කිරීම<br>වෙබ් පිටුව හා තොරතුරු පද්ධතිය දියුණු කිරීම<br>ස්ථාවර වත්කම් මිලදී ගැනීම<br>පුහුණුව හා සංවර්ධනය<br>පරිපාලන වියදම් | <br><br><br>9.90<br>5.80<br><br><br>151.50<br>4.00<br>20.00<br>2.00<br>7.50<br>2.00<br>4.50 | <br><br><br>9.90<br>-<br><br><br>-<br>1.70<br>-<br>-<br>-<br>0.20<br>- | <br><br><br>100<br>-<br><br><br>-<br>43<br>-<br>-<br>-<br>10<br>- |
| 2 | පුනරාවර්තන වියදම් | 185.00 | 153.4 | 83 |
| 3 | හිමිකම් දායකත්වය<br>මහජන බැංකුව හා ලංකා බැංකුව මඟින් ලබාගත් | 2,697.50 | 2,071.9 | 77 |

| අ/ අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| | ඔඩපන ණය කාලීන ණයක් ලෙස වාරික වශයෙන් ගෙවීම | | | |
| **සංවර්ධන වැඩසටහන්** | | | | |
| 1 | වී මිලදී ගැනීම, 2024/25 මහ කන්නය මෙහෙයුම් වියදම් | 300.00 | 8.07 | 3 |
| | - 2025 යල කන්නය අතිරේක ප්‍රතිපාදන සහ මෙහෙයුම් වියදම් | 6,008.50 | 5,987.10 | 99 |

## 6.7. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානයට ආයතනයේ වැඩසටහන්වල භෞතික ප්‍රගතිය (2025.09.30 දක්වා)

| ක්‍රියාත්මක සැලැස්ම අනුව ඉලක්ක ගත ක්‍රියාකාරකම් | ව්‍යාපෘතිය /වැඩසටහන යටතේ ලබාදීමට අපේක්ෂිත වැඩ / සේවා සහ භෞතික ප්‍රගතිය |
|---|---|
| ප්‍රාග්ධන වියදම් | |
| (i) ගබඩා නවීකරණය කිරීම - දෙවන අදියර | ගබඩා 40 ක් නවීකරණය කිරීමට සැලසුම් කල අතර, ගබඩා 36 ක් නවීකරණය කර අවසන්ව ඇත. |
| (ii) - තෙවන අදියර | ගබඩා 46 ක් නවීකරණය කිරීමට සැලසුම් කල අතර, ගබඩා 21 ක් නවීකරණය කර අවසන්ව ඇත. |
| (iii) - හතරවන අදියර | ධාරිතාවය මෙ.ටො. 94,500 ක් ගබඩා 78 කට අදාල ගබඩා නවීකරණය කිරීම දිසාපති හරහා සිදු කිරීම සඳහා ගබඩා ලැයිස්තුන් ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත. අමාත්‍යාංශය මඟින් අදාල ප්‍රතිපාදන වෙන් කිරීම් සිදුකරමින් පවතියි. |
| (iv) ගබඩා සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | තරාදි 179 ක් හා තෙතමාපක යන්ත්‍ර 08 ක් අලුත්වැඩියා කිරීම |
| (v) වී වියලීමේ මධ්‍යස්ථාන ඇති කිරීම | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා තාක්ෂණික වාර්තාව හා ලංසු ලේඛණය පිළියෙල කර අවසන්ව ඇත. |
| (vi) වෙබ් පිටුව හා තොරතුරු පද්ධතිය දියුණු කිරීම | මූලික අදියරේ වැඩකටයුතු ආරම්භකිරීමට සූදානම් කරමින් පවතියි. |
| (vii) ස්ථාවර වත්කම් මිලදී ගැනීම | තාක්ෂණික ඇගයීම් කමිටුව පැවැත්වීමට නියමිතය. |
| (viii) පුහුණුව හා සංවර්ධනය | නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වා ඇත. |
| (ix) පරිපාලන වියදම් | |
| පුනරාවර්තන වියදම් | වැටුප්, දීමනා හා අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා වැය කර ඇත. |

| ක්‍රියාත්මක සැලැස්ම අනුව ඉලක්ක ගත ක්‍රියාකාරකම් | ව්‍යාපෘතිය /වැඩසටහන යටතේ ලබාදීමට අපේක්ෂිත වැඩ / සේවා සහ භෞතික ප්‍රගතිය |
|---|---|
| හිමිකම් දායකත්වය<br>මහජන බැංකුව හා ලංකා බැංකුව මඟින් ලබාගත් ඔඩපන ණය කාලීන ණයක් ලෙස වාරික වශයෙන් ගෙවීම | හිමිකම් දයකත්වය යටතේ තුන්වන කාර්තුව අවසන් වන විට රු. මිලියන 2,071.9 ක මුදලක් මහා භාණ්ඩාගාරය මඟින් ලබාදී ඇති අතර, එම මුදල් බැංකු වෙත ගෙවා ඇත. |
| වී මිලදී ගැනීම - 2024/25මහ කන්නය<br><br>- 2025 යල කන්නය | 2024/25 මහ කන්නයේදී නාඩු වී මෙ.ටො. 55.54 ක්, සම්බා වී මෙ.ටො. 2.72 ක් ලෙස මුලු වී මෙ. ටො. 59.56 ක් මිලදී ගෙන ඇත.<br><br>2025 යල කන්නයේදී නාඩු වී මෙ.ටො. 49,330.82 ක්, සම්බා වී මෙ.ටො. 228.05 ක් හා කිරි සම්බා වී මෙ.ටො. 12.7 ක් ලෙස මුලු වී මෙ. ටො. 49,571.57 ක් මිලදී ගෙන ඇත.<br><br>නියමිත ප්‍රමිතියෙන් යුතුව ගොවීන් විසින් ගෙනවිත් භාරදෙන නාඩු (සුදු/රතු) වී කි. ග්‍රෑ. 1 ක් රු. 120.00 බැගින්ද, සම්බා (සුදු/රතු) වී කි. ග්‍රෑ. 1 ක් රු. 125.00 බැගින්ද, කිරි සම්බා වී කි. ග්‍රෑ. 1 ක් රු.132.00 බැගින්ද මිලදී ගෙන ඇත. |

ඡායාරූප අංක 44 - 45

## 07. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (AAIB)

### 7.1. පනතට අනුව ආයතනය ;-

හදිසි ආපදා තත්ත්වයන් හමුවේ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටුකිරීම සඳහා 1973 අංක 27 දරණ කෘෂි රක්‍ෂණ පනත මගින් ස්ථාපනය කරන ලද කෘෂි රක්ෂණ මණ්ඩලය, 1999 අංක 20 දරණ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත මගින් කෘෂිකාර්මික රක්ෂණය වෙනුවෙන් වූ එකම රාජ්‍ය රක්ෂණ ආයතනය වශයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කර නැවත ස්ථාපිත කරන ලදී.

කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය හා සමාජ සුභසාධනය අරමුණු කරගනිමින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක වේ.

### 7.2. ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය මඟින්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයට මුහුණපෑමට සිදුවන අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් වගා, පශු හා සාමාන්‍ය රක්‍ෂණ යන අංශ යටතේ බොහෝ කෘෂිකාර්මික රක්‍ෂණයන් හඳුන්වා දී ඇත. එමගින්, හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික බිඳවැටීම් අවමකර ගැනීම සඳහා සහ එවන් අවස්ථාවකදී කෘෂිකාර්මික ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට සිය මූල්‍ය ස්ථාවරත්වය වර්ධනයකර ගැනීම සඳහා උපකාරී වේ.

මීට අමතරව, කෘෂිකර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය මගින්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධව සිටින ගොවීන්ගේ විශ්‍රාමික දිවිය සුරක්ෂිත කිරීමේ අරමුණින් ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කෙරේ.

### 7.3. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 10.00 |
| 2 | පුනරාවර්තන වියදම් | 7,654.70 |

### 7.4. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (Continuation) | - | - | - | 1,800.00 |
| 2 | ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (Continuation) | - | - | - | 5,817.50 |
| 3 | කෘෂිකාර්මික රක්ෂණ දැනුවත් කිරීම සහ ව්‍යාප්ති මුල පිරීම | - | - | - | 5.00 |
| 4 | පශු සම්පත් සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ශක්‍යතා අධ්‍යනය සහ පාර්ශව කරුවන්ගේ සහභාගීත්ව ව්‍යාපෘතිය | - | - | - | 3.00 |
| 5 | ගොවීන් සඳහා තිරසාර සමාජ ආරක්ෂණයක් ව්‍යාපෘතිය | - | - | - | 29.20 |

### 7.5. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | - | - | - |
| 2 | පුනරාවර්තන වියදම් | 7,142.00 | 4,599.37 | 64 |
| | සංවර්ධන වැඩසටහන් | | | |
| 1 | ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (Continuation) | 5,635.00 | 3,972.60 | 71 |
| 2 | 2018 අයවැය යෝජනාවට අනුව වී, සෝයා, අර්තාපල්, බඩ ඉරිඟු, ලොකු ළූණු සහ මිරිස් සඳහා අනිවාර්ය රක්ෂණ ක්‍රමය (Continuation) | 1,500.00 | 626.00 | 42 |

| අ/ අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 3 | කෘෂිකාර්මික රක්ෂණ දැනුවත් කිරීම සහ ව්‍යාප්ති මුලපිරීම | 5.00 | 0.77 | 15 |
| 4 | ගොවීන් සඳහා තිරසාර සමාජ ආරක්ෂණයක් ව්‍යාපෘතිය | ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමි වී නැත. | | |
| 5 | පශු සම්පත් සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ශක්‍යතා අධ්‍යනය සහ පාර්ශව කරුවන්ගේ සහභාගීත්ව ව්‍යාපෘතිය | 2.00 | - | - |

### 7.6. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය

2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට 2018 ජාතික වගා රක්ෂණ යෝජනා ක්‍රමය යන ව්‍යාපෘතිය යටතේ 2023 යල, 2023/24 මහ, 2024 යල හා 2024/25 මහ යන වගා කන්නයන් වලදී වී, බඩඉරිඟු, අර්තාපල්, ලොකු ළූණු, මිරිස්, සෝයා යන බෝග වර්ග වගා කරනු ලබන ගොවීන් 81,735 සඳහා ගංවතුර, නියඟය, වන අලි ඇතුළු ස්වභාවික ආපදා හේතුවෙන් හානියට පත් වගා බිම් අක්කර 97,757 ක් සඳහා රු. මි. 1,678.00 ක වන්දි මුදලක් ගෙවන ලදී .

ඡායාරූප අංක 46

2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට පැරණි ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යන ව්‍යාපෘතිය යටතේ විශ්‍රාම ලාභීන් 185,065 ක් සඳහා රු. මි. 3,972.60 ක විශ්‍රාම වැටුපක් ගෙවන ලදී.

2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට කෘෂිකාර්මික රක්ෂණ දැනුවත් කිරීම සහ ව්‍යාප්ති මුලපිරීම යන ව්‍යාපෘතියට අදාළව නිලධාරීන් පුහුණු කරවීම යටතේ මණ්ඩලීය දිස්ත්‍රික් කාර්යාලයන්හි හා ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු වල නිරත සියලුම මාණ්ඩලික නිලධාරීන් හා ක්ෂේත්‍ර ගත සංවර්ධන හා ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රධාන බෝග හය මුලික කරගනිමින් කෘෂි තාක්ෂණික හා වගා හානි තක්සේරු කිරීමේ ක්‍රමවේද පිළිබඳව පුහුණු කිරීමේ වැඩසටහන් දෙකක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ඇතිව පවත්වන ලදී. උක්ත පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් 150ක් පමණ සහභාගී විය.

ඡායාරූප අංක 47

පශු සම්පත් සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ශක්‍යතා අධ්‍යනය සහ පාර්ශව කරුවන්ගේ සහභාගීත්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේ අගෝස්තු 21 දින අනුමැතිය හිමි විය. ඒ අනුව කිරි ගවයන් සඳහා සෞඛ්‍ය රක්ෂනාවරණයක් සකස් කිරීම සඳහා මූලික අධ්‍යයන කටයුතු සැලසුම් කරමින් පවතී. මීට සමගාමීව මණ්ඩලීය නිලධාරීන් පශු සම්පත් අවදානම් සම්බන්ධව මූලික දැනුවත් කිරීමේ වැඩසටහන් ඉදිරි සතිවලදී පැවැත්වීමට සැලසුම් කරමින් පවතී.

ගොවීන් සඳහා තිරසාර සමාජ ආරක්ෂණයක් යන ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමිව නොමැත.

## 08. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP)

### 8.1. හැඳින්වීම

1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනත බලාත්මක කිරීමත් සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ 1987 දෙසැම්බර් 22 වන දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පිහිටුවන ලදී. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ක්‍රියාකාරී සහයෝගීත්වය ලබා දීම සභාව මඟින් ඉටුකරනු ලැබේ. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය තුළ හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මඟින් කෘෂිකාර්මික අංශයේ පර්යේෂණ හා සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පැවරුම් කාර්යභාරය වේ. ප්‍රතිපත්ති සභාවේ ප්‍රධාන කාර්යයන් වනුයේ පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගැනීම, අදාළ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම තුළින් අන්තර්-ක්‍රියාකාරීත්වයට පහසුකම් සැලසීම, පර්යේෂණ සිදු කිරීමේදී ඇති වියහැකි බාධක නිරාකරණය කිරීම සහ අදාළ කමිටුවල ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා කාර්යභාරයක් ඉටු කරනු ඇත.

### 8.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 100.00 |
| 2 | පුනරාවර්තන විදයම් | 76.62 |
| 3 | ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම | 75.00 |

### 8.3. 2026 වර්ෂයේ පර්යේෂණ වැඩසටහන්වල භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 2501.01 | 2026 සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය සඳහා ආයතනවලින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම, ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම/ අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක පර්යේෂණ ප්‍රදාන යෝජනාක්‍රම සංකල්ප පත්‍ර එකතු කිරීම සහ රජයට නිර්දේශ කිරීම සඳහා ප්‍රතිපත්ති වාර්තා සකස් කිරීම | ක්‍රියාකාරී සැලැසුම් 25, සංකල්ප පත්‍ර 100, ප්‍රතිපත්ති වාර්තා 02 | 127 | 0.01 | 1.50 |
| 2501.02 | ජාතික කෘෂිපර්යේෂණ ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා සැකසීම | වාර්තා | 06 | 0.08 | 0.50 |
| 2501.03 | පර්යේෂණ පරතරය විශ්ලේෂණය/පර්යේෂණ ප්‍රතිදාන සමීක්ෂණය (වැඩමුළු/සමීක්ෂණ) | වැඩමුළු | 1 | 1.00 | 1.00 |
| 2501.04 | "කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු" දත්ත සමුදාය කළමනාකරණය | දත්ත සමුදායන් | 30 | 0.02 | 0.50 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු. මි.) | මුළු පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|---|
| 2501.05 | ආයතනවල බාහිර සමාලෝචනය | ආයතන | 4 | 0.63 | 2.50 |
| 2501.06 | ජාතික සම්මාන උළෙල | සම්මේලන | 2 | 0.25 | 0.50 |
| 2501.07 | වාර්ෂික සංවාද වැඩමුළුව | වැඩමුළු | 1 | 0.50 | 0.50 |
| 2501.08 | අන්තර් ආයතනික බහු-විනය පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය - අරමුදල් | ව්‍යාපෘති | 30 | 1.69 | 50.62 |
| 2501.09 | Agrinet සහ පුස්තකාලය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කෙටි පුවත් පත්‍රිකාව සහ ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාව | වෙළුම් | 2 | 0.50 | 1.00 |
| 2501.10 | ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම (ආසියානු පැසිපික් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සංගමය / අවබෝධතා ගිවිසුම්) | පුහුණුවීම් සහ සහයෝගිතා ගිවිසුම් | 12 | 0.83 | 10.00 |
| 2501.11 | කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ ජාත්‍යන්තර, ජාතික සහ අන්තර් ආයතනික ගැටලු පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම | වැඩමුළු | 3 | 1.67 | 5.00 |
| 2501.12 | කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සහ විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමඟ විද්‍යාඥයින් හුවමාරු කර ගැනීම සඳහා කටයුතු කිරීම | පුහුණුවීම් | 5 | 2.00 | 10.00 |
| 2501.13 | කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන සහ අංශවල කාර්ය සාධනය කලින් කලට සමාලෝචනය කිරීම. | ව්‍යාපෘති | 80 | 0.03 | 2.00 |

### 8.4. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 75.00 | 21.12 | 28 |
| 2 | පුනරාවර්තන වියදම් | 93.00 | 39.47 | 42 |

### 8.5. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

2025 සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය සඳහා ආයතනවලින් පර්යේෂණ ක්‍රියාකාරී සැලසුම් එකතු කිරීම සහ කෙටි හා මධ්‍යකාලීන පර්යේෂණ ප්‍රමුඛතා මත පදනම්ව ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීමේ වැඩසටහන සහ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම/ අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රම සංකල්ප පත්‍ර ඇගයීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතිය සඳහා ආයතන 25 ක දත්ත ලබා දී ක්‍රියාකාරී සැලැස්ම විශ්ලේෂණය ආරම්භ කර ඇත. තවද, 2026 සඳහා සංකල්ප පත්‍රිකා එකසිය හැත්තෑ නවයක් (179) ලැබී ඇති අතර,එම සංකල්ප පත්‍රිකා අතරින්

එකසිය විසිහතරක් (124) ඇගයීමට ලක් කර තෝරාගත් අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ යෝජනා ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර ඇත.

- ජාතික කෘෂිපර්යේෂණ ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා සැකසීමේ වැඩසටහන සහ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම/ අන්තර්-ආයතනයික සහ බහුවිෂයාත්මක පර්යේෂණ යෝජනා ඇගයීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 0.6 කි. එයින් 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට වියදම් කළ මුදල රු. මිලියන 0.13 කි. මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට ප්‍රමුඛතා ලේඛන හයෙන් (06) ප්‍රමුඛතා ලේඛන හතරක් (04) සම්පූර්ණ කර ඇත. කෙටුම්පත් කිරීමට ප්‍රමුඛතා දෙකක් අවශ්‍ය වේ. එයින් ආහාර භෝග අංශය සඳහා ජාතික කමිටු රැස්වීම සංවිධානය කර ඇති අතර වැඩිදුර අදහස් සඳහා ජාතික කමිටු සාමාජිකයින් අතර මූලික කෙටුම්පත් ලේඛනය බෙදා හරින ලදී.තවද, 2026 වසර සඳහා ලැබී ඇති ව්‍යාපෘති යෝජනා 130 ක් බාහිර විමර්ෂකවරුන් වෙත ඇඟයීම සඳහා යවා ඇත. එයින් මේ වන විට ඇඟයීම් පත්‍රිකා 35 ක් ලැබී ඇත.
- පර්යේෂණ පරතරය විශ්ලේෂණය/ පර්යේෂණ ප්‍රතිදාන සමීක්ෂණය (වැඩමුළු/සමීක්ෂණ) කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන එකකි. එයින් 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට රු. මිලියන 0.21 ක් වියදම් ලෙස දරා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට කෘෂිකාර්මික පර්යේෂණ සොයාගැනීම් ප්‍රජාවට සන්නිවේදනය කිරීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විද්වතුන් කැඳවා වැඩසටහන් පවත්වා ඇත.
- “කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරුවන් සඳහා තොරතුරු” දත්ත සමුදාය කළමනාකරණය කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන එකකි. එයින් 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට රු. මිලියන 0.58 ක් පමණක් වියදම් ලෙස දරා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට NARS ආයතන 30න් 25ක දත්ත එකතු කර ඇත.
- ආයතනවල බාහිර සමාලෝචනයකිරීමේ වැඩසටහන යටතේ සහ සමාලෝචනය කරන ලද ආයතනවල පසුවිපරම් කටයුතු සිදු කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 2.5 කි. ආයතන 6ක මේ වන විට බාහිර සමාලෝචන කටයුතු සිදු කරමින් පවතී.
- ජාතික සම්මාන උළෙල වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 7.35 කි. 2023 සහ 2025 වසරට අදාල පර්යේෂණ තොරතුරු කැඳවා 2025 ඔක්තෝම්බර් මස ජාතික සම්මාන උළෙල පැවැත්වීමට කටයුතු යොදා ඇත.
- වාර්ෂික සංවාද වැඩමුළුව වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 0.8 කි. එම වාර්ෂික සංවාද වැඩමුළුව හතරවන කාර්තුවෙහි පැවැත්වීමට සැලසුම් කර ඇත.
- අන්තර් ආයතනික බහු-විනය පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 20 කි. මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට වියදම රු. මිලියන 16.23 කි. නව ව්‍යාපෘති 10 ක් සහ තෝරා ගත් ව්‍යාපෘති 5ක් සඳහා මුදල් නිකුත් කර ඇත.
- ශ්‍රී ලංකා ආහාර හා කෘෂිකර්ම සඟරාව සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කෙටි පුවත් පත්‍රිකාව යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 2 කි. එයින් 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට රු. මිලියන 3.6 ක් වියදම් ලෙස දරා ඇත.
- ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ (ආසියානු පැසිපික් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සංගමය / අවබෝධතා ගිවිසුම්) වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 10 කි. මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට රු. මිලියන 2.22 ක් වියදම් ලෙස දරා

ඇත. ඒ අනුව 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට KOICA සමඟ සම්බන්ධ වී කොරියාවේ NARS විද්‍යාඥයින් 20 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් ලබා දී ඇත. චීන සමූහ ව්‍යාපාරය මගින් විද්වතුන් 60 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත. ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම MARDI සමඟ සංවිධානය කර ඇත. APAARI හි වාර්ෂික ගෙවීම සංවිධානය කර ඇත.

- කෘෂිකාර්මික පර්යේෂණවලට අදාළ ජාත්‍යාන්තර, ජාතික සහ අන්තර් ආයතනික ගැටලු පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 10 කි. මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට රු. මිලියන 0.6ක් වියදම් දරා ඇති අතර ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ එකක් හා ජාතික සම්මන්ත්‍රණ 2ක් සැලසුම් කර ඇත.
- කෘෂිකාර්මික පර්යේෂණ කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි පුහුණුව සහ විදේශයන්හි පිළිගත් පර්යේෂණ ආයතන සමඟ විද්‍යාඥයින් හුවමාරු කර ගැනීම සඳහා කටයුතු කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 2 කි. මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට රු. මිලියන 0.4 ක වියදමක් දරා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට ජාත්‍යාන්තර විශ්ව විද්‍යාල වල සිසුන් 12 ක් (පිලිපීනයේ 11 සහ මැලේසියාවේ 01) සහ දේශීය විශ්ව විද්‍යාල වල සිසුන් 05 ක් පුහුණුව ලබමින් සිටී.
- කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘති, ආයතන සහ අංශවල කාර්ය සාධනය කලින් කලට සමාලෝචනය කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල රු. මිලියන 2.7 කි. මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට රු. මිලියන 0.95 ක වියදමක් දරා ඇති අතර, එහි 2025 වසරේ පර්යේෂණ ව්‍යාපෘතිවල පළමු අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා 86 ක් මේ වන විට එකතු කර ඇත. 2025 සැප්තැම්බර් මස අවසන් වන විට ව්‍යාපෘති 30 ක් මාර්ගගත රැස්වීම් මගින් ඇගයීමට ලක් කරන ලදී. ව්‍යාපෘති 30ක ක්ෂේත්‍ර ඇගයීම් කටයුතු සිදු කර ඇත.

ඡායාරූප අංක 48

## 8.6. 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට ආයතනයේ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්මේ මූල්‍ය සහ භෞතික ප්‍රගතිය (2025.09.30 දක්වා)

| අ/අ | වැඩසටහන | **2025** වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | **2025.09.30** දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | Designing and developing a cost- effective, self-cooling automated polytunnel system for the lowcountry wet zone in Sri Lanka (NARP/2024/UR/AG/02) | 1.50 | 1.40 | 93 | පළමු බෝග චක්‍රය සාර්ථකව නිම කරන ලද අතර සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය අවසන් කරන ලදී. දෙවන බෝග චක්‍රය සඳහා සූදානම් කිරීම් අවසන් කර ඇති අතර දෙවන චක්‍රයේ සිටුවීම ආරම්භ කර ඇත. මුල් වර්ධන නිරීක්ෂණ වාර්තා කර ඇත. |
| 2 | Implementation of IoT (Internet of Things) Based Smart Protected Agriculture (PA) Systems by for Polytunnels and Urban Houses (NARP/2024/UC/FOT/01) | 2.47 | 2.29 | 93 | ක්ෂේත්‍ර භූමියේ ව්‍යුහාත්මක ආකෘති ඉදිකිරීම් ආරම්භ කර ඇත. ප්‍රධාන සංරචක කිහිපයක් දැනටමත් සවි කර ඇති හයිඩ්‍රොපොනික් ඒකක ස්ථාපනය සිදු වෙමින් පවතී. ඉදිරි මාසය සඳහා ක්‍රමාංකනය සහ අත්හදා බැලීම් ධාවනය කිරීමට නියමිතය. |
| 3 | Development of novel food products with functional properties using underutilized herbs in Sri Lanka (NARP/2024/USJ/SC/01) | 1.29 | 1.11 | 86 | ශාක රසායනික සංරක්ෂණය සඳහා ප්‍රශස්ත සැකසුම් ක්‍රමය වලංගු කර ඇත. ලුණුවිල අඩංගු ජුජුබ්ස්වල අත්හදා බැලීම් නිෂ්පාදනය අවසන් කරන ලද අතර සංවේදක ඇගයීම් අවසන් කරන ලදී. ස්ථායිතාව ඇගයීම් අත්හදා බැලීම් ආරම්භ කරන ලදී. |
| 4 | Weather based Blast Disease Forecasting and Early warning systems for climate risk mitigation (NARP/2024/UP/SC/01) | 3.95 | 3.59 | 91 | සංඛ්‍යානමය තක්සේරුව සම්පූර්ණ කර ඇති අතර කාලගුණ දත්ත ඒකාබද්ධ කරමින් මූලික පුරෝකථන ආකෘති සංවර්ධනය කර ඇත. මෑත කාලීන ක්ෂේත්‍ර දත්ත කට්ටල භාවිතා කරමින් ආකෘති වලංගුකරණය දැනට සිදුවෙමින් පවතී. |
| 5 | Use of seaweed supplements (*Kappaphycus alvarezi and Sargassum crassifolium*) for restoring fertility in dairy cows with endometritis (NARP/2024/UWU/ASEA/02) | 2.95 | 2.77 | 94 | රෝපණ ද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රචාරණය සාර්ථකව සිදුවෙමින් පවතී. පොරොන්දු වූ මූලික ප්‍රතිඵල සමඟ අභ්‍යන්තර ජෛව පරීක්ෂණ (දෙවන අදියර) ඉදිරියට යමින් පවතී; තෙවන අදියරේ මූලික කටයුතු ආරම්භ කර ඇත. |
| 6 | Characterization of encapsulated rice brain peptide and development of rice bran peptide incorporated new food product using traditional and improved rice varieties in Sri Lanka (NARP/2024/USJ/FOT/01) | 1.93 | 1.74 | 90 | ධනාත්මක රඳවා ගැනීමේ ප්‍රතිඵල සමඟ මූලික කැප්සියුලකරණ අත්හදා බැලීම් අවසන් විය. විකල්ප වාහක භාවිතා කරමින් කැප්සියුලකරණ කාර්යක්ෂමතාව ප්‍රශස්තකරණය කිරීම ආරම්භ කරන ලදී. |

| අ/ අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 7 | Effect of plant essential oils on pathogens and odor reductions in swine farm effluents in Sri Lanka (NARP/2024/UWU/ASEA/01) | 0.47 | 0.47 | 100 | වර්ණාවලි ශිල්පීය ක්‍රම භාවිතයෙන් තහවුරු කරන ලද ප්‍රධාන ජෛව ක්‍රියාකාරී සංඝටක. අනුකූලතාව සහතික කිරීම සඳහා පුනරාවර්තන පරීක්ෂණ ආරම්භ කිරීමත් සමඟ ප්‍රමාණාත්මක පරිවෘත්තීය පැතිකඩ සැලකිය යුතු ලෙස දියුණු වී ඇත. |
| 8 | Development of an efficient semi-artificial vertical farming system supplemented with sunlight and bio fertilizer for selected Solanaceae crops (NARP/2024/USJ/UAB/01) | 1.77 | 1.59 | 90 | දෙවන බෝග වර්ධන චක්‍රය හොඳින් ඉදිරියට යමින් පවතී. වර්ධනය, මල් පිපීම සහ අස්වැන්න පිළිබඳ සවිස්තරාත්මක දත්ත වාර්තා කර ඇත. අස්වැන්න පරාමිතීන්හි පොරොන්දු වූ අනුකූලතාවයක් පෙන්නුම් කරන චක්‍ර අතර සංසන්දනාත්මක විශ්ලේෂණයක් සිදු කර ඇත. |
| 9 | Investigation of the effect of fodder maize - legume intercropping on the forage yield and nutritive value of green chop and silage (NARP/2024/UP/AG/01) | 3.16 | 2.98 | 94 | දෙවන ක්ෂේත්‍ර අත්හදා බැලීම හොඳින් ස්ථාපිත කර ඇත; පෝෂණ පරාමිතීන් සඳහා ආහාර සාම්පල තවදුරටත් විශ්ලේෂණය කර ඇත. අඛණ්ඩ ප්‍රගතිය සහතික කිරීම සඳහා පරිභෝජන ද්‍රව්‍ය සහ ක්ෂේත්‍ර සැපයුම් විධිමත් කර ඇත. |
| 10 | Study the production potential of non-traditional export ornamental species in Southern Dry Zone of Sri Lanka: to evaluate the export potential and initiate export-oriented entrepreneurship/export villages (NARP/2024/UR/AG/01) | 1.19 | 1.01 | 85 | පස් රහිත රෝපණ මාධ්‍යය පිළිබඳ අඛණ්ඩ අත්හදා බැලීම් මගින් ධනාත්මක ශාක ස්ථාපිත වීමක් පෙන්නුම් කෙරේ. පොහොර පැකේජ ප්‍රශස්තිකරණ අත්හදා බැලීම් අඛණ්ඩව සිදු වූ අතර මල් පිපීම සහ එල සැකසීමේ දියුණුව නිරීක්ෂණය විය. |
| 11 | Selection of promissing cinnamon accessions for high yield and quality from two established germplasm collections (NARP/2024/UR/AG/03) | 2.65 | 2.21 | 84 | ක්ෂේත්‍ර නඩත්තුව සහ සවිස්තරාත්මක දත්ත රැස් කිරීම සුමටව සිදුවෙමින් පවතී. පත්‍ර තෙල් නිස්සාරණය අතිරේක සාම්පල දක්වා ව්‍යාප්ත කරන ලද අතර, සංසන්දනාත්මක විශ්ලේෂණයන් ප්‍රතිකාර හරහා සැලකිය යුතු වෙනස්කම් පෙන්නුම් කරයි. |
| 12 | Comparative study of smart greenhouse climate and control system with available system in order to improve yield and post harvest quality of vegetable crops grown under protected cover (NARP/2021/UC/FOT/01) | 0.33 | 0.33 | 100 | දෙවන සාම්පල කට්ටලය ඇගයීමට ලක්වෙමින් පවතින අතර, කල් ඉකුත් වීමේ කාලය සහ බර අඩු කර ගැනීමේ අධ්‍යයනයන් ප්‍රගතියක් පෙන්නුම් කරයි. මූලික ප්‍රවණතා හඳුනාගෙන ඇති අතර, පසුව සවිස්තරාත්මක වාර්තාකරණයක් සිදු කෙරේ. |
| 13 | Investigation of the causes of the forest die back at Horton Plains (NARP/2024/UP/AG/02) | 0.02 | 0.02 | 100 | - |
| 14 | Investigation on the role of water stress and climate change on forest dieback at Horton Plains (NARP/2021/UP/AG/02) | 0.76 | 0.76 | 100 | - |

| අ/අ | වැඩසටහන | **2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)** | **2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය (%)** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|---|
| 15 | Revitalizing Sri Lanka's Coastal Resources: A Multi-disciplinary exploration to harness the potential of Seaweeds (NARP/2025/UP/AG/01) | 2.71 | 2.47 | 91 | සාහිත්‍ය සමීක්ෂණය අවසන් කරන ලදී. පුළුල් කරන ලද අවධානය යොමු කරන ලද කණ්ඩායම් සාකච්ඡා මගින් නිර්දේශ ඉදිරිපත් කරන ලදී. මුහුදු පැලෑටි එකතු කිරීම අතිරේක ස්ථාන දක්වා ව්‍යාප්ත කරන ලදී; ආරම්භක ධනාත්මක ක්‍රියාකාරකම් වාර්තා කර ඇති ජෛව විශ්ලේෂණයන් ඉදිරියට ගෙන යන ලදී. |
| 16 | Development of biochar-based ethylene scavenger/s for maintaining freshness and extending the post-harvest life of fresh produce (NARP/2025/UM/ENG/01) | 1.47 | 0.90 | 61 | සාහිත්‍ය සමාලෝචනය අවසන් කර ඇත. පළමු අත්හදා බැලීම් කට්ටලය සාර්ථකව සිදු කර ඇති අතර, මූලික අත්හදා බැලීමේ සැකසුම ප්‍රශස්ත කර ඇත. මුල් දත්ත විශ්ලේෂණය ආරම්භ කරන ලදී. |
| 17 | Integrating genomic and field approaches for resistance analysis of Attakkari rice cultivars against major pest and diseases in Northern Sri Lanka (NARP/2025/UJ/AG/01) | 1.83 | 1.57 | 86 | මූලික දත්ත රැස් කිරීම අවසන් කරන ලදී. අට්ටකාරී ප්‍රභේද එකතු කිරීම සහ සංලක්ෂිත කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ප්‍රවණතා විශ්ලේෂණය සිදුවෙමින් පවතින බැවින් ක්ෂේත්‍ර පළිබෝධ නිරීක්ෂණය තීව්‍ර විය. DNA විස්තාරණය මඟින් රෝගකාරක පැවැත්ම තහවුරු කරන ලදී; අනුක්‍රමික සූදානම ආරම්භ කරන ලදී. |
| 18 | Harnessing *Azolla* and Seaweed extract for sustainable foliar fertilizer production to address soil salinity associated problems in Sri Lanka (NARP/2025/UR/AG/01) | 1.51 | 1.32 | 87 | විවිධ උපස්ථර යටතේ වගාව ක්‍රමයෙන් ප්‍රගතියක් ලබයි. ලවණතාවයට ප්‍රතිරෝදී දෙවන දත්ත කට්ටලය සම්පාදනය කර ඇති අතර, අවකල වර්ධන ප්‍රතිචාර පෙන්වයි. |
| 19 | Field experiment on introducing an intra-uterine device (IUD) to trouble making female monkeys, castrating sub adult males & examining the presence of arbo Virus, bunya Virus and malaria in monkeys (NARP/2025/UP/VS/01) | 4.33 | 3.71 | 86 | උගුල්/කූඩු නිෂ්පාදනය අවසන් කර යෙදවීම ආරම්භ කරන ලදී. IUD ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. ප්‍රතිනිෂ්පාදනය කළ හැකි ප්‍රතිඵල ලබා ගනිමින් කැටි සන්නාමකරණය සිදු කරන ලදී. |
| 20 | Re-tuning the flavor notes of Ceylon Black Tea: Investigating the impact of sun light intensity & spectral composition on the flavor profile (NARP/2025/USJ/SC/01) | 2.40 | 2.04 | 85 | ක්‍රමානුකූල සමාලෝචන වාර්තාව සම්පූර්ණ කරන ලදී. බහු ධාවන හරහා තත්වයන් අනුකරණය කිරීම සඳහා මූලික අත්හදා බැලීම් පුළුල් කර ඇති අතර, පර්යේෂණාත්මක ප්‍රොටෝකෝල වලංගු කර ඇත. |
| 21 | Microalgae-based liquid organic fertilizer for sustainable agriculture in Sri Lanka (NARP/2025/UM/ENG/02) | 2.78 | 2.53 | 91 | පරීක්ෂාව මඟින් වැඩිදියුණු කළ කාර්ය සාධනයක් සහිත පොරොන්දු වූ ප්‍රභේද කිහිපයක් ලබා දෙන ලදී. නියමු පරිමාණ ධාවන පථ පොකුණු නිෂ්පාදනය අවසන් කරන ලදී; පරීක්ෂණ මෙහෙයුම සැලසුම් කර ඇති අතර ස්ථාපනය සිදුවෙමින් පවතී. |

| අ/අ | වැඩසටහන | **2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)** | **2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය (%)** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|---|---|
| 22 | Diversifying commercial Dendrobium gremplasm towards new cultivars through induced mutagenesis in I*n-Vitro* (NARP/2025/RUSL/AG/01) | 3.90 | 3.72 | 95 | ප්‍රොටෝකෝල ප්‍රශස්තිකරණය අඛණ්ඩව සිදු වූ අතර පුනර්ජනන කාර්යක්ෂමතාවයේ දියුණුවක් දක්නට ලැබුණි. වගා මාධ්‍ය ප්‍රශස්තකරණය කිරීම ප්‍රතිඵලවල අනුකූලතාව වැඩි දියුණු කළේය |
| 23 | Survey of pest species of armored scales (Hemiptera diaspididae) of Sri Lanka (NARP/2025/RUSL/AG/02) | 1.99 | 1.38 | 69 | සාහිත්‍ය සමීක්ෂණය සහ මූලික ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. අතිරේක කෘෂි-පාරිසරික කලාප ආවරණය කිරීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණය තවදුරටත් පුළුල් කරන ලදී; සාම්පල එකතු කිරීම සිදුවෙමින් පවතී. |
| 24 | Crops for the future: Investigating the effects of applying silicon on enhancing drought tolerance and water use efficiency of selected widely grown field crops of Sri Lanka (NARP/2025/UR/AG/02) | 3.18 | 2.99 | 94 | පරිභෝජන ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ප්‍රසම්පාදනය කර ඇත. සිලිකොන් අවශෝෂණය පිළිබඳ මූලික අත්හදා බැලීම් අවසන් කර ඇත; සංසන්දනාත්මක විශ්ලේෂණයන් සිදුවෙමින් පවතින දෙවන වටය සිදුවෙමින් පවතී. |
| 25 | Effect of climate change on export oriented mango (*Magifera indica L.)* diversity, production, value addition and marketing in the dry zone of Sri Lanka with spatiotemporal mapping of existing climate resilient mango varieties (NARP/2025/UK/SC/01) | 2.42 | 1.74 | 72 | සාහිත්‍ය සමාලෝචනය ශක්තිමත් කර ඇත. දේශගුණික අවදානමට ලක්විය හැකි අඹ කලාපවල GIS මත පදනම් වූ සිතියම්ගත කිරීම මූලික කලාප වර්ගීකරණයන් කෙටුම්පත් කර ආරම්භ කර ඇත. |
| 26 | Comparative analysis of the prevalence of *campylobacter* and *Salmonella* in poultry, cattle. Pig and human fecal samples in Gampaha district, Sri Lanka (NARP/2025/UK/MED/01) | 0.71 | 0.71 | 100 | සදාචාරාත්මක නිෂ්කාශනය ලබාගෙන ඇත. ඉතිරි පරිභෝජන ද්‍රව්‍ය ප්‍රසම්පාදනය අවසන් කර ඇත; අත්හදා බැලීමේ අදියර ආරම්භ කර ඇත. |
| 27 | Development of *in-vitro* protocols for the rapid production and estimation of secondary metabolizes of *Salacia* reticulata - A highly valuable endangered medical plant (NARP/2025/UR/AG/03) | 1.88 | 1.70 | 90 | පේරාදෙණියේ රාජකීය උද්භිද උද්‍යානය විසින් සත්‍යාපනය කරන ලද මව් ශාක. ශක්තිමත් දූෂණයෙන් තොර වර්ධනයක් පවත්වා ගනිමින් අභ්‍යන්තර ආයතන ඉදිරියට යමින් පවතී; ගුණ කිරීමේ අදියර ආරම්භ කර ඇත. |

**සටහන:** ඉහත ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම, විශ්ව විද්‍යාල සමඟ ඒකාබද්ධව සිදු කරන වැඩසටහන යටතේ 2025.09.30 දක්වා වියදම් කළ මුදල ලෙස දක්වා ඇත්තේ ආයතනය විසින් විශ්ව විද්‍යාල සඳහා එතෙක් ලබා දී ඇති අත්තිකාරම් මුදල් ප්‍රමාණය වේ.

ඡායාරූප අංක 49

## 09. ගොවීන්ගේ භාරකාර අරමුදල (FTF)

### 9.1. හැඳින්වීම

1994 දී ස්ථාපිත භාරකාර ඔප්පුවේ සඳහන් වන ආකාරයට හා 2002 වර්ෂයේදි අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අරමුණු පුළුල් කිරීම මගින් ගොවීන්ගේ භාරකාර අරමුදල පහත අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා ගොවි ජනතාවගේ සුබසාධනය වැඩි දියුණු කිරිම.
- සුළු ගොවීන්ට කෙටිකාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම.
- සුළු ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සම්පාදනය.
- සුළු ගොවීන්ගේ මූල්‍ය දුෂ්කරතාවයන් මඟහරවා ගැනිම සඳහා සුළු ගොවියාට වෙළෙඳපල ණය පහසුකම් සැපයිම.
- සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- බෝග හා සත්ව නිෂ්පාදන ක්‍රියාවලිය මෙන්ම නිෂ්පාදනය පිරිසැකසුම සඳහා සුළු ගොවීන්ට අවශ්‍ය වෙනත් අනුග්‍රහයන් ලබා දීම.
- කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැලසිම සඳහා විශේෂ කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 9.2. ගොවි භාරකාර අරමුදලේ ප්‍රධාන කාර්යයන්

- **ප්‍රදාන**

ගොවි භාරකාර අරමුදලේ ප්‍රතිපාදන යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

- **ණය**

- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ක්‍රියාත්මක කරන කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ණය ලබාදීම.
- ගොවි බැංකු සඳහා අමතර ප්‍රාග්ධනය ලබාදීම
  සුළු ගොවීන් සඳහා කෙටි කාලීන ණය පහසුකම් සැලසීමේ අරමුණින් ගොවි භාරකාර අරමුදලේ ප්‍රතිපාදන යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක වේ.
- වෙනත් ණය
  කෘෂිකාර්මික හදිසි අවශ්‍යතා සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වෙත ණය මුදල් ලබා දීම. ( උදා - වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය වෙත)

- **අත්තිකාරම්**

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා වසරක කාලසීමාවක් තුළ ගෙවා අවසන් කිරීමේ පදනම මත පොලී රහිතව ණය අත්තිකාරම් ලබාදීම.

**9.3. ක්‍රියාත්මක ක්‍රමවේදය**

එක් එක් වර්ෂය සඳහා සියලු පළාත් සභා හා දිස්ත්‍රික් ලේකම්වරුන්, කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන රජයේ දෙපාර්තමේන්තු හා ආයතන මඟින් ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා ගොවීන්ගේ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සිදු කරන අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ ව්‍යාපෘති සලකා බලා අනුමැතිය ලබා දෙනු ලැබේ. එසේ අනුමැතිය ලබා දෙන ව්‍යාපෘති ගොවීන්ගේ භාරකාර අරමුදල් අයවැය වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**9.4. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

ගොවීන්ගේ භාර අරමුදල අයවැය ඇස්තමේන්තුව 2026

| අ/ අ | විස්තරය | මූලික ඇස්තමේන්තුව (රු.) |
|---|---|---|
| 01 | ප්‍රදාන | 31.92 |
| 02 | ණය | 111.74 |
| 03 | අත්තිකාරම් | 15.96 |
| **එකතුව** | | **159.62** |

**9.5. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට අරමුදලේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය, (2025.09.30 දක්වා)**

**9.5.1. ප්‍රදානයන් යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති**

| අ/අ | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| i.) | හදිසි ගංවතුර තත්ත්වය මත සිදුවී ඇති ආපදා සඳහා සහන සැපයීම - 2023 අවිච්චේද (ගො.සං.දෙ) | 20.00 | 3.62 | 18 |
| ii.) | කාන්තා ගොවි සංවිධාන සම්බන්ධිකාරක නිලධාරින් හා කාන්තා ගොවි සංවිධාන සභාපතිනියන් සඳහා මූල්‍ය කළමනාකරණ සඳහා වන පාඨමාලා ගාස්තු ගෙවීම. | 10.00 | 7.04 | 70 |
| iii.) | අතරමැදි කන්නයේ මුං වගා කිරීමේ ව්‍යාපෘතිය -2024 | 100.00 | 50.00 | 50 |

**i.) හදිසි ගංවතුර තත්ත්වය මත සිදුවී ඇති ආපදා සඳහා සහන සැපයීම.**

2023 වර්ෂයේදී දිවයිනට බලපානු ලැබූ හදිසි ගංවතුර තත්ත්වයන් හමුවේ බදුල්ල, මාතර, ගාල්ල හා කුරුණෑගල දිස්ත්‍රික්ක තුළ කෘෂි ඇල මාර්ග, අමුණු සුළු වාරිමාර්ගවලට සිදු වී ඇති හානි සඳහා ඒවා අලුත්වැඩියා කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත රු. මි. 20.00 ක මුදලක් ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් වෙන්කර ඇත.

**ii.) කාන්තා ගොවි සංවිධාන සම්බන්ධිකාරක නිලධාරින් හා කාන්තා ගොවි සංවිධාන සභාපතිනියන් සඳහා මූල්‍ය කළමනාකරණ සඳහා වන පාඨමාලා ගාස්තු ගෙවීම.**

දැනට දිවයින පුරා ව්‍යාප්ත වෙමින් පවතින ක්ෂුද්‍ර මූල්‍ය සංවිධාන හඳුනා ගැනීම හා මූලධර්ම, සේවාවන්, සැලසුම් කිරීම හා සංවර්ධනය, ගිණුම්කරණය, ව්‍යාපාති වාර්ථා පිළියෙල කිරීම හා ඇගයිම, ණය ඇගයීම හා අයකිරීම්, මෙහෙයුම්, පසුවිපරම්කරණය, අලෙවිකරණය හා මූල්‍ය නොවන සේවාවන්, කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය සිදු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රය පිළිබඳ නිපුනතාවයෙන් යුතු

සංචිතයක් දිවයින පුරා කටයුතු කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවි බැංකුව මගින් සැලසුම් කර ඇති පාඨමාලාව සඳහා මුදල් නිදහස් කර ඇත.

**iii.) අතරමැදි කන්නයේ මුං වගා කිරීමේ ව්‍යාපෘතිය -2024**

මුං වගා නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීමේ අරමුණු කර ගනිමින් මුං වගා ආදර්ශන හා බීජ සුරක්ෂිතතා වැඩසටහනක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් හම්බන්තොට, අම්පාර, අනුරාධපුර හා පොළොන්නරුව අන්තර් පළාත් තුළ හා හම්බන්තොට පළාත තුල ක්‍රියාත්මක කල මෙම ව්‍යාපෘතිය මඟින් ගොවීන් 10,903 දෙනකු විසින් හා අක්කර 18,063 වගා වපසරියක් තුළ මුං වගාව ක්‍රියාත්මක කර ඇත.

**2. කෘෂිකාර්මික ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

| අ/අ | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | සත්‍ය මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| i.) | කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය. (ප්‍රාදේශිය සංවර්ධන බැංකුව ) | 300.00 | 11.85 | 04 |

**i.) කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය. (ප්‍රාදේශිය සංවර්ධන බැංකුව)**

2025 වර්ෂයේදි සුළු ගොවීන් සඳහා වගා ණය පහසුකම් ලබා දීමේ අරමුණ පෙරදැරිව ප්‍රාදේශිය සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය මගින් ගොවීන් 24 දෙනකු සඳහා රු. මි. 11.85 ක මුදලක් ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් ලබා දී ඇත.

<u>වර්තමාන තත්ත්වය</u>

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII කොටසේ 39 වැනි වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත අරමුදල් පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීම යටතේ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ 2024.11.06 දිනැති හා අංක 4/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දි ඇත.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කමිටුවක් පත් කර තිබූ අතර, එම කමිටුවේ නිර්දේශ ලැබෙන තෙක් ගොවීන්ගේ භාර අරමුදලේ මෙහෙයුම් කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පැවති බැවින්, 2025 වර්ෂය සඳහා ගොවීන්ගේ භාර අරමුදල මගින් ව්‍යපෘති සඳහා ප්‍රතිපාදන ලබා දීම තාවකාලිකව නවතා තිබීම හේතුවෙන් සියලු ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය අඩු අගයක පවති.

2025.08.15 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහතා විසින් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව 2025.08.25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මේ සම්බන්ධව සාකච්ජා වී ඇති අතර ගොවීන්ගේ භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. ඒ සඳහා අවශ්‍ය කටයුතු ගොවීන්ගේ භාර අරමුදල මගින් සිදු කරමින් පවතින බව වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

# 10. ජාතික පොහොර ලේකම් කාර්යාලය

## 10.1. හැඳින්වීම

1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනතේ නෛතික කටයුතු සහ ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සිදු කිරීම.

## 10.2. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

ශ්‍රී ලංකාවේ වගා කරන සියලු බෝගවල නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අකාබනික හා කාබනික පොහොර නියමිත ප්‍රමිතියෙන් යුක්තව සම්පාදනය හා භාවිතය තහවුරු කිරීම ආයතනයේ දැක්ම වන අතර පොහොර විධිමත් කිරීමේ පනතේ විධිවිධාන අනුව අදාළ සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විද්‍යානුකූල නිර්දේශයන් මත පොහොර අවශ්‍යතාවය තක්සේරු කිරීම, පොහොර ආනයනය හා තොග පාලනය, නිසි ගුණත්වයෙන් යුතු පොහොර බෙදා හැරීම හා අලෙවිය තහවුරු කිරීම, කාබනික හා අකාබනික පොහොර භාවිතයේ දී පරිසර හිතකාමී ලෙස පොහොර භාවිතය වැඩිදියුණු කිරීම, ගොවි ප්‍රජාවගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොහොර සහනාධාර යෝජනා ක්‍රමය මෙහෙයවීම හා පොහොර භාවිත ක්ෂේත්‍රයේ අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම මෙහෙවර වේ. 1988 අංක 68 දරණ පොහොර පනත විධිමත්ව ක්‍රියාත්මක කිරීම ආයතනයේ මූලික කාර්යභාරය වේ.

## 10.3. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 24.83 |
| 2 | පුනරාවර්තන වියදම් | 108.91 |
| | **එකතුව** | **133.74** |

** මෙම ඇස්තමේන්තු ගත පිරිවැය පහත වගුවේ අනු අංක 01, අනු අංක 02 සහ අනු අංක 03 ට ඇතුලත් කර ඇත.

## 10.4. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | බලපත්‍රයක ගාස්තුව (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 01 | (i) කාබනික පොහොර නව නිෂ්පාදකයන් සඳහා බලපත්‍ර ලබා දීම. | | 03 | 0.02 | 0.06 |
| | (ii) කාබනික පොහොර පැරණි නිෂ්පාදකයින්ගේ බලපත්‍ර අලුත් කිරීම. | | 56 | 0.02 | 0.84 |
| | (iii) පොහොර ආනයන බලපත්‍ර නිකුත් කිරීම. | | 04 | 0.15 | 0.60 |
| | (iv) පොහොර ආනයන බලපත්‍ර අලුත් කිරීම. | | 178 | 0.10 | 17.80 |
| | (v) කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර නිකුත් කිරීම | | 01 | 0.15 | 0.15 |
| | (vi) ) කාබනික නොවන පොහොර නිෂ්පාදන බලපත්‍ර අලුත් කිරීම. | | 08 | 0.10 | 0.80 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | බලපත්‍රයක ගාස්තුව (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| | (vii) පොහොර මිශ්‍රණ බලපත්‍ර නිකුත් කිරීම. | | 02 | 0.15 | 0.3 |
| | (viii) පොහොර මිශ්‍රණ බලපත්‍ර අලුත් කිරීම. | | 58 | 0.10 | 5.8 |
| | | | 310 | | 26.35 |
| | (ix)තොග සත්‍යාපනය හා ගබඩා පරික්ෂා කටයුතු | | | | |
| | a. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන | | 935 | | මුළු පිරිවැය 2026 මූල්‍ය ඉලක්ක වල ඇතුලත් කර ඇත. |
| | b. ප්‍රාදේශීය ගබඩා | | 42 | | |
| | c. පෞද්ගලික අලෙවිසැල් සහ කාබනික පොහොර නිෂ්පාදනාගාර පරික්ෂාව | | 2922 | | |
| 02 | පුහුණු වැඩසටහන් | | 40 | | |
| 03 | ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පොහොර නියැදි ලබා ගැනීම | | | | |
| | 3.1 ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන | | (6.1) යටතේ දක්වා ඇත. | | මුළු පිරිවැය 2026 මූල්‍ය ඉලක්ක වල ඇතුලත් කර ඇත. |
| | 3.2 ප්‍රාදේශීය ගබඩා | | | | |
| | 3.3 පෞද්ගලික අලෙවිසැල් සහ පොහොර නිෂ්පාදනාගාර වල පොහොර නියැදි ගැනීම | | | | |
| | 3.4 ක්ෂේත්‍ර නියැදි ලබාගැනීම | | | | |
| 04 | ප්‍රගති සමාලෝචන රැස්වීම් පොහොර කමිටු රැස්වීම් හා සංග්‍රහ වියදම් | | 50 | | |
| **5.0** | **නිෂ්පාදන ප්‍රවර්ධන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2026** | | | | |
| 5.1 | පුහුණු වැඩසටහන (උසස් තත්ත්වයේ Single Super Phosphate පොහොර නිෂ්පාදකයින් පිළිබඳ) | | 03 | | මූල්‍ය පිරිවැය අදාල ආයතන මඟින් ලබාගැනීමට බලාපොරොත්තු වේ. |
| **6.0** | **තත්ත්ව පාලන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2026** | | | | |
| 6.1 | පොහොර වල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා නියැදි ගැනීම | | 2400 | | |
| **7.0** | **ආනයන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2026** | | | | |
| 7.1 | රසායනික පොහොර ආනයනයට අදාළ ලේඛන සහ වාර්තා පරික්ෂා කිරීම සඳහා ලිපිගොනු සකස් කිරීම (Oder Approval) | | 1200 | | මූල්‍ය පිරිවැය අවශ්‍ය නොවේ. |
| 7.2 | ආනයනයෙන් පසු රේගු නිෂ්කාශනය සඳහා නිර්දේශ සකස් කර ඉදිරිපත් කිරීම - Clearance | | 1400 | | මූල්‍ය පිරිවැය අවශ්‍ය නොවේ. |
| 7.3 | අලෙවි ඇණවුම් සකස් කිරීම (Marketing Approval) | | 1400 | | |
| **8.0** | **තොරතුරු හා කළමනාකරණ අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2026** | | | | |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | බලපත්‍රයක ගාස්තුව (රු.මි.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| **පොහොර බෙදා හැරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම.** | | | | | |
| 8.1 | වී වගාව සහ ධාන්‍ය සඳහා යල කන්නය | | 2026 මාර්තු - අගෝස්තු | | |
| 8.2 | වී වගාව සහ ධාන්‍ය සඳහා මහ කන්නය | | 2026 සැප්තැම්බර් - 2027 පෙබරවාරි | | |
| 8.3 | අනෙකුත් වගාවන් සඳහා | | 2026 ජනවාරි - දෙසැම්බර් | | |
| **9.0** | **ආයතන අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2026** | | | | |
| 9.1 | නිලධාරී පුහුණු වැඩසටහන් (දේශීය) | | 02 | | |
| **10.0** | **සැලසුම් අංශය - ක්‍රියාත්මක සැලැස්ම 2026** | | | | |
| 10.1 | වැඩසටහන් සැලසුම්කරණය | | 03 | | |
| 10.2 | ප්‍රගති සමාලෝචනය | | 10 | | |

## 10.5. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන් වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| | **2. පුනරාවර්තන වියදම්** | | | |
| 2.1 | (i) කාබනික පොහොර නව නිෂ්පාදකයින්ට බලපත්‍ර ලබා දීම | මෙම වැඩසටහන සඳහා වෙන් කල සහ වියදම් වූ ප්‍රතිපාදන මුළු ඉන්ධන වියදම (2.8) යටතේ දක්වා ඇත. | | |
| | (ii) කාබනික පොහොර පැරණි නිෂ්පාදකයින්ගේ බලපත්‍ර අලුත් කිරීම. | | | |
| | (iii)තොග සත්‍යාපනය හා ගබඩා පරික්ෂා කටයුතු | | | |
| | a. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන | | | |
| | b. ප්‍රාදේශීය ගබඩා | | | |
| | c. පෞද්ගලික අලෙවිසැල් සහ කාබනික පොහොර නිෂ්පාදනාගාර පරික්ෂාව | | | |
| 2.2 | පුහුණු වැඩසටහන් | | | |
| 2.3 | ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පොහොර නියැදි ලබා ගැනීම | | | |
| | 2.3.1 ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන | | | |
| | 2.3.2. ප්‍රාදේශීය ගබඩා | | | |
| | 2.3.3. පෞද්ගලික අලෙවිසැල් සහ කාබනික පොහොර නිෂ්පාදනාගාර | | | |
| 2.4 | ප්‍රගති සමාලෝචන රැස්වීම් පොහොර කමිටු රැස්වීම් හා සංග්‍රහ වියදම් | 0.55 | 0.12 | 21 |

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 2.5 | දින වැටුප් | - | - | - |
| 2.6 | තැපැල් සහ සන්නිවේදන | 0.01 | - | - |
| 2.7 | ලිපි ද්‍රව්‍ය | 0.68 | 0.41 | 60 |
| 2.8 | මුළු ඉන්ධන වියදම් | 1.62 | 1.10 | 68 |
| එකතුව | | **2.85** | **1.63** | **57** |

| අ/අ | පුනරාවර්තන වියදම් | 2025.09.30 දක්වා | |
|---|---|---|---|
| | | වියදම් කළ මුදල (රු.මි.) | අතැති බිල්පත් (රු.මි.) |
| ප්‍රධාන කාර්යාලය | | 14.25 | 1.93 |

### 10.6. 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

ජාතික පොහොර ලේකම් කාර්යාලයේ 2025.09.30 දින වන විට සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කළ මුදල රු. මි. 2.85 කි. වියදම් කළ මුදල රු. මි. 1.63 කි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී. මෙමඟින් වී ගොවීන් 1,200,000 ක් පමණ ප්‍රතිලාභ ලබා ගෙන ඇත.

එමෙන්ම, මෙම වැඩසටහන යටතේ 2025 යල කන්නයේ හෙක්ටයාර් 545,000 ක වී වගාව සඳහා ගුණාත්මක භාවයෙන් යුතු රසායනික/ පරිසර හිතකාමී පොහොර නිසි ප්‍රමිතියෙන් යුතුව නිසි වේලාවට ගොවීන් වෙත බෙදාහරින ලදි.

තවද මෙම වැඩසටහන යටතේ වී වගාවේ මෙ.ටො. 2,000,000 ක පමණ අස්වැන්නක් අපේක්ෂා කර ඇත.

## 11. ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්

### 11.1. හැඳින්වීම

"ලක්පොහොර" හා "කොමර්ෂල් පොහොර" සන්නාමයන් පිළිබඳ ශ්‍රී ලාංකීය ගොවිජනතාව අතර කීර්ති නාමයක් ඇති බැවින්, කාබනික හා රසායනික පොහොර ඇතුළු අනෙකුත් කෘෂි යෙදවුම් හා සේවා සපයන ලාභදායී ව්‍යාපාරික ඒකක ලෙස පවත්වාගන යාම අරමුණු කර ගනිමින් 21/0118/323/005 දරණ හා 2021.02.01 දිනැති හා අංක CP/22/0706/514/001 සහ 2022/05/30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සීමාසහිත ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කරමින් 2024.07.11 දින "ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ්" ආයතනය පිහිටුවන ලදී. මෙම ආයතනය ගොවියාට අවශ්‍ය සෘජු හා මිශ්‍ර පොහොර තරඟකාරී පොහොර වෙළඳපොල තුළ අලෙවි කරනු ලබන එකම රාජ්‍ය ආයතනය වේ.

### 11.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

* 2025 වර්ෂය සඳහා අප විසින් ප්‍රතිපාදන ඉල්ලුම් කල නමුත්, අප ආයතනය ස්වයං මූල්‍ය ආයතනයක් සේ සලකා ප්‍රතිපාදන ලබාදීම ප්‍රතික්ෂේප කළ බැවින්, 2026 වර්ෂය සඳහා අප විසින් රජයේ මුදල් ඉල්ලුම් කිරීමට අපේක්ෂා නොකරන්නෙමු.

**11.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.මි) |
|---|---|---|---|---|---|
| 1 | 2026 වර්ෂය. මිශ්‍රන පොහොර මෙ.ටො. 45,000ක් සහ ඍජු පොහොර මෙ.ටො.30,000ක් අලෙවි කිරීම. | මෙ.ටො. | 75,000 | 103.57 | ***7,768.00 |

*** 2026.04.01 දින සිට 2027.03.31 දින දක්වා ඇස්තමේන්තුගත ආදායම

*අප ආයතනයේ 2026 මුදල් වර්ෂය 2026.04.01 – 2027.03.31 වන බැවින්, මෙම බෙදාහැරීම් සැලසුම් සකස් කරමින් පවතින අතර, දැනට ඉහත ප්‍රමාණය ඇස්තමේන්තුගත කර ඇත.

**11.4. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අ/අ | වැඩසටහන | (A) 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි) | (B) 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි) | (C) මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| ** | ඍජු හා මිශ්‍ර පොහොර අලෙවි කිරිම. | 7,516.00 | 3,077 .00 | 41 |

** අප ආයතනය ස්වයං මූල්‍ය ආයතනයක් වන බැවින්, අප විසින් 2025 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුදල (A) මඟින් ද 2025.09.30 දිනට සත්‍ය විකුණුම් මූල්‍ය අගය (B) මඟින් ද සත්‍ය විකුණුම්වල ප්‍රතිශතය (C) මඟින් ද ඉදිරිපත් කර ඇත.

**11.5. 2025 වර්ෂයේ තුන්වන වන කාර්තුව අවසානය වන විට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

- 2025 වර්ෂය සඳහා මෙ.ටො.64,700ක ප්‍රමාණයක් අලෙවි කිරීමට ඇස්තමේන්තු ගත කර ඇති අතර, 2025.09.30 දින වනවිට මෙ.ටො. 26,846ක ප්‍රමාණයක් අලෙවි කර ඇත.
- දීප ව්‍යාප්තව සිදුකිරීමට කටයුතු සංවිධානය කර තිබූ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් අතුරින් බදුල්ල, මොණරාගල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් මේ වනවිට එම වැඩසටහන් සිදුකර ඇත.

## 12. ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය (ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය)

**12.1. හැඳින්වීම**

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය හෙවත් ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය 1973 අංක 15 දරණ ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ පනත අනුව ස්ථාපිත කර ඇත.

**12.2. දැක්ම හා මෙහෙවර**

ගොවි ජනතාවගේ සහ අඩු වරප්‍රසාද ඇති ජනතාවගේ අභිමානය නැවතත් ඇති කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ආර්ථික ස්වාධීනත්වය සහ ස්ව විශ්වාසය ඇති කිරීම දැක්ම වන අතර ප්‍රතිලාභීන්ගේ ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමටත් අනුන් මත යැපීමේ සංස්කෘතිය මග හැරවීම

සඳහාත් කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙනත් ක්ෂේත්‍රවල නිපුණතා සංවර්ධනය සඳහාත් සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙහෙවර වේ.

## 12.3. අරමුණු

i. රජය විසින් සකස් කරන ලද සංවර්ධන වැඩපිළිවෙලට අනුකූලව සාමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා විදේශීය, දේශීය නියෝජ්‍යාත්ව වල ආධාර ලබා ගැනීම.

ii. මහජනෝපකාර, සාමාජීය හා ආර්ථික සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම.

iii. කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය කෙරෙහි යොමු වූ නිශ්චිත යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, එම යෝජනා ක්‍රම දියුණු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

iv. කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ යෝජනා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යාත්ව උනන්දු කිරීම.

v. ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාරය සහ වෙනත් ඒ හා සමාන පිටරට ආයතන, සංගම් හෝ සමිති සමග සහයෝගී වීම.

## 12.4. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු. මි) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | - |
| 2 | පුනරාවර්තන වියදම් | 41.3 |

## 12.6. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක ( ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් ව්‍යාපෘති )

| අ /අ | වැඩසටහන | මිනුම් ඒකකය (රු.මි.) | ඉලක්ක | ඒකක පිරිවැය (රු .මි ) | මුළු පිරිවැය (රු .මි ) |
|---|---|---|---|---|---|
| 1 | කෙසෙල් කොළ දවටන නිෂ්පාදන ව්‍යාපෘතිය | දවටන ගණන | යන්ත්‍රයකින් දිනකට දවටන 25000 | - | 7.73 |
| 2 | සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය | සේවාවක් වශයෙන් | නව සුගුණ සප්පායම් භෝජනාගාර 5 ක් ස්ථාපිත කිරීම | - | 0.22 |
| 3 | දෙහිවල ඇග්‍රෝ ෆ්‍රෙෂ් සුපර් අලෙවිසැල | විකුණුම් | - | - | 54.16 |
| 4 | දෙහිවල පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | විකුණුම් | වර්ෂයක් සඳහා ගුණාත්මයෙන් ඉහළ පැල 2000 නිෂ්පාදනය | - | 6.92 |
| 5 | සහල් සබලකරණ ව්‍යාපෘතිය | ආහාර වේල් ගණන | දිනකට ළමුන් 500,000 සඳහා<br>දිස්ත්‍රික්ක ගණන = 12 | – | 1,309.04 |
| 6 | සත්ත්ව ආහාර සඳහා බඩඉරිඟු මෙට්‍රික්ටොන් 50,000 ආනයනය කිරීම | මෙ.ටො. | මෙ.ටො. 50,000 | – | 8,255.29 |
| 7 | දේශීය බඩඉරිඟු මිලදී ගැනීම | මෙ.ටො. 02 | මෙ.ටො. 15,000 | _ | 1.73 |

| අ /අ | වැඩසටහන | මිනුම් ඒකකය (රු.මි.) | ඉලක්ක | ඒකක පිරිවැය (රු .මි ) | මුළු පිරිවැය (රු .මි ) |
|---|---|---|---|---|---|
| 8 | නාරාහේන්පිට පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | විකුණුම් | වර්ෂයක් සදහා ගුණාත්මයෙන් ඉහළ පැල 2,500 නිෂ්පාදනය | _ | 13.70 |
| 9 | ඉඩම් අක්කර 15 සහ 10 සදහා තණමල්විල සහ බුත්තල ගොවිපළවල ඉඩම් සංවර් ධනය කිරීම | මෙ.ටො. | පුද්ගලික අංශය සමග ඒකාබද්ධ වී බඩඉරිගු වගාකිරීම | _ | 2.45 |
| 10 | මැද කන්නයේ මුං ඇට වගාකිරීමේ ව්‍යාපෘතිය | මෙ.ටො. | ගොවීන්ගේ සහභාගිත්වයෙන් අක්කර 400 ක මුං ඇට ප්‍රවර් ධනය කිරීම | _ | 2.09 |
| 11 | සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හදුන්වාදීමේ ව්‍යාපෘතිය - කොළඹ ටෙලිකොම් ආයතනය | සේවාවක් වශයෙන් | පෝෂ්‍යදායි ආහාර වේලක් මහජනත්ව අතර ප්‍රචලිත කිරීම (සියලුම රාජ්‍ය ආයතනවල භෝජනාගාර සදහා ) | _ | 0.50 |

## 12.7. 2025.09.30 දනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු. මි) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රග්ධන වියදම් | - | - | - |
| 2 | පුනරාවර්තන වියදම් | 40.00 | 30.62 | 75 |
| | සංවර්ධන වැඩසටහන් | | | |
| 1 | පොලිතින් දවටන වෙනුවට කෙසෙල් කොළ පත්‍රවලින් ඇසුරුම් හදුන්වාදීමේ ව්‍යාපෘතිය | 6.18 | 0.01 | - |
| 2 | සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හදුන්වාදීමේ ව්‍යාපෘතිය | 0.18 | 0.05 | 26 |
| 3 | නාරාහේන්පිට පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 10.96 | 9.55 | 87 |
| 4 | දෙහිවල ඇග්‍රෝ ෆ්‍රෙෂ් සුපර් අලෙවිසැල | 43.33 | 30.98 | 71 |
| 5 | දෙහිවල පැල සහ කෘෂි යෙදවුම් අලෙවිසැල | 6.92 | 6.67 | 97 |
| 6 | සත්ත්ව ආහාර සඳහා බඩඉරිගු මෙට්‍රික්ටොන් 50,000 ආනයනය කිරීම | 6,604.23 | 43.08 | 1 |
| 7 | සහල් සබලකරණ ව්‍යාපෘතිය | 1,047.23 | 155.09 | 15 |
| 8 | දේශීය බඩඉරිගු මිලදී ගැනීම | 2,101.38 | 0.95 | - |
| 9 | ඉඩම් අක්කර 15 සහ 10 සදහා තණමල්විල සහ බුත්තල ගොවිපළවල ඉඩම් සංවර්ධනය කිරීම | 1.96 | 1.09 | 56 |
| 10 | මැද කන්නයේ මුං ඇට වගාකිරීමේ ව්‍යාපෘතිය | 1.66 | 0.04 | 3 |

## 12.8. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

### i.) කෙසෙල් කොළ දවටන නිෂ්පාදන ව්‍යාපෘතිය

මේ වනවිට ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය යටතේ පවත්නා දෙහිවල පිහිටි අලෙවි සැලෙහි දී ආහාර දවටන ලෙස ජෛව දවටන නිෂ්පාදනය කර ප්‍රචලිත කිරීම සිදුකෙරේ. ඒ සඳහා ස්ථාපිත කර ඇති විදුලි බලයෙන් ක්‍රියාකරවන යන්ත්‍රයක් මගින් කෙසෙල් කොල යොදාගනිමින් ආහාර දවටන සකස් කෙරේ. මෙම යන්ත්‍රය මගින් පැයකට දවටන 150 ක් පමණ අවම වශයෙන් සකස් කළ හැකි වේ. එක් දවටනයක අලෙවි මිල රුපියල් 10 පමණ වනු ඇත. අමු කෙසෙල් පත්‍ර අප ආයතනයට සපයන විට අඩි 2 ක් දිග කෙසෙල් පත්‍ර කැබැල්ලක් සඳහා රුපියල් 4 බැගින් ගෙවා මිලදී ගැනීමට ආයතනය විසින් කටයුතු සූදානම් කර ඇත.

ඡායාරූප අංක 50

### ii.) සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

ජනතාව අතරට සෞඛ්‍යසම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීමේ දෙවන අදියර ලෙස "සුගුණ සප්පායම" Torrington, Good Market - Saturday special වශයෙන් ආරම්භ කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලය කෘෂිතාක්ෂණ හා ග්‍රාමීය විද්‍යායතනයේ සිසුන් කණ්ඩායමක් විසින් මෙම අලෙවි කුටිය ආරම්භ කර 2025 මැයි 03 දින සිට 2025 ජූලි 05 දක්වා සෑම සෙනසුරාදා දිනකදීම පවත්වන ලදී. එය කොළඹ නගරයේ ජනතාවගේ ප්‍රතිචාර පිළිබඳව අවබෝධයක් ලබාගැනීම පිනිස ආරම්භ කරන ලද ශක්‍යතා අධ්‍යයනයක් විය. එහිදී රැස්කරගත් තොරතුරු සහ දත්තයන් පාදක කරගනිමින් කොළඹ කොටුව පිහිටි ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ප්‍රධාන කාර්යාලයේ "සුගුණ සප්පායම" සඳහා පුද්ගලික අංශයේ දායකත්වය යටතේ 2025 සැප්තැම්බර් පළමු සතියේ ආරම්භ කිරීමට කටයුතු සූදානම්කර ඇත.

ඡායාරූප අංක 51

### iii.) පැල අලෙවිසැල සහ ගෙවත්ත - නාරාහේන්පිට

ග්‍රාමීය ජනතාවට මෙන්ම නාගරික වැසියන්ද තම ගෙවත්තේ තමාට අවශ්‍ය දෑ හැකි අයුරින් වගා කර පරිභෝජනයට ගැනීමට පෙළඹීම මත ඒ සඳහා, නාගරික වැසියන්ට ගෙවතු වගාව සඳහා අවශ්‍ය වන්නා වූ සියළුම වර්ගයේ එළවළු පැළ ඇතුළු සහනදායී මිලකට ලබාදීම පෙරදැරිව ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් ලෙස නාරහේන්පිට පැළ තවාන හඳුන්වාදිය හැක. ඖෂධීය පැල, මල් පැල හා පලතුරු පැල (විශේෂයෙන් ඌන භාවිත පලතුරු) හා පලතුරු හා එලවලු බීජ, එළවළු හා මල් පොහොර, කාබනික පොහොර, කෘමි විකර්ෂක, කෘෂි උපකරණ ආදිය මෙම ස්ථානයෙන් මිලට ගත හැකි අතර මෙම ස්ථානයෙන් බෝග වගා පිළිබඳ උපදෙස් ද නොමිලේ ලබා ගත හැක.

මෙම ව්‍යාපෘතියේ ආදායම රු. මි. 7.88 ක් වූ අතර වියදම රු. මි. 9.55 කි. ඉහත සංඛ්‍යාත්මක දත්තවලට අනුව මෙම ව්‍යාපෘතිය පෙර වසරට වඩා ප්‍රගතියක් ලබා ඇත.

ඡායාරූප අංක 52

### iv.)පැල අලෙවිසැල - දෙහිවල

නාරාහේන්පිට අලෙවි මධ්‍යස්ථානය මගින් සිදු කරනු ලබන සියලුම අලෙවි කාර්යයන් දෙහිවල මධ්‍යස්ථානය මගින් ද සිදු කෙරේ. ආදායම ලෙස රු. මි. 6.06 මුදලක් උපයා ඇති අතර සහ මේ වසරේ වියදම රු. මි. 6.69 කි.

**v.) ගොවි නිෂ්පාදන හා ආහාර අලෙවි සැල - දෙහිවල**

මෙම ව්‍යාපෘතියේ මෙම වසරේ වියදම රු. මි. 30.98 ක් වූ අතර ආදායම රු. මි. 30.83 කි.

ඡායාරූප අංක 53

**vi.) බඩ ඉරිඟු ආනයනය**

කුකුළු පාලනය සඳහා ප්‍රධාන ආහාර ද්‍රව්‍යයක් ලෙස බඩ ඉරිඟු භාවිතා කරන බැවින් ඒ සඳහා ශ්‍රී ලංකාවේ කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදකයින්ගේ ඉහළ ඉල්ලුමක් පවතී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු මෙට්‍රික් ටොන් 200,000 ක් නිෂ්පාදනය කරනු ලබන නමුත් වාර්ෂික අවශ්‍යතාවයෙන් 50% කට පමණක් එය ප්‍රමාණවත් වේ.

වර්තමානයේ, පෞද්ගලික සමාගම් විසින් බඩ ඉරිඟු ආනයනය සිදු කරනු ලබන බැවින්, ඔවුන් ඒකාධිකාරයක් පවත්වාගෙන යයි. එමනිසා කුකුළු ආහාර මිල ඉහළ යාමක් සිදුවන අතර කුකුළු පාලන ගොවියන් සඳහා දැඩි දුෂ්කරතා ඇති කරයි. අනුව, පුද්ගලික අංශයේ සහය ඇතිව බඩඉරිඟු මෙට්‍රික් ටොන් 50,000 ක් ආනයනය කිරීමෙන් රු. මි. 146.74 ක මුදලක ආදායමක් උපයා ඇත. වියදම රු. මි. 43.08.

**vii.) සහල් සබලකරණ ව්‍යාපෘතිය**

ප්‍රථමික පාසල් ශිෂ්‍යයන් සඳහා දිවා ආහාර සැපයීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂයේ පාසල් සිසුන් 500,000 ක් සඳහා දිවා අහර සැපයීමට සබලකෘත සහල් සැකසීමේ කාර්යය අප මණ්ඩලයේ කලන්කුට්ටිය කර්මාන්තශාලාවේ සිදු කෙරෙන අතර ලෝක ආහාර වැඩසටහනේ දායකත්වයෙන් එම කටයුතු සිදුකරයි. මෙම ව්‍යාපෘතියේ වියදම රු. මි. 155.09 කි . රු. මි. 63.68 ක මුදලක ආදායමක් උපයා ඇත.

ඡායාරූප අංක 54

**viii.) ඉඩම් අක්කර 15 සහ 10 සඳහා තණමල්විල සහ බුත්තල ගොවිපළවල ඉඩම් සංවර්ධනය කිරීම**

බුත්තල ගොවිපළ තුළ සත්ත්ව ආහාර සඳහා බඩ ඉරිඟු අක්කර 6 ක වපසරිය තුළ වගා කර ඇති අතර මෙ.ටො. 16 ක් සත්ත්ව ආහාර සඳහා අඹේවෙල ගොවිපළ වෙත ට්‍රක් රථවලින් ප්‍රවාහනය කරනු ලැබූ අතර මෙහිදී අස්වැන්න නෙළීම සිදුකිරීම වැසි සමය ආරම්භ කිරීමට ප්‍රථමව කළ යුතුව ඇත. තවද බඩ ඉරිඟු අස්වැන්න නෙළීම දින 80 - 85 අතර කාලය තුළ සිදුකළ යුතු වේ.

ඡායාරූප අංක 55

**ix.) මැද කන්නයේ මුං ඇට වගාකිරීමේ ව්‍යාපෘතිය**

මේ වනවිට ලංකාවේ මුං භෝගයේ වගා වපසරිය ආසන්න වශයෙන් හෙක්ටයාර 9,100 පමණ වන අතර වාර්ෂික නිෂ්පාදනය මෙ. ටො. 13,000 පමණ වේ. එහෙත් වාර්ෂික අවශ්‍යතාවය මෙ. ටො. 20,000 පමණ වේ. එමෙන්ම අස්වැන්න හෙක්ටයාරයට මෙ. ටො. 1.1 - 2 දක්වා වෙනස් වේ. මේ වන විටත් මුං ඇට ආනයනය කෙරෙන අතර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මැද කන්නයේ වගාවද යම් තරමකින් දායක කරගත හැකිය.

ඡායාරූප අංක 56

**x.) සහනදායි මිලකට සෞඛ්‍යමත් ආහාර වේලක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය - කොළඹ ටෙලිකොම් ආයතනය**

අප මණ්ඩලය මගින් පෝෂ්‍යදායි ආහාර වේලක් සහන මිලකට පාරිභෝගිකයන් වෙත ලබාදීමේ ව්‍යාපෘතියක් සුගුණ සප්පායම නමින ක්‍රියාත්මක වේ. එම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ භෝජනාගාරයක් තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කළද එහි සේවය කිරීම සඳහා අප ආයතනයේ ප්‍රමාණවත් තරම් සේවකයන් නොමැති බැවින් බාහිර ආයතනයක් මගින් එම කටයුතු සිදුකිරීමට සිදුවේ.

ඡායාරූප අංක 57

## 13. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය (ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය හා ජනාවාස අධිකාරිය)

### 13.1. දැක්ම

තිරසර ඉඩම් හා ස්වාභාවික සම්පත් කළමණාකරණය සඳහා වන සේවා විශිෂ්ඨත්වයක් තුළ හරිත වූ පරිසරයක් සරු එල සපිරි රටක්.

### 13.2. මෙහෙවර

ඵලදායි ඉඩම් කළමනාකරණය, විධිමත් ජල සංරක්ෂණයක් හා උසස් මානව සම්පත් උපයෝජනය තුළින් පාරිසරික සම්පත් සංරක්ෂණය හා කෘෂිආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

### 13.3. අරමුණ

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතේ අංක 2026/45 දිනැති ගැසට් නිවේදනය අනුව පනතේ පැවරී ඇති අරමුණු.

i.) කෘෂිකාර්මික විවිධාංගිකරණය, ජනාවාස සංවර්ධනය හා පූර්ණ සම්බන්ධිත දියබෙත්ම කළමණාකරනය සඳහා සැලසුම් සකස් කිරීම සහ සංස්ථාව විසින් හෝ රාජ්‍ය හෝ නොවන නියෝජිත ආයතන මගින් හෝ එම සැලසුම් සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම.
ii.) කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම හා අලෙවිකරණය.
iii.) වාණිජ කෘෂිකාර්මික වගාව හෝ වෙනත් යම් කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි දේශීය සහ විදේශීය කෘෂිකර්මාන්ත ආයෝජන සඳහා දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සහය ලබාදීම.
iv.) කෘෂිකාර්මික විවිධාංගිකරණය හා ජනාවාස සංවර්ධනය සඳහා විවිධ උපකරණ සැපයීම හා නඩත්තු කිරීම
v.) (1) වන ඡෙදයෙහි නිශ්චිත ප්‍රදේශවල කෘෂිකාර්මික විවිධාංගිකරණය , ජනාවාස සංවර්ධනය සහ දිය බෙත්ම කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශය යයි සලකනු ලබන සියළු පියවර ක්‍රියාත්මක කිරීම.
vi.) වාණිජ කෘෂිකාර්මික වගාව හෝ වෙනත් යම් කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි දේශීය සහ විදේශීය කෘෂිකර්මාන්ත ආයෝජන සඳහා දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සහය ලබාදීම.
vii.) අධිකාරිය සමඟ හවුල්කාරත්වයක් ඇතිව හෝ නැතිව රාජ්‍ය නොවන නියෝජිත ආයතන, පුද්ගලික අංශය හෝ ගොවින් විසින් භාර ගන්නා ලද එවැනි කෘෂි කර්මාන්ත ආයෝජනය ඇති

කිරීම සඳහා සැලසුම් කිරීම සහ එම සැලසුම් ක්‍රියාත්මක කිරීම, සේවාවන් සැපයීම සහ විශේෂඥ දැනුම ලබා දීම.

### 13.4. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු ගත මුදල (රු.මි) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන ඇස්තමේන්තුව | 501.20 |
| 2 | පුනරාවර්තන ඇස්තමේන්තුව | 177.60 |

### 13.5. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | ව්‍යාපෘතියේ නම | ඒකකය | ඉලක්කය | ඒකකයක පිරිවැය (රු.) | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි) |
|---|---|---|---|---|---|
| **01.** | **ඉඩම් ඵලදායිතාවය උපරිම මට්ටමකට ගෙන ඒම සහ සුරක්ෂිත ජල සම්පත සහ සංරක්ෂණය වූ පරිසරයක්** | | | | |
| 1.1 | පාංශු ඛාදනය හා හායනය අවම කිරීම උදෙසා කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම | හෙක්ටයාර | 1500 | 35,000.00 | 75.00 |
| 1.2 | ජල මූලාශ්‍ර සංරක්ෂණය සහ ජල මූලාශ්‍රය ආශ්‍රිත පහසුකම් සැපයීම | ජල මූලාශ්‍ර | 52 | 1,750,000.00 | 91.00 |
| 1.3 | ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂක සඳහා රුක් රෝපණය | ජලකාමී පැල | 20000 | _ | 10.00 |
| 1.4 | ප්‍රජා සහභාගීත්ව ජල මූලාශ්‍ර සංරක්ෂණ සහ පවිත්‍රතා වැඩසටහන | වැඩසටහන් | 100 | 100,000.00 | 10.00 |
| 1.5 | පාසල් පාදක පාරිසරික වැඩසටහන් | වැඩසටහන් | 50 | 60,000.00 | 3.00 |
| 1.6 | ප්‍රජා පාදක පාරිසරික වැඩසටහන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් | 50 | 60,000.00 | 3.00 |
| **02.** | **ආහාර සුලභතාවය සහ සුරක්ෂිතතාව තහවුරු වූ නිරෝගිමත්, සමෘධිමත් ප්‍රජාවක් සහ ප්‍රශස්ථ යටිතල පහසුකම් ප්‍රවර්ධිත දැනුමින් හා තාක්ෂණයෙන් සවිබල ගැන්වූ නව කෘෂි ව්‍යවසායකයින්** | | | | |
| 2.1 | වාණිජ ගෙවතු වගා ප්‍රවර්ධනය | උපකරණ කට්ටල | 2000 | 25,000.00 | 50.00 |
| 2.2 | ආර්ථික බෝග වගා ප්‍රවර්ධනය | ආර්ථික බෝග | 50000 | 500.00 | 25.00 |
| 2.3 | අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනය | හෙක්ටයාර | 250 | 80,000.00 | 20.00 |
| 2.4 | දෙමුහුම් මිරිස් වගාව ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් | 10 | _ | 5.00 |
| 2.5 | ග්‍රාමීය ප්‍රජාව අතර බිත්තර දමන කුකුළු පාලනය (Layer Chicks) ප්‍රවර්ධනය කිරීම | ප්‍රතිලාභීන් | 100 | 100,000.00 | 10.00 |
| 2.6 | අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලනය | කුකුල් පැටවුන් | 60000 | 850.00 | 51.00 |
| 2.7 | වගාවන් සඳහා වන සතුන්ගෙන් | විදුලි වැට | 100 | _ | 10.00 |

| අ/අ | ව්‍යාපෘතියේ නම | ඒකකය | ඉලක්කය | ඒකකයක පිරිවැය (රු.) | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මි) |
|---|---|---|---|---|---|
| | සිදුවන හානිය අවම කිරීම (50% දායකත්වය මත) | වායු රයිෆල් | 1600 | _ | 40.00 |
| 2.8 | වාණිජ මට්ටමේ මීමැසි පාලනය සඳහා දිරි ගැන්වීම (50% දායකත්වය මත) | ප්‍රතිලාභීන් | 40 | 50,000.00 | 2.00 |
| 2.9 | බිම්මල් නිෂ්පාදිනය කරන ව්‍යවසායකයින් බිහි කිරිම. (50% දායකත්වය මත) | ප්‍රතිලාභීන් | 100 | 100,000.00 | 10.00 |
| 2.10 | අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරීම (50% දායකත්වය මත) | ප්‍රතිලාභීන් | 20 | 375,000.00 | 7.50 |
| 2.11 | ව්‍යවසායක මට්ටමින් පළතුරු ගම්මාන ප්‍රචලිත කිරීම | පලතුරු ගම්මාන | 20 | _ | 50.00 |
| **03. ගොවි ජනතාව කෘෂි තාක්ෂණික දැනුමෙන් සවිබල ගැන්වීම.** | | | | | |
| 3.1 | ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් හා සමාජ සජීවිකරණ වැඩසටහන් පවත්වා සවිබල ගැන්වීම හා ගොවිතැනට යොමු කිරීම. | වැඩසටහන් | 100 | 30,000.00 | 3.00 |
| 3.2 | සමාජ සජීවීකරණය තුළින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) හරහා ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම සහ නායකත්ව පුහුණුවක් ලබාදීම. | වැඩසටහන් | 52 | _ | 2.70 |
| 3.3 | ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩසටහන් | 10 | 200,000.00 | 2.00 |
| 3.4 | කෘෂිකර්මාන්තයේ දියුණුවෙන් ආර්ථික සංවර්ධනය වූ ගොවි ප්‍රජාව ඇගයීම | වැඩසටහන් | 1 | _ | 2.00 |
| **5.සේවක අභිප්‍රේරණය තුළින් සේවා ඵලදායීතාව ඉහළ නැංවීම සහ ආයතනික ඵලදායිතාව ඉහළ නැංවීම** | | | | | |
| 4.1 | භෞතික සම්පත් සංවර්ධනය | - | - | - | 10.00 |
| 4.2 | මානව සම්පත් සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය | පුහුණු වැඩසටහන් | 100 | - | 3.00 |
| 4.3 | මාසික ප්‍රගති සමාලෝචනය | ප්‍රගති සමාලෝචන රැස්වීම | 24 | - | 1.00 |
| 4.4 | විද්‍යුත් හා මාධ්‍ය වැඩසටහන් | - | - | | 5.00 |
| **එකතුව** | | | | | **501.20** |

### 13.6. 2025.09.30 දිනට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය

| වෙන් කළ මුදල (රු.මි.) | වැය වූ මුදල (රු.මි.) | බැදීම් සහ බැරකම් | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 338.00 | 52.61 | 51.58 | 31 |

| අ/අ | වැඩසටහන | **2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි)** | **2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි)** | **මූල්‍ය ප්‍රගතිය (%)** |
|---|---|---|---|---|
| 1.1 | පාංශු ඛාදනය හා හායනය අවම කිරීම උදෙසා කෘෂිකාර්මික ඉඩම් වල පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම | 28.00 | 9.71 | 35 |
| 1.2 | කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රවලිත කිරීම | 26.00 | - | - |
| 1.3 | | 3.25 | 3.06 | 94 |
| 1.4 | පාංශු සංරක්ෂණය සඳහා තාක්ෂණික උපකරණ භාවිතය ප්‍රවලිත කිරීම | 1.00 | - | - |
| 2.1 | ජල මූලාශ්‍ර සංරක්ෂණය සහ ජල මූලාශ්‍රය ආශ්‍රිත පහසුකම් සැපයීම | 62.40 | 51.58 | 83 |
| 2.2 | ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂක ක්‍රම භාවිතය | 3.00 | 0.75 | 25 |
| 2.3 | ප්‍රජා සහභාගීත්ව ජල මූලාශ්‍ර සංරක්ෂණ සහ පවිත්‍රතා වැඩසටහන | 1.56 | 0.84 | 54 |
| 3.1 | වාණිජ ගෙවතු වගා ප්‍රවර්ධනය | 17.00 | 0.59 | 3 |
| 3.2 | ආර්ථික බෝග වගා ප්‍රවර්ධනය | 7.50 | 0.88 | 12 |
| 3.3 | අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනය | 6.00 | 1.63 | 27 |
| 3.4 | සුහුරු කෘෂි තාක්ෂණය උපයෝගී කොට ගනිමින් දෙමුහුන් මිරිස් වගාව ප්‍රවලිත කිරීමේ නියමු ව්‍යාපෘතිය | 5.00 | - | - |
| 3.5 | වගාවන් සඳහා වන සතුන්ගෙන් සිදුවන හානිය අවම කිරීම **(50% දායකත්වය මත)** | 4.00 | - | - |
| | | 30.00 | - | - |
| 4.1 | වාණිජ මට්ටමේ මීමැසි පාලනය සඳහා දිරි ගැන්වීම (50% දායකත්වය මත) | 2.50 | - | - |
| 4.2 | බිම්මල් නිෂ්පාදනය කරන ව්‍යවසායකයින් බිහි කිරීම. (50% දායකත්වය මත) | 2.50 | - | - |
| 4.3 | අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරීම (50% දායකත්වය මත) | 6.25 | - | - |
| 4.4 | ව්‍යවසායක මට්ටමින් පළතුරු ගම්මාන ප්‍රවලිත කිරීම | 25.00 | 0.90 | 4 |
| 4.5 | ගම්මිරිස් වගාව ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය | 19.20 | - | - |
| 5.1 | පාසල් පාදක පාරිසරික වැඩසටහන් | 1.30 | 0.30 | 23 |
| 5.2 | ප්‍රජා පාදක පාරිසරික වැඩසටහන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් | 1.04 | 0.59 | 57 |
| 6.1 | අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන | 52.70 | 19.73 | 37 |
| 6.2 | ග්‍රාමීය ප්‍රජාව අතර බිත්තර දමන කුකුළු පාලනය (Layer Chicks) ප්‍රවර්ධනය කිරීම | 20.00 | 5.15 | 26 |
| 7.1 | ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වා සවිබල ගැන්වීම හා ගොවිතැනට යොමු කිරීම. | 2.08 | 1.72 | 83 |
| 7.2 | සමාජ සජීවීකරණය තුලින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) හරහා ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම | 1.25 | 1.24 | 99 |
| 7.3 | ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම | 0.50 | 0.05 | 9 |
| 7.4 | කෘෂිකර්මාන්තයේ දියුණුවෙන් ආර්ථික සංවර්ධනය වූ ගොවි ප්‍රජාව ඇගයීම | 1.00 | - | - |
| 8.1 | භෞතික සම්පත් සංවර්ධනය | 5.00 | 4.27 | 85 |

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 8.2 | මානව සම්පත් සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය | 1.00 | 0.20 | 20 |
| 8.3 | මාසික ප්‍රගති සමාලෝචනය | 0.96 | 0.30 | 31 |
| 8.4 | විද්‍යුත් හා මාධ්‍ය වැඩසටහන් | 1.01 | 0.60 | 59 |
| **එකතුව** | | **338.00** | **104.09** | **31** |
| **විශේෂ ව්‍යාපෘති** | | | | |
| Clean Sri Lanka වැඩසටහන යටතේ පාසල් 50ක සොබා සිප් වඳුල වැඩසටහන පැවැත්වීම | | 29.93 | 1.23 | 4 |
| පල්ලේකැලේ ගොවිපොල සමෝධානික ගොවිපොලක් ලෙස සංවර්ධනය කිරීම | | 8.73 | - | - |

**13.7. 2025.09.30 දිනට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

**අභිමතාර්ථය 01 : ඉඩම් ඵලදායීතාව උපරිම මට්ටකට ගෙන ඒම.**

**1.1 පාංශු ඛාදනය හා හායනය අවම කිරීම උදෙසා කෘෂිකාර්මික ඉඩම් වල පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම**

කෘෂිකාර්මික ඉඩම්වල පාංශ ඛාදනය හා හායනය වැලැක්වීම මගින් පාංශු ඵලදායීතාවය ආරක්ෂා කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ. මෙම වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, කැගල්ල, රත්නපුර, ගම්පහ, කොළඹ සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්ගේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ක්‍රියාත්මක වේ. 2025 වර්ෂයේදී මෙම වැඩසටහන් සඳහා රු.මි. 28.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කොට ඇති අතර හෙක්ටයාර 800 ක් සංරක්ෂණය කිරීම සඳහා සැලසුම් කර ඇත. ඒ අනුව, 2025.09.30 දින වන විට කෘෂිකාර්මික ඉඩම්වල හෙක්ටයාර 410.86 ක් සංරක්ෂණය කොට ඇති අතර ප්‍රතිලාභීන් වෙත රු.මි. 9.71 ක් ලබා දී ඇත.

ඡායාරූප අංක 58

**1.2 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම**

පාංශු සංරක්ෂණ සිදුකරන ලද කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාව තවදුරටත් ඉහළ නැංවීම මඟින් සාරවත් පසක් නිර්මාණය කර ගැනීමේ අරමුණු සහිතව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන ගොවීන් සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම, එම කාබනික පොහොර නිෂ්පාදනය සාර්ථකව සිදුකරනු ලබන ගොවීන් සඳහා කෘෂි යෙදවුම් කට්ටල 2,600 ක් ලබාදීම සහ ගුණාත්මක කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රොක් පොස්පේට් කි.ග්‍රෑ. 130,000 ක් ලබාදීමට නියමිතය. 2025 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා රු.මි. 29.25 ක් වෙන් කර ඇති අතර 2025.09.30 දින වන විට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය රොක් පොස්ෆේට් කි.ග්‍රෑ. 130,000 ලබා දී අවසන් කර ඇති අතර ඒ සඳහා රු.මි. 3.07 ක් වැය කර ඇත. ගොවීන් සඳහා ලබා දීමට නියමිත කෘෂි යෙදවුම් කට්ටල සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කොට අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දීමට නියමිත වේ.

ඡායාරූප අංක 59

**අභිමතාර්ථය 02 - සුරක්ෂිත ජල සම්පත**

## 2.1 ජල මූලාශ්‍ර සංරක්ෂණය සහ ජල මූලාශ්‍රය ආශ්‍රිත පහසුකම් සැපයීම.

2025 වර්ෂයේ මෙම වැඩසටහන මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල, රත්නපුර, ගම්පහ ,කොළඹ හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන්ගේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 52ක ක්‍රියාත්මක වේ. 2025 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා රු.මි. 62.40 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කොට ඇති අතර ජල මූලාශ්‍ර 52 ක් සංරක්ෂණය සඳහා සැලසුම් කොට ඇත. මෙම වැඩසටහන තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රාදේශීය ලේකම්වරුන්, හා තාක්ෂණික නිලධාරින්ගේ නිර්දේශ යටතේ ක්‍රියාත්මක වන අතර 2025.09.30 දින වන විට ජල මූලාශ්‍ර 49 ක් සඳහා ඇස්තමේන්තු අධිකාරිය වෙත ලැබී ඇති අතර ජල මූලාශ්‍ර 45 ක් සඳහා ප්‍රතිපාදන මුදල් රු.මි. 51.59 ක් අනුමත කිරීම සිදු කොට අවසන් කොට ඇත.

ඡායාරූප අංක 60

## 2.2. ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂක ක්‍රම භාවිතය

ජල මූලාශ්‍ර සංරක්ෂණ වැඩසටහන් වලට සමගාමීව පවතින ජල මූලාශ්‍රවල තිරසර බව ආරක්ෂා කර ගැනීම උදෙසා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙම වැඩසටහන හරහා ජලකාමී පැල ඇතුළු ජල මූලාශ්‍ර සඳහා වගා කිරීමට සුදුසු පැල ප්‍රභේද සිටුවීම මඟින් ජල මූලාශ්‍ර සංරක්ෂණය සිදු කිරීමට සැලසුම් කොට ඇත.

ඒ සඳහා ජලකාමී රුක් රෝපණය කිරීම සඳහා ජලකාමී පැල 15,000 ක් ලබාදීම සඳහා සැලසුම් කර ඇති අතර ඒ සඳහා රු.මි. 3.00 ක් ඇස්තමේන්තුගත කොට ඇත. ඒ අනුව 2025.09.30 දින වන විට රු.මි. 0.75 ක ජලකාමී පැල 5000 ක් ජල පෝෂක ප්‍රදේශයන්හි රෝපණය කරන ලදී.

ඡායාරූප අංක 61

## 2.3. ප්‍රජා සහභාගීත්ව ජල මූලාශ්‍ර සංරක්ෂණ සහ පවිත්‍රතා වැඩසටහන

ජල මූලාශ්‍ර සංරක්ෂණයට සමගාමීව දැනට පරිහානියට පත්ව ඇති හෝ අපිරිසිදු බවට පත්ව ඇති ජල මූලාශ්‍ර හඳුනාගෙන එම ජල මූලාශ්‍ර භාවිතයට ගනු ලබන ප්‍රජාව දැනුවත් කොට එම ප්‍රජාවගේ සහභාගීත්වය සහිතව මෙම ජල මූලාශ්‍ර පවිත්‍රතා ශ්‍රමදාන සහ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

ඒ අනුව, 2025 වර්ෂය තුල පවිත්‍රතා වැඩසටහන් 52 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා රු.මි. 1.56 ක් ඇස්තමේන්තුගත කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට පවිත්‍රතා වැඩසටහන් 33 ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු.මි. 0.85 ක් වැය කොට ඇත.

**අභිමතාර්ථය 03 : ආහාර සුලභතාවය සහ සුරක්ෂිතතාව තහවුරු වූ නිරෝගිමත්, සමෘධිමත් ප්‍රජාවක්**

## 3.1 වාණිජ ගෙවතු වගා ප්‍රවර්ධනය

ආහාර සුරක්ෂිතතාවය, වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම හා ගොවීන් වෙළඳපොල මත යැපීම අවම කරමින් ආර්ථික තත්වය ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් ගෙවතු වගාව සඳහා ගොවීන් දිරිගැන්වීමේ වැඩසටහනක් මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත.ඒ අනුව ගෙවතු වගාව සඳහා තෝරා ගනු ලබන ගොවීන් දිරි ගැන්වීම උදෙසා ගෙවතු පැල කට්ටල ලබාදීම, ගෙවතු වගාවට අවශ්‍ය කෘෂි උපකරණ කට්ටල, කාබනික දියර පොහොර ලබාදීමට අපේක්ෂා කෙරේ.

2025 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගේ වාණිජ ගෙවතු වගා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා කෘෂි යෙදවුම් ලබා දීම මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල, රත්නපුර, ගම්පහ ,කොළඹ හා පොලොන්නරුව යන දිස්ත්‍රික්කයන්ගේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 52ක් ආවරණය වන පරිදි ගෙවතු 1,700 ක් සකස් කිරීමට සැලසුම් කොට ඇත. ඒ සඳහා රු.මි. 17.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කොට ඇත.

2025.09.30 දින වන විට ප්‍රතිලාභින් 630 ක් සඳහා ගෙවතු පැල බඳුන් 18,058 ක් හා ප්‍රතිලාභින් 637ක් සඳහා දියර පොහොර 1,274 ක් ලබාදී ඇති අතර ඒ සඳහා රු.මි. 0.60 ක් වැය කර ඇත.

### 3.2 ආර්ථික බෝග වගා ප්‍රවර්ධනය

2025 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගේ ආර්ථික බෝග වගාව ප්‍රවර්ධනය උදෙසා පොල්, පුවක්, ගම්මිරිස්, වැනිලා, කුරුඳු, කෝපි,දෙහි ආදී ආර්ථික බෝග ලබා දිමට සැලසුම් කොට ඇත. ඒ සඳහා ආර්ථික බෝග පැල 30,600 ක් ලබාදීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන සඳහා රු.මි 7.50 ක ප්‍රතිපාදන මුදලක් ඇස්තමේන්තු තිබිණි. ඒ අනුව 2025.09.30 දින වන විට පැල 17,644 ක් ලබාදී ඇති අතර ඒ සඳහා රු.මි. 1.64ක් වැය කරන ලදී.

### 3.3 අතිරේක ආහාර බෝග ප්‍රවර්ධනය

2025 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් අතිරේක ආහාර බෝග වගා කිරීමට විභවතාවයක් සහිත ප්‍රා.ලේ කොට්ඨාශයන්ගේ අතිරේක ආහාර බෝග වගා කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. මෙම වැඩසටහන හරහා අතිරේක ආහාර බෝග බීජ කව්පි, මුං, රටකජු, කුරක්කන් ආදී බීජ ගොවීන් වෙත ලබාදීම සිදු වේ. ඒ අනුව 2025 වර්ෂයේ දී අතිරේක ආහාර බෝග හෙක්ටයාර 200ක් මෙම වැඩසටහන මඟින් වගා කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා රු.මි. 6.00 ක් වෙන් කර ඇති අතර 2025 වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට හෙක්ටයාර 53 ක් සඳහා බීජ ලබා දී ඇති අතර වෙන් කරන ලද මුදලින් රු.මි. 1.60 ක් ඒ සඳහා වැය කරන ලදී.

ඡායාරූප අංක 62

### 3.4 වගාවන් සඳහා වන සතුන්ගෙන් සිදුවන හානිය අවම කිරීම. (50% දායකත්වය මත)

2025 වර්ෂයේදී වන සතුන්ගෙන් සිදුවන වගා හානි අවම කිරීම උදෙසා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගේ ප්‍රතිලාභින් වෙත වායු රයිෆල් සහ විදුලි වැට ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන 50% ප්‍රතිලාභීදායකත්වය සහ 50% ආයතනික දායකත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇති අතර වායු රයිෆල් 1,000ක් සහ විදුලි වැට 100 ක් 2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන මඟින් ප්‍රතිලාභීන්ට ලබාදීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා රු.මි. 34.00 ක් වෙන් කර ඇති අතර 2025.09.30 දින වන විට ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇති අතර ප්‍රතිලාභින් සඳහා වායු රයිෆල් නිකුත් කිරීම ආරම්භ කෙරේ.

**අභිමතාර්ථය 04: ප්‍රශස්ථ යටිතල පහසුකම් ප්‍රවර්ධිත දැනුමින් හා තාක්ෂණයෙන් සවිබල ගැන්වූ නව කෘෂි ව්‍යවසායකයින්**

**4.1 වාණිජ මට්ටමේ මීමැසි පාලනය සඳහා දිරි ගැන්වීම (50% දායකත්වය මත)**

2025 වර්ෂයේදී වාණිජ මට්ටමේ මී මැසි පාලනය සිදු කරනු ලබන හෝ ඒ සඳහා කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුව සහ යෙදවුම් ලබාදීමට සැලසුම් කොට ඇත. 2025 වර්ෂයේදී දිවයිනේ තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ව්‍යවසායකයින් 25 දෙනෙකු සවිබල ගැන්වීමට සැලසුම් කොට ඇති අතර ඒක ප්‍රතිලාභියෙකු වෙත රු.100,000.00 ක මුදලක් ලබා දීමට සැලසුම් කොට ඇත. මේ සඳහා රු.මි. 2.50 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා සහ ව්‍යාපෘතීන්ගේ ශක්‍යතාවය පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිලාභ ලබාදීමට සැලසුම් කොට ඇත.

**4.2 බිම්මල් නිෂ්පාදනය කරන ව්‍යවසායකයින් බිහි කිරිම. (50% දායකත්වය මත)**

2025 වර්ෂයේදී වාණිජ මට්ටමේ බිම්මල් නිෂ්පාදනය සිදු කරනු ලබන හෝ ඒ සඳහා කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් හඳුනා ගනිමින් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුව සහ යෙදවුම් ලබාදීමට සැලසුම් කොට ඇත. 2025 වර්ෂයේදී දිවයිනේ තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ව්‍යවසායකයින් 25දෙනෙකු සවිබල ගැන්වීමට සැලසුම් කොට ඇති අතර ඒක් ප්‍රතිලාභියෙකු වෙත රු.100,000.00 ක මුදලක් ලබා දීමට සැලසුම් කොට ඇත.

ඒ අනුව, රු.මි. 2.50 ක් මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා සහ ඒම ව්‍යාපෘතීන්ගේ ශක්‍යතාවය අධ්‍යනය කිරීමෙන් අනතුරුව ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**4.3 අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යවසායකයින් බිහි කිරීම. (50% දායකත්වය මත)**

2025 වර්ෂයේදී කෘෂි නිෂ්පාදන අගය එකතු කිරීමේ ව්‍යවසායකයින් ලෙස ක්‍රියාකරන්නන් හෝ ඒ සඳහා කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් හඳුනා ගනිමින් ඒ් සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුව සහ යෙදවුම් ලබාදීමට සැලසුම් කොට ඇත. ඒ අනුව මෙම වර්ෂයේදී දිවයිනේ තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ව්‍යවසායකයින් 25 දෙනෙකු සවිබල ගැන්වීමට සැලසුම් කොට ඇති අතර එක් ප්‍රතිලාභියෙකු වෙත රු. මි. 0.25 ක මුදලක් ලබා දීමට සැලසුම් කොට ඇත.මේ සඳහා රු.මි. 6.25 ක් වෙන් කර ඇති අතර ව්‍යාපෘති යෝජනා සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**4.4 ව්‍යවසායක මට්ටමින් පළතුරු ගම්මාන ප්‍රචලිත කිරීම.**

පළතුරු බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම, ගොවි ආදායම් මාර්ග ඉහළ නැංවීම, පළතුරු ආනයන වියදම අවම කිරීම සහ පළතුරු අපනයනය දිරිමත් කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන 2025 ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහනට ඇතුලත් කර ඇත. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික්කයන්ගේ ක්ෂේත්‍ර නිලධාරින් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති වාර්තා සලකා බලා පළතුරු ගම්මාන ලෙස දියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව පළතුරු ගම්මාන 10 ක් සඳහා රු.මි. 25.00 ක් ඇස්තමේන්තුගත කොට ඇති අතර 2025.09.30 දින වන විට පලතුරු ගම්මාන සඳහා ව්‍යාපෘති වාර්තා 23 ක් ඉදිරිපත්ව තිබූ අතර පැල

ලබා දීම සඳහා රු.මි. 0.90 ක මුදලක් වැය කොට ඇත. ඉදිරියේදි අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කොට එම පැල ප්‍රතිලාභින් වෙත ලබා දීමට නියමිත වේ.

ඡායාරූප අංක 63

**අභිමතාර්ථය 05: සංරක්ෂණය වූ පරිසරයක්**

**5.1 පාසල් පාදක පාරිසරික වැඩසටහන්**

2025 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් 52 ක් තුළ වැඩසටහන් සිදු කිරීමට සැලසුම් කර ඇති අතර ගොවි ජනතාවගේ දූවා දරුවන් වැඩි වශයෙන් ඉගෙනුම ලබන පාසැල් තෝරා පාසල් ප්‍රජාවගේද පූර්ණ සහභාගීත්වය ඇතිව ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී පාසල් භූමිය තුළ පාංශු සංරක්ෂණය ප්‍රමුඛ බෝග වගා ආදර්ශයක් පිහිටුවීම, දැනට ඌන උපයෝජිත පාසැල් භූමි කොටසක් ඵලදායී කෘෂි භූමියක් බවට පත් කර නිෂ්පාදන ඒකකයක් ලෙස වැඩි දියුණු කිරීම, පාසැල් සිසුන් වෙත ලබා දෙන න්‍යායාත්මක කෘෂි දැනුම ප්‍රායෝගිකව අත්හදා බලන ස්ථානයක් පාසැල් පරිශ්‍රය තුළම ඇති කිරීම, කෘෂිකර්මයට, පරිසරයට ලැදියාවක් දක්වන අනාගත පරපුරක් බිහි කිරීමට දායකත්වයක් ලබා දීම වැනි කාර්යයන් මෙම වැඩසටහන මගින් ක්‍රියාත්මක කෙරේ. තෝරාගත් දිස්ත්‍රික්ක 9හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 52හි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. ඒ අනුව, ඒ සඳහා රු. මි. 1.30 ක මුදලක් වෙන් කර ඇත. 2025.09.30 වන විට වැඩසටහන් 22 ක් අවසන් කර ඇති අතර ඒ සඳහා රු. 0.47 ක් වැය කර ඇත.

**5.2 ප්‍රජා පාදක පාරිසරික වැඩසටහන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්**

2025 සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගේ ගොවි ප්‍රජාව ඒකාබද්ධ කොට ගනිමින් පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මෙම වැඩසටහන හරහා සැලසුම් කොට ඇත. මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල, රත්නපුර, ගම්පහ, කොළඹ සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්ගේ තෝරා ගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 52 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව මේ සඳහා රු.මි. 1.04 ක් වෙන්කර ඇති අතර 2025.09.30 වන විට වැඩසටහන් 47 ක් අවසන් කර ඇති අතර ඒ සඳහා රු. 0.99 ක් වැය කර ඇත.

ඡායාරූප අංක 64

**අභිමතාර්ථය 06: සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක්**

**6.1 අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන**

ග්‍රාමීය ප්‍රජාවගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සහ අතිරේක ආදායම් උත්පාදනය වැඩසටහන සඳහා තෝරා ගන්නා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 52හි ගොවි පවුල් සඳහා කුකුළු පැටවුන් 62,000 ක් ලබා දීමට සැලසුම් කොට ඇති අතර රු.මි. 52.70 ක් වෙන් කර ඇත. 2025.09.30 දින වන විට කුකුල් පැටවුන් 27,290 ක් ප්‍රතිලාභින් අතර බෙදා දී ඇති අතර ඒ සඳහා රු.මි. 23.20 ක් වැය කර ඇත.

ඡායාරූප අංක 65

**6.2 ග්‍රාමීය ප්‍රජාව අතර බිත්තර දමන කුකුළු පාලනය (Layer Chicks) ප්‍රවර්ධනය කිරීම**

වෙළඳපොල පවතින බිත්තර ඉල්ලුමෙහි සහ සැපයුමෙහි පවතින අසමතුලිතය හේතුවෙන් වාර්ෂිකව බිත්තර සඳහා වන වෙළඳපොල මිල නිරන්තර වෙනස් වීමට භාජනය වේ. ජාතික මට්ටමින් මේ ගැටළුව අවම කර ගැනීමට දායකත්වයක් ලබාදීමේ අරමුණින් ග්‍රාමීය ප්‍රජාව සඳහා බිත්තර දමන

කිකිලියන් (Layer Chicks) ලබාදීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2025 වර්ෂයේ කුකුළු පැටවුන් 50 බැගින් ප්‍රතිලාභීන් 210 දෙනෙකු වෙත ලබාදීමට අපේක්ෂිත වේ. තවද කුකුළු නිවාස සැකසීම සඳහා රු. 45,000ක ද්‍රව්‍යමය ආධාර ලබාදීමට නියමිත වේ. මෙම වැඩසටහන 50% ප්‍රතිලාභීදායකත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. ඒ අනුව ව්‍යවසායකයින් 209ක් බිහිකිරීම සඳහා රු.මි. 20 ක් වෙන් කර ඇත. 2025.09.30 දින වන විට ප්‍රතිලාභි පවුල් 79 ක් සඳහා පැටවුන් 4,850 ක් ලබා දී ඇති අතර රු.මි. 6.48 ක් වැය කර ඇත.

ඡායාරූප අංක 66

**අභිමතාර්ථය 07: ගොවි ජනතාව කෘෂි තාක්ෂණික දැනුමෙන් සවිබල ගැන්වීම**

**7.1 ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වා සවිබල ගැන්වීම හා ගොවිතැනට යොමු කිරීම.**

2025 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන් සඳහා තෝරාගනු ලබන ගොවි ප්‍රජාව සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙම වැඩසටහන හරහා සිදු කෙරේ. තෝරා ගනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තාක්ෂණික පුහුණු වැඩසටහන් සඳහා ඒක් වැඩසටහනකට රු. මි. 0.02 ක් බැගින් දිවයින පුරා වැඩසටහන් 104 ක් සඳහා රු.මි. 2.08 ක් වෙන් කර ඇත. ඒ අනුව, 2025.09.30 දිනට ගොවි පුහුණු වැඩසටහන් 88 ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු.මි. 1.59 ක් වැය කොට ඇත.
ඡායාරූප අංක 67

**7.2. සමාජ සජීවීකරණය තුලින් සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් (PRA) හරහා ගොවි ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම.**

සහභාගීත්ව සංවර්ධන ගැමි පිවිසුම් වැඩසටහන් හරහා ගොවි ප්‍රජාවගේ අවශ්‍යතාව හඳුනා ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කරවීම හා ගොවි ජනතාව කෘෂි තාක්ෂණික දැනුමෙන් සවිබල ගැන්විම මෙම වැඩසටහනෙහි අරමුණ වේ. 2025 සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක දිස්ත්‍රික්ක 09 හි තෝරාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 52ක් තුළ සහභාගීත්ව ගැමි පිවිසුම් වැඩසටහන් 52 ක් පැවැත්වීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2025 වර්ෂයට අදාළව මේ සඳහා රු.මි. 1.25 ක මුදලක් වෙන් කර ඇති අතර 2025.9.30 වන විට සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කර අවසන් කර ඇත.

# පශු සම්පත් අංශය

## වැය ශීර්ෂ අංක 118 යටතේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

**1. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසාන වන විට වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දක්වා)**

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය | 69.00 | 7.21 | 11 |
| 2 | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය) | 150.00 | 18.27 | 12 |
| 3 | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන ආධාර) | 100.00 | 9.17 | 09 |
| 4 | එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | 200.00 | 0.005 | 0.003 |

**2. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසාන වන විට සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය**

**දේශීය සංවර්ධන ව්‍යාපෘති**

### 2.1. සත්ත්ව අභිජනන සහ ගොවිපොළ සංවර්ධනය

#### 2.1.1 සත්ත්ව අභිජනනය සහ ගොවිපොළ සංවර්ධන වැඩසටහන

සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනය සඳහා රු.මි. 62.57 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් උතුරු මැද, ඌව, නැගෙනහිර හා සබරගමුව යන පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇත. එහි ප්‍රගතිය පහත පරිදි වේ.

| පළාත/ ආයතනය | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මි.) | ප්‍රගතිය |
|---|---|---|---|
| ඌව පළාත | බොරලන්ද ගොවිපොළෙහි අභිජනන ඒකකය සංවර්ධනය කිරීම | 4.00 | ව්‍යාපෘති යෝජනා සහ ප්‍රමාණාත්මක බිල්පත් (BOQ) අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත. |
| උතුරු මැද පළාත | තිරප්පනේ ගොවිපොළෙහි අභිජනන ඒකකය සංවර්ධනය | 4.00 | |
| සබරගමු පළාත | උඩුගොඩ ගොවිපොළෙහි අභිජනන ඒකකය සංවර්ධනය | 4.00 | මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපහසු බව අදාළ පළාත් දෙපාර්තමේන්තු විසින් දන්වා ඇත. |
| නැගෙනහිර පළාත | සුදු ගව ජාන සංරක්ෂණ වැඩසටහන | 4.00 | |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | බෝපත්තලාව හා නිකවැරටිය ගොවිපොළවල ගව නිවාස සංවර්ධනය කිරීම | 12.00 | සැපයුම්කරු තෝරා ගෙන ඇති අතර ඉදිකිරීම් ආරම්භ කර ඇත. |
| | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් උසස් ආරයේ ගව ශුක්‍ර වඩි ආනයනය කිරීම හා ගව ශුක්‍ර ගබඩා පහසුකම් සැලසීම | 30.00 | තාක්ෂණික ඇගයීමේ කමිටුව විසින් ඇගයීමේ කටයුතු සිදු කරමින් පවතී. |

| පළාත්/ ආයතනය | ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මි.) | ප්‍රගතිය |
|---|---|---|---|
| නිලධාරීන් හා ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | | 2.77 | ජාතික කිරි නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් පළාත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. |
| ව්‍යාපෘති අධීක්ෂණය සහ පරිපාලන වියදම් | | 1.80 | |
| **මුළු ප්‍රතිපාදනය** | | **62.57** | |

### 2.1.2 මූල්‍ය බැදීම් - 2024

2024 වර්ෂයේ ක්‍රියාත්මක වූ, සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ගෙවීමට තිබූ රු.මි. 6.43ක මුදල මේ හරහා ගෙවා ඇත.

## 3. කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (යටිතල පහසුකම් සංවර්ධනය)

### 3.1. මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවතාව තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ අර්ධ වශයෙන් ඉදිකළ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාලය සම්පූර්ණ කිරීම වෙනුවෙන් 2025 වසර සඳහා රු.මි. 40.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඉදිකිරීම් කටයුතුවලින් 90% ක් පමණ මේ වන විට අවසන් කර ඇති අතර ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා රු.මි. 6.84 ක් ගෙවීම් සිදු කර ඇත.

ඡායාරූප අංක 01

### 3.2. කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

දිනක් වයසැති කිකිළි පැටවුන් ගොවීන් වෙත සාධාරණ මිලකට ලබා දීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් මාරවිල ගොවිපොළෙහි, බිත්තර දමන කුකුළු අභිජනන ඒකකයේ ධාරිතාව පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් මව් සතුන් 5,000 ක් සඳහා සංවෘත කුකුළු නිවාසය ස්ථාපනය සඳහා රු.මි. 49.00 ක් වෙන් කර ඇත. මෙහි ප්‍රසම්පාදන කටයුතු අවසන් කර කොන්ත්‍රාත්තුව පිරිනමා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.
ඡායාරූප අංක

### 3.3. කිරි නිෂ්පාදන සංවර්ධන වැඩසටහන

බුරුලු ප්‍රදාහය (Mastitis) රෝගය කිරිවල ගුණාත්මකභාවය හා ප්‍රමාණය මත සැලකිය යුතු බලපෑමක් ඇති කරන ප්‍රධාන රෝගයක් වන අතර, මෙම ව්‍යාපෘතිය මඟින් රෝගය වැළැක්වීම හා පාලනය කිරීම තුළින් ගොවිපොළ මට්ටමින් කිරිවල ගුණාත්මකභාවය හා ප්‍රමාණය සැළකිය යුතු ලෙස ඉහළ නැංවීම මෙහි අරමුණයි. බුරුලු ප්‍රදාහ රෝගය හඳුනාගැනීම හා මර්දනය සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීම හා ගොවීන් අතර ගුණාත්මක කිරි නිෂ්පාදනය පිළිබඳ අවබෝධය ලබා දීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය මේ යටතේ සිදු කෙරේ. මේ සඳහා වෙන් කර ඇති මුදල රු.මි. 35.00 කි.

මෙම ව්‍යාපෘතිය පළාත් 06 කට අයත් සහ දිස්ත්‍රික්ක 13 ක් තුළ (යාපනය, වව්නියාව, මුලතිවු, මන්නාරම, කිලිනොච්චිය, මඩකලපුව, ත්‍රිකුණාමලය, මොණරාගල, රත්නපුරය, කෑගල්ල, මාතර, කොළඹ සහ කළුතර) ක්‍රියාත්මක කෙරේ. බස්නාහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය පළාත් අරමුදල් මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර, උතුරු, නැගෙනහිර, ඌව, සබරගමුව හා දකුණු පළාත්වල අනුමත කර ඇති ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

### 3.4. අපනයන පහසුකරණ ව්‍යාපෘතිය

මේ සඳහා 2025 වර්ෂයේදී වෙන් කර ඇති ප්‍රතිපාදන රු.මි. 10.00 කි. විසිතුරු මත්ස්‍ය අපනයනය සහ කුකුල් මස්, බිත්තර අපනයනයට පවතින දැඩි විභවතාවය හඳුනාගෙන එම නිෂ්පාදන අපනයනය තුළින් රටට විදේශ විනිමය වැඩි වශයෙන් උපයාදීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණයි. දැනටමත් සිදු කරන අපනයනවලට අමතරව නව අපනයන ප්‍රභවයන් හඳුනාගැනීමත් අපනයන ප්‍රමාණය ඉහළ නැංවීමත් අරමුණු වේ

එසේම, වර්තමාන රජයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශයේ පශු සම්පත් හා ජලජ සම්පත් අපනයන ප්‍රවර්ධනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇත. ඒ අනුව, සතුන් හා සත්ත්ව අපනයන ප්‍රවර්ධනය/ දිරිගැන්වීම හා අපනයන ක්‍රියාවලිය විධිමත් කිරීමේ අභිප්‍රාය ඇතිව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ආදී අදාළ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් අපනයන පහසුකරණය සඳහා සකස් විය යුතු ප්‍රතිපත්ති, මාර්ගෝපදේශයන් සකස් කිරීම සහ අපනයන විභවතාවයන්, අවධානය යොමු කළ යුතු අඩුලුහුඩුකම් සහ අපනයනකරුවන්ගේ ගැටළු හා අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කරමින් අපනයනයට සම්බන්ධ ආයතන අතර මනා සම්බන්ධීකරණක් පවත්වා ගනිමින් හඳුනා ගත් කරුණු සහ ඉන් අනතුරුව අපනයනකරුවන් හමුවේ දී හඳුනා ගන්නා අවශ්‍යතා අනුව අපනයන පහසුකරණ වැඩපිළිවෙල පෙළගස්වා ගැනීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කෙරේ. මෙම වැඩසටහන යටතේ අදාළ අපනයනකරුවන් හා රාජ්‍ය ආයතන එක්රැස් කොට අපනයනයට අදාළ ගැටලු හඳුනාගැනීම සඳහා දැනටමත් සාකච්ඡා පවත්වා ඒ සඳහා කමිටු පත්කිරීම සිදුකර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී

ඡායාරූප අංක 02

### 3.5 . ධාරිතා සංවර්ධන වැඩසටහන

2025 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 5.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්වී ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වනුයේ නිළධාරීන්ගේ, ගොවීන්ගේ හා තරුණ ව්‍යවසායකයන්ගේ ධාරිතා සංවර්ධනය හා පශු සම්පත් ප්‍රතිපත්ති සම්පාදනය ආදියයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට මේ යටතේ රු.මි. 0.12 ක් වැය කර ඇත. "Dairy Hub" වඩසටහන හා කිරි නිෂ්පාදන සැලැස්ම පිළිබඳව ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර, නිකේත සත්ත්ව පාලනය සඳහා බුරුවන් ඇති කිරීමේ ව්‍යාපෘතියට අදාළව සාකච්ඡාවන් පැවැත්වීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් සිදු වෙමින් පවතී.

### 3.6. මූල්‍ය බැඳීම් - 2024

2024 වර්ෂයේ ක්‍රියාත්මක වූ, සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘතිය සඳහා ගෙවීමට තිබූ රු.මි. 11.00 ක මුදල මේ හරහා ලබා දී ඇත.

## 4. කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය (සංවර්ධන ආධාර)

### 4.1. කිරි සංවර්ධන ව්‍යාපෘතිය

2025 වසරේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පශු සම්පත් සංවර්ධන අංශය විසින් කිරි ගවයින්ගේ පෝෂණය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව කිරිගව සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි. 72.00 ක් වෙන් කර ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘතීන් දෙකක් ක්‍රියාත්මක කෙරේ.

- **කිරි ගවයින්ගේ පෝෂණය වැඩිදියුණු කිරීම (තෘණ සංවර්ධන වැඩසටහන)**

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද ගුණාත්මක තෘණ ප්‍රභේද හඳුන්වාදීම සහ වැඩිදියුණු කළ පෝෂණ කළමනාකරණ භාවිතයන් මගින් සුළු පරිමාණ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් අතුරින් තෝරා ගත් ප්‍රතිලාභීන් 22 ක් වෙත විසිරි ජල සම්පාදන පද්ධති සහ අදාළ උපකරණ, සයිලේජ් නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආදි යෙදවුම් ලබා දීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය විසින් දරන උපරිම දායකත්වය රු. 150,000.00ක් වන අතර එය අදාළ ව්‍යාපෘති පිරිවැයෙන් 50% ක් වේ. ඉතිරි 50% දායකත්වය ප්‍රතිලාභියා විසින් දරනු ලැබේ. මේ වන විට මධ්‍යම, දකුණු, උතුරු සහ උතුරු මැද පළාත්වල ප්‍රතිලාභීන් 13 දෙනෙකු සඳහා අනුමැතිය ලබා දී, ඒ සඳහා අදාළ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත රු.මි. 01.99 ක ප්‍රතිපාදන ලබා දී ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී. අනෙකුත් පළාත්වල ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

- **කිරිගව සංවර්ධන වැඩසටහන (තෘණ සංවර්ධන වැඩසටහන)**

ගුණාත්මක සත්ත්ව ආහාර සුලබ කිරීම, කිරි ගවයින්ගේ පෝෂණ මට්ටම නංවාලීම සඳහා වැඩිදියුණු කළ තෘණ ප්‍රභේද වගා කිරීම දිරිමත් කිරීම, ආදායම් උත්පාදන ක්‍රියාකාරකමක් ලෙස තෘණ සහ සයිලේජ් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ජලය කාර්යක්ෂමව භාවිත කිරීම වැඩිදියුණු කිරීම උදෙසා තෘණ වගාව සඳහා නව තාක්ෂණයන් හඳුන්වා දීම උදෙසා මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 445 දෙනෙකු වෙත බිම් සකස් කිරීම, තෘණ වගාව ස්ථාපිත කිරීම, මායිම් වැට සකස් කිරීම යනාදී කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය විසින් දරන උපරිම දායකත්වය රු.150,000.00ක් වන අතර එය අදාළ ව්‍යාපෘති පිරිවැයෙන් 50% ක් වේ. ඉතිරි 50% දායකත්වය ප්‍රතිලාභියා විසින් දරනු ලැබේ. මේ වන විට උතුරු පළාතේ ප්‍රතිලාභීන් 166 ක් සඳහා අනුමැතිය ලබා දී, ප්‍රතිලාභීන් 112 දෙනෙකුට අදාළව උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත රු.මි. 17.14 ක ප්‍රතිපාදන ලබා දී ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී. අනෙකුත් පළාත්වල ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

### 4.2. සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

මේ ව්‍යාපෘතිය යටතේ, සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යනු ලබන තිරසාර කුඩා පරිමාණ බිත්තර දමන කුකුළු ඒකක පිහිටුවීම සඳහා රු.මි. 10.00 ක් වෙන් කර ඇත.

මේ යටතේ, ග්‍රාමීය ප්‍රජාව තුළ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම හා ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් ජීවන තත්ත්වය නඟාසිටුවීම අරමුණු කරගෙන කුඩා පරිමාණ බිත්තර දමන කුකුළු ඒකක පිහිටුවීමට අපේක්ෂා කෙරේ. එහිදී සෞඛ්‍යාරක්ෂිතව පැටවුන් රැකබලා ගැනීම තුළින් තිරසාරව මෙම ව්‍යාපෘතිය වසර කිහිපයක් පවත්වා ගැනීම සඳහා එක් ප්‍රතිලාභියකු වෙත මසක් වයසැති ගම් කිකිළි පැටවුන් 25 ක් ලබා දීම සිදු කෙරේ. මෙම පැටවුන් 25 අවශ්‍යතාවය මත උපරිම පිරිමි කුකුළු පැටවුන් 3 ක් ලබා දීමේ හැකියාව පවතින අතර, ප්‍රතිලාභියාගේ 50% දායකත්වය යටතේ කූඩුව සාදා ගැනීම, කෑම සපයා ගැනීම හා නඩත්තුව සිදු කළ යුතු වේ. මෙම වැඩසටහන උතුරු මැද, උතුර හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන අතර, මේ වන විට රු.මි. 9.86 ක් ප්‍රතිපාදන පළාත් ප්‍රධාන ලේකම් වෙත නිදහස් කර පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. අදාළ පළාත් විසින් දැනටමත් සතුන් බෙදාදීමේ කටයුතු ආරම්භ කර ඇත.

ඡායාරූප අංක 03

### 4.3. සූකර සංවර්ධන වැඩසටහන

පාරිසරික ගැටළු අවම කර පරිසර හිතකාමී සූකර ගොවිපොළ සංවර්ධනය සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර, සූකර ගොවිපළවල් 61 ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි. 12.60 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

එහෙත්, මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රු.මි. 12.60 ක ප්‍රතිපාදන අප්‍රිකානු සූකර උණ වෛරස් රෝගය හේතුවෙන් කඩා වැටී ඇති සූකර කර්මාන්තය නඟා සිටුවීම සඳහා වූ ජාතික කාර්ය සාධන බලකා කමිටු තීරණය අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට නිදහස් කර ඇති අතර, මේ වන විට පරික්ෂණ කට්ටල මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

### 4.4. මූල්‍ය බැදීම් - 2024

2024 වර්ෂයේ ක්‍රියාත්මක වූ, සත්ත්ව අභිජනනය හා ගොවිපොළ සංවර්ධනය ව්‍යාපෘතිය සඳහා ගෙවීමට තිබූ රු.මි. 5.40 ක මුදල මේ හරහා ලබා දී ඇත.

## 5. එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධනය ව්‍යාපෘතිය

2025 වසරේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පශු සම්පත් සංවර්ධන අංශය විසින් එළු කිරි හා එළු මස් සුලභ කිරීමේ අරමුණින් යුතුව එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධනය ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘතීන් දෙකක් ක්‍රියාත්මක කෙරේ.

- **සංවර්ධනය සහායන් ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 100.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. එළු ගොවිපළ ඒකක වැඩිදියුණු කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය යටතේ එළු ගොවිපල 445 ක් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මෙහිදී දැනටමත් පිහිටුවා ඇති එළු ගොවිපොළ සඳහා සතුන් ලබා දීමට යෝජිතය. මෙම ව්‍යාපෘතිය පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර, මෙහිදී එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය විසින් දරන උපරිම දායකත්වය යටතේ සතුන් 10 ක් මිලදී ගැනීමට (ගැහැණු සතුන් 09 හා පිරිමි සතුන් 01) රු. 300,000 ක් හෝ සතුන් 05ක් මිලදී ගැනිමට (ගැහැණු සතුන් 04 හා පිරිමි සතුන් 01) රු.150,000 ක් ලබා දෙන අතර, එය අදාළ ව්‍යාපෘති පිරිවැයෙන් 50% ක් වේ. ඉතිරි 50% දායකත්වය ප්‍රතිලාභියා විසින් දරනු ලැබේ. මේ වන විට බස්නාහිර, මධ්‍යම දකුණු හා උතුරු පළාත්වල ප්‍රතිලාභීන් 155 දෙනෙකු සඳහා අනුමැතිය ලබා දී ඒ සඳහා අදාළ පළාත් සත්ත්ව

නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත රු.මි. 28.00 ක ප්‍රතිපාදන ලබා දී ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී.

ඡායාරූප අංක 04

- **යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල රු.මි. 100.00 කි. රට තුළ පවතින එළු මස් අවශ්‍යතාවයට දායක වීම සඳහා මස් නිෂ්පාදනය අරමුණු කරගෙන බෝයර් එළුවන් හඳුන්වා දීම, බෝයර් එළුවන් ඇති කිරීම ප්‍රවර්ධනය කිරීම සහ බෝයර් එළු ගොවිපොළ ආරම්භ කිරීම සඳහා ගොවීන් වෙත අභිජනන ද්‍රව්‍ය ලබා දීම අරමුණු කර ගෙන මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ බෝපත්තලාව ගොවිපොළෙහි, එළු අභිජනන ගොවිපොළ පිහිටුවීම සඳහා බෝයර් එළුවන් 100ක් ආනයනය කිරීමට සැලසුම් කර ඇත. මෙහි ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී.

මෙයට අමතරව අභිජනන ගොවිපල සහ අභිජනන ද්‍රව්‍යවල නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි කිරීම, ගොවිපලෙහි යටිතල පහසුකම් වැඩි කිරීම සහ තෘණ වගාවේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීම උදෙසා උතුරු පළාතේ, වව්නියාව, වෙක්කඩිපුලාවු ප්‍රාදේශීය පශු සම්පත් ගොවිපලෙහි ස්ථාපිත කර ඇති පළාත් එළු අභිජනන ගොවිපල වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 2025 වර්ෂයේ විදේශ අරමුදල් මත ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 1. අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය - සංරචක II (Inclusive Connectivity Development Project – ICDP)

ලෝක බැංකු ණය ආධාර යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලබාදී ඇති මෙම ව්‍යාපෘතියේ කෘෂිකර්මයට අදාළ සංරචක II කොටස පශු සම්පත් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. එමගින් දිවයිනේ තෝරාගත් දිස්ත්‍රික්ක 12 ක "කිරි ගොවීන් සංවිධානගත කර බලගැන්වීම මගින් ඔවුන්ගේ නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සහ කිරි අගයදාමය වැඩිදියුණු කිරීම" අරමුණු කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

මෙහිදී කිරි අගය දාමය වැඩිදියුණු කිරීම සහ සැපයුම් දාමය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මූලික යෙදවුම් වන ගොවිපොළවල නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමෝපායික ප්‍රවේශයන් හඳුන්වා දීම තුළින් ක්‍රමවත් නිෂ්පාදන සැලැස්මක් ඇති කිරීම සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණය සහ යෙදවුම් හඳුන්වා දීම, විකල්ප බලශක්ති ප්‍රභවයන් ලෙසින් සූර්ය බලශක්තිය උපයෝගී කර ගනිමින් කිරි ශීතකළ හැකි උපකරණ හඳුන්වා දීම, තෘණ වගාකරුවන් බිහි කිරීම සහ ඔවුන් ව්‍යවසායකයින් බවට පරිවර්තනය කිරීම, සවස කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කිරීම සඳහා කිරි ශීතකිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම මෙන්ම බුරුළු ප්‍රදාහය ඇතුළු ආර්ථිකව වැදගත්වන රෝග පාලනය කිරීමට මෙන්ම ව්‍යාප්ති සේවාවන් ක්‍රමානුකූල කිරීමටද අදහස් කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 3,000.00 කි.

මෙම ව්‍යාපෘතියේ කටයුතු 2025 මැයි මාසයේ සිට ආරම්භ කරන ලදී. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2025.06.26 දින ලැබුණු අතර, මේ වන විට පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා ඇත. ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමට අදාළ මොඩියුල සකස් කර ඇත.

## පශු සම්පත් විෂය පථය යටතේ ඇති ආයතන මගින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

## 01. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රාජ්‍ය ආයතනය වන අතර එය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර; සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත් වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 1.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 753.6 |
| 2 | පුනරාවර්තන වියදම් | 1,040.4 |

### 1.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | | | 200.00 |
| | කෘත්‍රිම සිංචන මෙහෙයුම් වැඩසටහන | නිපදවන ලද ගව ශුක්‍ර වඩි ගණන | 220,000 | |
| | | ආනයනය කළ ගව ශුක්‍ර වඩි ගණන | 2,000 | |
| | | පැටවු උපත් සංඛ්‍යාව | 100,000 | |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| | කෘතිම සිංචන පුහුණු වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | 18 | |
| | සත්ත්ව ආහාර සම්පත් සංවර්ධන වැඩසටහන | | | |
| | ඉඹුලන්දණ්ඩ තෘණ සම්පත් සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ අක්කර 10 ක වපසරියක් තුළ වැඩිදියුණු කළ තෘණ හා රනිල ප්‍රභේද ස්ථාපනය කිරීම | ස්ථාපනය කළ අක්කර ප්‍රමාණය | අක්කර 10 | |
| | තෘණ සංවර්ධන ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම | ලියාපදිංචි වී ඇති තෘණ සංවර්ධන ව්‍යවසායකයින් සංඛ්‍යාව | 50 | |
| | වැඩි දියුණුකල තෘණ වර්ගවල රෝපණ ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම | නිකුත් කරන ලද රෝපණ ද්‍රව්‍ය සංඛ්‍යාව | ඉල්ලුම අනුව | |
| 2. | සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන | එන්නත්කරණයට ලක්වූ සතුන් සංඛ්‍යාව | කුර හා මුඛ- 360,000<br>කාලගාත්‍රා- 81,000<br>ගව රක්තාශ්‍රව- 112,500 | 20.00 |
| 3 | කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය | නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි සංඛ්‍යාව | 300,000 | 40.00 |
| 4 | බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන | නිෂ්පාදනය කරන ලද බුරුළු නික්ෂේපණ සංඛ්‍යාව | 30,000 | 20.00 |
| 5 | උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම | නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි සංඛ්‍යාව | | 20.00 |
| | | ගව රක්තාශ්‍රව (HS) | 170,000 | |
| | | කාලගාත්‍රා (BQ) | 130,000 | |
| | | රානිකට් (ND) | මිලියන 8 | |
| | | කුකුළු කොළරාව,<br>සූකර පැස්චරෙල්ලා | ඉල්ලුම අනුව | |
| 6 | කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | කුරුළු උණ රෝගය ආවේක්ෂණය සඳහා පරීක්ෂා කරන ලද සාම්පල ගණන | 32,250 | 10.00 |
| | | සැල්මොනෙල්ලා රෝග පාලනය සඳහා පරීක්ෂා කරන ලද අභිජනන හා බීජ රක්කවනාගාර සංඛ්‍යාව | 286 | |
| | | අධීක්ෂණය කරනු ලබන අපනයන මධ්‍යස්ථාන ගණන | 10 | |
| 7 | පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ ව්‍යාපෘ තිති ගණන | 23 | 100.00 |
| | | රසායනාගාර පරීක්ෂාවට ලක් කරන ලද සාම්පල් ගණන | 65,000 | |
| 8 | පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම (ප්‍රධාන කාර්යාලය හා පලාත් කාර්යාලවල ඩිජිටල්කරණ වැඩසටහනට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම) | උපකරණ මිලදී ගැනීම ප්‍රතිශතයක් ලෙස | 100% | 20.00 |
| 9 | සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | කන් සළකුණු කිරීම් සිදුකරන ලද සතුන් සංඛ්‍යාව | 100,000 | 10.00 |

<table>
<tr><th>අ/අ</th><th>වැඩසටහන</th><th>මිනුම් ඒකකය</th><th>ඉලක්කය</th><th>මුළු පිරිවැය (රු.මි.)</th></tr>
<tr><td>10</td><td>සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය</td><td>සැලසුම් කරන ලද ඉදිකිරීම් වලින් ප්‍රතිශතයක් ලෙස</td><td>100%</td><td>5.00</td></tr>
<tr><td>11</td><td>වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන</td><td>සිදු කරනු ලබන පශ්චාත් මරණ පරික්ෂණ සංඛ්‍යාව</td><td>140</td><td>2.00</td></tr>
<tr><td>12</td><td>සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම</td><td>විශ්ලේෂණය කරන ලද සත්ත්ව ආහාර සාම්පල ගණන</td><td>5,000</td><td>30.00</td></tr>
<tr><td>13</td><td>සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම</td><td>සීප්පුකුලම හා කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලවලින් බිහිවන පශු සම්පත් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරී සිසුන් ගණන</td><td>50</td><td>40.00</td></tr>
<tr><td>14</td><td>පශු විමර්ශන මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම</td><td>සේවා සපයන ලද ගොවිපල සංඛ්‍යාව</td><td>70</td><td>2.00</td></tr>
<tr><td>15</td><td>කුණ්ඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම තුළින් තත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා බෙදා හැරීම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය</td><td>ආනයනය කරන ලද ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත. ආරයෙන් උසස් ගොනුන් සංඛ්‍යාව</td><td>15</td><td>150.00</td></tr>
<tr><td rowspan="5">16.1</td><td>තත්ත්ව ආරක්ෂණ වැඩසටහන</td><td></td><td></td><td rowspan="11">20.00</td></tr>
<tr><td>සත්ත්ව ආහාරවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් සහතික කිරීම</td><td>ලියාපදිංචි නිෂ්පාදන සංඛ්‍යාව</td><td>4,000</td></tr>
<tr><td>සත්ත්ව ආහාර සහ සත්ත්ව අහාරවල අඩංගු ද්‍රව්‍ය නියාමනය මගින් ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම</td><td>පූර්ව නිෂ්කාශන අනුමත කිරීම් ගණන</td><td>6,500</td></tr>
<tr><td>සම්මත ඇගයීම් ක්‍රියාවලීන් සමඟ පශු ඖෂධ නිෂ්පාදන සහ ජීව විද්‍යාත්මක නිෂ්පාදන නියාමනය සහ ලියාපදිංචි කිරීම/බලපත්‍ර ලබාදීම</td><td>ලියාපදිංචි කිරීම්/අලුත් කිරීම් ගණන</td><td>ඉල්ලුම අනුව</td></tr>
<tr><td>කුකුළු මුතුන් මිත්තන් සහ දෙමාපිය පරම්පරාවේ අභිජනන ගොවිපළ ස්ථාපනය කිරීමට අදාළ මූලික කටයුතු කිරීම හා අපනයන ආයතන ආවේක්ෂණ ලියාපදිංචි කිරීම</td><td>ලියාපදිංචි කිරීම්/අලුත් කිරීම් ගණන</td><td>240</td></tr>
<tr><td rowspan="2">16.2</td><td rowspan="2">සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන</td><td>සිදුකළ අධ්‍යයනයන්/සමීක්ෂණ සංඛ්‍යාව</td><td>04</td></tr>
<tr><td>එළිදක්වන ලද ප්‍රකාශන සංඛ්‍යාව</td><td>07</td></tr>
<tr><td rowspan="2">16.3</td><td rowspan="2">පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන (ප්‍රධාන කාර්යාලය හා පලාත් වලට)</td><td>නිෂ්පාදනය කරන ලද රූපවාහිනී/ගුවන්විදුලි වැඩසටහන් සංඛ්‍යාව</td><td>ගු.වි.වැ. -90 රූපවාහිනී සහ වීඩියෝ.වැ. - 175</td></tr>
<tr><td>පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව</td><td>ඉල්ලුම අනුව</td></tr>
<tr><td>16.4</td><td>පොත් හා ප්‍රකාශන වැඩසටහන</td><td>පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම</td><td>අවශ්‍යතාවය පරිදි</td></tr>
</table>

**1.4. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)**

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 717.00 | 204.22 | 29 |
| 2 | පුනරාවර්තන වියදම් | 903.00 | 677.54 | 75 |
| | | | | |
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| 1 | සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | 190.00 | 82.63 | 44 |
| 2 | පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | 85.00 | 25.20 | 30 |
| 3 | උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම | 24.00 | 5.91 | 25 |
| 4 | කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය | 45.00 | 2.76 | 06 |
| 5 | සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන | 41.00 | 32.90 | 80 |
| 6 | බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන | 20.00 | 8.36 | 42 |
| 7 | සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම | 20.00 | 9.59 | 48 |
| 8 | සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | 20.00 | 0.08 | 0.40 |
| 9 | වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන | 2.00 | 0.83 | 42 |
| 10 | පශු විමර්ශන මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම | 5.00 | 0.76 | 15 |
| 11 | තත්ත්ව ආරක්ෂණ වැඩසටහන, සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන, පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන, පොත් හා ප්‍රකාශන වැඩසටහන | 22.00 | 2.94 | 13 |
| 12 | ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණයට සත්ත්ව ආහාර හා පශු නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම | 40.00 | 0.87 | 2 |
| 13 | පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | 15.00 | 3.98 | 27 |
| 14 | කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | 10.00 | 2.11 | 21 |
| 15 | සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය | 5.00 | 0.23 | 5 |
| 16 | කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම තුළින් තත්ත්වයෙන් උසස් ගව ශුක්‍ර වඩී නිෂ්පාදනය හා බෙදාහැරීම ඉහළ නැංවීම | 100.00 | 2.22 | 2 |

**1.5. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය (2025.09.30 දිනට)**

**1.5.1. මානව සම්පත් සංවර්ධන අංශය**

**1.5.1.1 සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම**

කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ පශු සම්පත් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 6) සඳහා සිසුන් 46 ක් දැනට පුහුණුව ලබන අතර, එම සිසුන්ගේ විභාග පැවැත්වීම හා ගොවිපොළ අලුත්වැඩියාව සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ කටයුතු 70% ක් පමණ සිදුවී ඇත. සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ නේවාසිකව සිසුන් 25ක් සිටින අතර, මුළු සිසුන් 45 ක්

(NVQ 04) පාඨමාලාව හදාරනු ලැබේ. එමෙන්ම සීප්පුකුලම විද්‍යාලයේ අලුත්වැඩියා කටයුතු මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. උක්ත පාඨමාලා හදාරන සිසුන් එම විෂය කරුණු වලට සමගාමීව ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල ද නිරතවේ.

ඡායාරූප අංක 05 - 07

#### 1.5.1.2 පුහුණු ධාරිතාව ඉහළ නැංවීම

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් 37 ක් පවත්වා ඇති අතර, කාර්යක්ෂමතා කඩඉම් විභාග I /II/III යටතේ විභාග 06 ක් පවත්වා ඇත. පශු පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමේ විභාග 01 ක් පවත්වා ඇත.

#### 1.5.1.3 පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන

ගුවන්විදුලි ප්‍රචාරණ වැඩසටහන් 45 ක් සහ රූපවාහිනී හා වීඩියෝ වැඩසටහන් 108 ඉදිරිපත් කිරීමට හැකි වී ඇත. පශු සම්පත ප්‍රචලිත කිරීමේ මාධ්‍ය වැඩසටහනට සමගාමීව පොත් 09 ක් මුද්‍රණය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

#### 1.5.1.4 පොත් හා ප්‍රකාශන

Dairy Hub ව්‍යාපෘතියට සමගාමීව ප්‍රචාරණ කටයුතු සඳහා අත් පත්‍රිකා 5,000 ක් සහ පොත් 10,000 ක් මුද්‍රණය කෙරෙමින් පවතී.

### 1.5.2. පශු අණපනත් හා නීති අංශය

#### 1.5.2.1 සතුන් හඳුනා ගැනීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. 2025.08.30 දින වන විට සතුන් 14,618 දෙනෙකුගේ කන් සලකුණු සවිකර ඇති අතර බෙදා හරින ලද කන් සලකුණු ප්‍රමාණය 22,076 කි. එසේම කන් සලකුණු, Marker Pens, Tag Pins හි ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන ඒකකයට යවා ඇති අතර, රු.මි.7.00 ක වටිනාකමැති උප ලේඛන මුද්‍රණය කර අවසන් වී ඇත.

#### 1.5.2.2 සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය

මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 05.00 ක් වෙන්ව තිබුනද, ඉඩමෙහි අයිතිය පිළිබඳ ගැටලුවක් මත කොළඹ සත්ත්ව නිරෝධායන කාර්යාලයේ අළුත්වැඩියා කිරීමේ කාර්යය ප්‍රමාද වී ඇත. එසේම එහි ඇති දාහකය (Incinerator) පුරාවිද්‍යා ස්මාරකයක් බැවින් එම නිර්ණායක යටතේ මෙම කාර්යය කිරීමට උපදෙස් දී ඇත.

#### 1.5.2.3. තත්ත්ව ආරක්ෂණ වැඩසටහන

"තත්ත්ව ආරක්ෂණ හා නිරෝධායන කටයුතු" වැඩසටහන යටතේ සිදු කරනු ලබන කාර්යයන් සඳහා හඳුනා ගත් ඉලක්ක වන සත්ත්ව ආහාර සම්බන්ධ කටයුතු, පශු ඖෂධ අධිකාරියේ කටයුතු, සත්ත්ව හා සත්ත්ව නිෂ්පාදන ආනයන හා අපනයන සඳහා පූර්ව නිෂ්කාශන නිකුත් කිරීම සහ නිරෝධායන කටයුතු ආවේක්ෂණය කිරීම යන කාර්යයන් සඳහා සමාලෝචිත කාල සීමාව තුළ සමස්ත ප්‍රගතිය 75% ක් පමණ වේ.

### 1.5.3. සත්ත්ව සෞඛ්‍ය අංශය

#### 1.5.3.1 සතුන්ගෙන් බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුදල රු.මි. 35.00 ක් වන අතර, මේ යටතේ කිරි ගවයින් සඳහා බලපාන හඳුනාගත් ප්‍රධාන රෝග 05 ක් සඳහා එන්නත්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙම එන්නත්කරණ වැඩසටහන් රෝගය අනුව පහත ප්‍රදේශවල ක්‍රියාත්මක වේ.

| # | එන්නත් කරන රෝගය | ක්‍රියාත්මක වන ප්‍රදේශ | බෙදාහරින ලද එන්නත් වඩි ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | කුර හා මුඛ රෝගය (FMD) | මුළු දිවයින පුරා | 212,160 |
| 2 | ගව රක්තාශ්‍රව රෝගය (HS) | උතුරු මැද, උතුරු හා නැගෙනහිර පළාත් | 125,040 |
| 3 | කාල ගාත්‍ර රෝගය (BQ) | උතුරු, උතුරු මැද හා වයඹ පළාත් | 92,037 |
| 4 | සමේ ගැටිති රෝගය (LSD) | උතුරු මැද, ඌව, මධ්‍යම, වයඹ, සබරගමු, උතුරු, නැගෙනහිර හා දකුණු පළාත් | 36,000 |
| 5 | බෲසෙල්ලෝසිස් (Bovine Brucellosis) | අම්පාර, අනුරාධපුර, මඩකලපුව, පුත්තලම, මොණරාගල, වව්නියාව, නුවරඑළිය, පොලොන්නරුව, හම්බන්තොට, බදුල්ල, ත්‍රිකුණාමලය, කිලිනොච්චි, කුරුණෑගල හා මුලතිව් යන දිස්ත්‍රික්ක | 6,700 |

අදාළ ප්‍රදේශ සඳහා බෙදා හැර ඇති එන්නත් වඩි ප්‍රමාණය ඉලක්කගත ප්‍රමාණයෙන් 85% ක් වන අතර, සමාලෝචිත කාල සිමාව අවසන් වන විට එම ප්‍රමාණයෙන් 78% ක් භාවිතා කර ඇත.

පසුගිය වසරට සාපේක්ෂව කුර හා මුඛ රෝගය වාර්තාවීම 33% කින් අඩුවී ඇති අතර, කාලගාත්‍ර රෝග තත්ත්වය සම්පූර්ණයෙන්ම පාලනය කිරීමට හැකිවී ඇත. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට මෙම වැඩසටහන සඳහා වෙන්කල මුදල සම්පූර්ණයෙන් වැයවී ඇති අතර, භෞතික ප්‍රගතිය 75% කි.

#### 1.5.3.2 වනජීවී රෝග ආවේක්ෂණ මඟින් මිනිසාට හා ගොවිපොළ සතුන්ට වනජීවීන් හරහා රෝග සම්ප්‍රේෂණය අවම කිරිමේ ව්‍යාපෘතිය

මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි. 02.00 ක මුදලක් වෙන්කර ඇති අතර, වනජීවීන් මගින් පශු සම්පත් ක්ෂේත්‍රයට බලපෑ හැකි රෝග හඳුනා ගැනීම සිදු කරයි. මෙම වැඩසටහන අම්පාර, දඹුල්ල, අනුරාධපුර, හම්බන්තොට, හෝමාගම, කුණ්ඩසාලේ, මාන්කුලම්, පොළොන්නරු හා රත්නපුර යන ප්‍රදේශවල ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ දැනට පශු විමර්ශන මධ්‍යස්ථානවල පශ්චාත් මරණ පරීක්ෂණ 32 ක් සිදුකර ඇති අතර, සූකර කර්මාන්තයට වැදගත්වන සූකර උණ රෝගය වනාශ්‍රිත ඌරන් තුළ ද පවතින බව හඳුනාගෙන ඇත. මේ වනවිට ව්‍යාපෘතිය සඳහා රු.මි. 0. 85 ක මුදලක් වැය වී ඇති අතර 26% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

#### 1.5.3.3 කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනා ගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම

මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි. 05.00 ක මුදලක් වෙන් කර ඇති අතර, මත්ස්‍ය අපනයන කටයුතු වලදී අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදුකර ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම හා මත්ස්‍ය අපනයන ගොවිපොළවල් ලියාපදිංචිය සඳහා ජෛව ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචියට අවශ්‍ය නිර්දේශයන් ලබාදීම මෙමගින් සිදුකරයි.

මත්ස්‍ය අපනයන ගොවිපොළවල පිහිටීම අනුව මෙම ව්‍යාපෘතිය බස්නාහිර සහ උතුරුමැද පළාත් තුළද, මාතර, කෑගල්ල, හලාවත, කුරුණෑගල, ත්‍රිකුණාමලය,මහනුවර හා මාතලේ යන දිස්ත්‍රික්ක තුළ ද ක්‍රියාත්මක කෙරේ. ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානය හා එක්ව PVS Aquatic Animal Health Mission නම් වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, මෙමගින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය කර්මාන්තය හා මත්ස්‍ය අපනයන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබාගැනීම සිදු කෙරිණි.

රට තුළ ඇති වූ අප්‍රිකානු සූකර උණ වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් ගත් විශේෂ තීරණයකට අනුව එම රෝගී තත්ත්වය පාලනය සඳහා අවශ්‍ය යෙදවුම් මෙම වැඩසටහන යටතේ ලබාදීමට පියවර ගත් අතර, ඒ අනුව එම යෙදවුම් දිවයින පුරා ඇති හඳුනාගත් ගොවිපොළවල් වෙත බෙදාහැරීම ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් සිදු කරන ලදී.

මෙම වැඩසටහන මගින් මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන අපනයන මත්ස්‍ය ගොවිපොළ 70 ක ගුණාත්මකභාවය ඉහළ දැමීමට හැකිවී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා මේ වන විට රු.මි. 0.7 ක මුදලක් වැය කර ඇති අතර 94% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.

#### 1.5.3.4 කුකුළු රෝග කළමනාකරණය හරහා කුකුළු මස් හා බිත්තර අපනයනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම

මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මි. 10.00 ක මුදලක් වෙන් කර ඇති අතර, මුළු දිවයිනම ආවරණය වන පරිදි කුරුළු උණ, රැනිකට් හා සැල්මොනෙල්ලා යන රෝග තත්වයන් පාලනය එමගින් සිදුකරයි.

ඒ අනුව අභිජනන ගොවිපොළ, බීජ රක්කනාගාර හා බිත්තර අපනයන ගොවිපොළවල ජෛව ආරක්ෂණ ක්‍රමවේදයන් අධීක්ෂණය සිදු කරනු ලබන අතර, වාර්ෂික ලියාපදිංචිය සඳහා නිර්දේශයන් ලබා දේ. වාණිජමය බිත්තර අපනයන කුකුල් ගොවිපොළ වෙත ආර්ථිකමය වශයෙන් වැදගත් වන කුකුල් රෝග සඳහා පරීක්ෂා කර බිත්තර අපනයනයට අවශ්‍ය සෞඛ්‍ය සහතික නිකුත් කිරීමෙන් අපනයනය ප්‍රවර්ධනය කිරීමට හැකිවී ඇත.

රැනිකට් රෝග පාලනය සඳහා අදාළ එන්නත් දිවයින පුරා පශු වෛද්‍ය කාර්යාල හා පශු විමර්ශන මධ්‍යස්ථාන මඟින් බෙදා හැරීම සිදු කරන අතර, මේ වන විට රැනිකට් එන්නත් වඩි 3,976,800 බෙදාහැර ඇත. මෙම එන්නත් සුළු පරිමාණ ගොවිපොළ සඳහා නොමිලේ ලබාදෙන අතර මෙමගින් වසංගත රෝගී තත්ත්වයක් ඇති නොවන මට්ටමට රෝගය පාලනය වී ඇත.

අභිජනන ගොවිපොළ හා බීජ රක්කනාගාරවල සැල්මොනෙල්ලා රෝග තත්ත්වයන් පාලනය කිරීමෙන් වාණිජ ගොවිපොළ සඳහා එම රෝගය පැතිරීයාම පාලනය කර ඇත. තවද කුරුළු උණ ආවේක්ෂණය මගින් කුරුළු උණෙන් තොර රටක් පවත්වා ගැනීමට හැකිවී ඇත.

සමාලෝචිත කාල සීමාව වන විට මෙම වැඩසටහන සඳහා වැයකර ඇති මුදල රු.මි. 02.00 ක් වන අතර භෞතික ප්‍රගතිය 52% කි.

### 1.5.4. පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය

#### 1.5.4.1 සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන

මේ යටතේ පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන දත්ත, සත්ත්ව ගහණය, ලියාපදිංචි ගොවිපොළ සංඛ්‍යාව මාසිකව හා කාර්තුමය වශයෙන් දත්ත ලබා දෙන අතර, පශු වෛද්‍ය කාර්යාලවල මානව හා භෞතික සම්පත්වල තොරතුරු එකතු කරනු ලැබේ. එම තොරතුරු ආශ්‍රිතව Livestock Statistical Bulletin,

Livestock Outlook, වාර්ෂික වාර්තාව වැනි ප්‍රකාශන නිකුත් කරනු ලබයි. පශු සම්පත් ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් සහ නිෂ්පාදකයින්ගෙන් ලබාගන්නා දත්ත පදනම් කරගෙන Poultry forecast, Poultry Bulletin, Dairy Bulletin ප්‍රකාශයට පත් කරයි. මේ වන විට Poultry Forecast, Livestock Statistical Bulletin, Livestock Outlook සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව යන ප්‍රකාශන සකස්කොට අවසන්ව ඇත.

තව ද ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහනට අදාළ පෝරම පළාත් මට්ටමින් නිකුත් කිරීම සඳහා එම පෝරමයන් සහ රෙජිස්ටර් පොත් මුද්‍රණය කර පළාත් 09 වෙත බෙදා හැර ඇත. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට ලියාපදිංචි වී ඇති මුළු ගොවිපොළ සංඛ්‍යාව 13,307 ක් වේ. මෙම අංශය වෙත පශු වෛද්‍ය කාර්යාල හරහා ලැබෙන දත්තවල ප්‍රශස්ත බව වැඩි කිරීමේ අරමුණින් මේ වන විට දිවයින පුරා පළාත් 09 ආවරණය වන පරිදි පුහුණු වැඩමුළු පවත්වනු ලැබේ.

#### 1.5.4.2 පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරීම

ආනයන හා අපනයන කටයුතුවලට ගතවන කාලය අවම කිරීම සහ ජාත්‍යන්තර වෙළඳාමේ නියැලී සිටින ප්‍රජාවට ක්‍රියාවලීන් පහසු කිරීම සඳහා 2023 සිට සතුන් සහ සත්ව නිෂ්පාදන ආනයනය හා අපනයනය සම්බන්ධ ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය සහ ජාලකරණය කිරීමට VRRAS ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර, එමගින් පශු අණ පනත් සහ නීති අංශය, පශු පර්යේෂණ ආයතනය සහ සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානවල කටයුතු ඩිජිටල්කරණය සහ ජාලකරණය සිදු කෙරේ.

එහි සංවර්ධන කටයුතු සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් බාහිරින් සේවා ලබා ගන්නා අතර, මෙම ව්‍යාපෘතිය පශු සම්පත් සැලසුම් සහ ආර්ථික අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. පශු පර්යේෂණ ආයතනයෙහි උප පද්ධතිවලට අදාළ විවිධ වර්ගයේ මොඩියුල පවතින අතර ඒවා දැනටමත් සංවර්ධනය කර සහ පරිශීලක ප්‍රතිග්‍රහණ පරීක්ෂණයට (User Acceptance Test) ද භාජනය වී ඇත. පශු අණ පනත් සහ නීති අංශයට සහ නිරෝධායන කාර්යාලවලට අදාළ උප පද්ධති තවමත් සංවර්ධනය වෙමින් පවතින අතර මෙම වසර තුළ සමස්ත පද්ධතියම ක්‍රියාත්මක වීමට අපේක්ෂිතය.

### 1.5.5. පශු පර්යේෂණ ආයතනය

#### 1.5.5.1 උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම

මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්ත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය තවදුරටත් පුළුල් කිරීම සිදුකෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ ගව රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ රැනිකට් එන්නත් දේශීයව නිපදවීම වැඩිදියුණු කර ඇත.

| එන්නත් වර්ගය | වාර්ෂික ඉලක්කය | 2025.09.30 වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය |
|---|---|---|
| ගව රක්තාශ්‍රව (OAV) එන්නත | 125,000 | 125,040 |
| ගව රක්තාශ්‍රව (APV) එන්නත | 20,040 | 20,040 |
| කාල ගාත්‍රා (BQ ) එන්නත | 90,000 | 86,757 |
| බෘසෙල්ලා (Brucella S190 එන්නත | 10,000 | 7,500 |
| රැනිකට් (Primary) එන්නත | 2,874,000 | 3,000,800 |
| රැනිකට් (Secondary) එන්නත | 2,521,000 | 2,148,600 |
| **පෞද්ගලික ආයතන සඳහා ඉල්ලුම අනුව එන්නත් නිෂ්පාදනය කිරීම** | | |
| කුකුල් කොළරා (FC) එන්නත | 400,000 (ඉල්ලුම පරිදි) | 235,440 |
| සූකර පැස්චරෙල්ලා (SP) එන්නත | 3,000 | ඉල්ලුම පරිදි |

| එන්නත් වර්ගය | වාර්ෂික ඉලක්කය | **2025.09.30** වන විට නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය |
|---|---|---|
| රැනිකට් (primary) එන්නත | 1,500,000 | 2,894,600 |

### 1.5.5.2 පශු සම්පත් පර්යේෂණ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ව්‍යාපෘති 23 ක් දැනට ක්‍රියාත්මක වේ. ඉල්ලුම පරිදි සාම්පල පරීක්ෂාව සහ ජෛවීය නිෂ්පාදනයන් සිදුකිරීම මේ මගින් ඉටුකරනු ලබයි.

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්කය | **2025.09.30** වන විට ප්‍රගතිය |
|---|---|---|
| *ජෛවීය නිෂ්පාදන* | | |
| විශ්ලේෂණ වාර්තා | ඉල්ලුම පරිදි | 47,691 |
| පරීක්ෂණ වාර්තා | | 2,039 |
| රෝග නිරීක්ෂණ වාර්තා | | 1,464 |
| බුරුළු ප්‍රදාහය හඳුනා ගැනීම සඳහා CMT ප්‍රතික්‍රියාකාරකය (CMT reagent) | | ලීටර් 17 |
| Pullorum ප්‍රතිදේහජනක මාත්‍රා | | 101,000 |
| RBPT ප්‍රතිදේහජනක මාත්‍රා | | 7,700 |
| බුරුළු ගිල්වනු ලබන ද්‍රාවණය (Teat dip solution) | | ලීටර් 46.765 |

### 1.5.5.3 කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය

මෙම ව්‍යාපෘතිය යටතේ දේශීයව කුර හා මුඛ රෝග එන්නත් සකස් කිරීම සිදුකරනු ලැබේ. 2025 වසර සඳහා එන්නත් වඩි 450,000 ක් නිෂ්පාදනයට සැලසුම් කර තිබූ අතර, දෙපාර්තමේන්තුවේ සත්ත්ව සෞඛ්‍ය අංශයට එන්නත් මාත්‍රා 208,860 ක් නිකුත් කරන ලදී. ආසන්න වශයෙන් 100,000 කට ප්‍රමාණවත් කුර හා මුඛ රෝග ප්‍රතිදේහජනක නිෂ්පාදනය කර ඇත.

### 1.5.5.4 බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ බුරුළු ප්‍රදාහ නික්ෂේපණ 30,000 ක් සෑදීමට ඉලක්ක කර ඇත. සමාලෝචිත කාලය තුළ බුරුළු ප්‍රදාහ නික්ෂේපණ 26,662 ක් නිෂ්පාදනය කර ඇති අතර 24,501 ක් ක්ෂේත්‍රයට නිකුත් කර ඇත.

# 02. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

## 2.1. හැඳින්වීම

මිල්කෝ ආයතනය ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් ඔස්සේ සිය මෙහෙයුම් ක්‍රියාවලිය දියත් කරනු ලබයි.

i.) දේශීය කිරි ගොවීන්ගේ කිරි අස්වනු එකතු කිරීම
ii.) කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීම
iii.) එකී නිෂ්පාදන “ හයිලන්ඩ්” වෙළෙඳ නාමය යටතේ දිවයින පුරා බෙදාහැරීම

## 2.2. 2026 වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අ/අ | ප්‍රධාන සංවර්ධන වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි) |
|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 1,100.00 |
| 2 | පුනරාවර්තන වියදම් | 25,933.00 |

## 2.3. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)*

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මූල පිරිවැය හා අරමුදල් ප්‍රභවය (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | කිරි අගයදාමය සංවර්ධනය | | | ලෝක බැංකු ආධාර සහ 25%ක මිල්කො අරමුදල් |
| | ලීටර් 10 කිරි කෑන් | ඒකක ගණන | 2,141 | |
| | ලීටර් 20 කිරි කෑන් | | 1,236 | |
| | පුද්ගලික ආරක්ෂක උපකරණ | | 1,236 | |
| | ඩිජිටල් කිරුම් තරාදි | ප්‍රතිලාභී කිරි ගොවි සමිති ගණන | 271 | |
| | කිරි විශ්ලේෂක | | 254 | |
| | Hay bailing machine | | 10 | |
| | කිරි සිසිලන ඒකක | | 200 | |
| | කටු කම්බි වැට | ප්‍රතිලාභී කිරි ගොවීන් ගණන | 311 | |
| | විදුලි වැට | | 122 | |
| | සූර්ය බලශක්ති ඒකකයක් සහිත ජල පොම්ප | | 290 | |
| 2 | "මිල්කො කිරි සංවර්ධන අරමුදල" ගොඩනගා එම ප්‍රතිපාදන භාවිතයෙන් මිල්කො සැපයුම් පදනම සුරක්ෂිත කරමින් ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීම | | 2,000 | - |
| 3 | බඩල්ගම කිරි කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා සූදානම් කිරීම | | | රජයේ අරමුදල් |

* 2026 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතින අතර, මූලික වැඩසටහන් පමණක් මෙහි සඳහන් කර ඇත.

## 2.4. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට ආයතනයේ වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය, (2025.09.30 දක්වා)

| අ/අ | වැඩසටහන | 2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි) | 2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| | **ප්‍රාග්ධන වියදම්** | 1,239.00 | 234.00 | 19 |
| | **පුනරාවර්තන වියදම්** | 24,936.00 | 13,399.00 | 54 |
| | **සංවර්ධන වැඩසටහන්** | | | |
| **1** | සත්ත්ව අභිජනනය කාර්යක්ෂම කිරීම (ජංගම පශු වෛද්‍ය සායන පැවැත්වීම) | 11.80 | 3.60 | 31 |
| **2** | වැඩි කිරි අස්වැන්නක් සඳහා ගවයින්ට පානීය ජලය අඛණ්ඩව සැපයීම (ජල බඳුන් සැපයීම) | 4.80 | 1.30 | 27 |
| **3** | කිරි ගොවි පුහුණු වැඩමුළු පැවැත්වීම | 8.90 | 4.80 | 54 |
| **4** | ස්වයංපාලිත කිරි ගොවි සමිතිවල ක්‍රියාත්මක ක්‍රමවේදය පිළිබඳව එම සමිතිවල නිලධාරීන් පුහුණු කිරීම | 5.60 | 3.50 | 63 |
| **5** | අලෙවි නියෝජිතයන්ගේ අලෙවි සුපරීක්ෂකවරුන් සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම | 0.50 | 0.30 | 60 |

## 2.5. 2025 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

### 2.5.1. හරිත තෘණ ව්‍යාපෘතිය

කිරි ගවයින්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා රට තුළ ඒකාකාරී සත්ත්ව ආහාර නිෂ්පාදන රටාවක් ඇති කිරීමත්, ඉහළ පෝෂණ අගයකින් යුත් තෘණ සපයාදීමත් අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය හඳුන්වා දුන් අතර, ඒ යටතේ 2025 වර්ෂය තුළ දිවයින පුරා අක්කර 575 ක භූමි ප්‍රමාණයක් වගා කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, සමාලෝචිත කාල සීමාව අවසාන වන විට මිල්කෝ ක්ෂේත්‍ර නිළධාරීන්ගේ මග පෙන්වීම හා තාක්ෂණික සහය මත අක්කර 357 ක් වගා කර ඇත. මේ සඳහා වූ වියදම අදාළ ගොවි මහතුන් විසින් දරනු ලබයි.

ඡායාරූප අංක 08

### 2.5.2. කිරි ගවයින් සඳහා අඛණ්ඩව පානීය ජලය සැපයීමේ වැඩසටහන

ඉහළ කිරි නිෂ්පාදනයක් ලබා ගැනීම සහ ඒකාකාරී නිෂ්පාදන රටාවක් පවත්වා ගැනීම සඳහා කිරි ගවයින්ට පෝෂණය සැපයීමේ දී අඛණ්ඩ පානීය ජල සැපයුමක් තිබීම අත්‍යාවශ්‍ය වේ. එම අවශ්‍යතාවය ප්‍රචලිත කිරීම සහ දිරිගැන්වීම සඳහා 2025 වර්ෂය තුළ පිරිවැයෙන් අඩක් අය කර ගැනීමේ පදනම මත ගොවීන් වෙත ජල බඳුන් 800 ක් සැපයීමට සැලසුම් කර ඇත. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට උතුර, මධ්‍යම, උතුරු මැද, වයඹ, දකුණ හා නැගෙනහිර යන පළාත් ආවරණය වන පරිදි පානීය ජල බඳුන් 222 ක් නිෂ්පාදනය කර ගොවීන් අතර බෙදා දී ඇති අතර, ඒ සඳහා මිල්කෝ සමාගම විසින් රුපියල් මිලියනයකට වැඩි මුදලක් වියදම් කර ඇත.

ඡායාරූප අංක 09

### 2.5.3. ගොවි පුහුණු වැඩමුළු පැවැත්වීම

කිරි නිෂ්පාදනය කාර්යක්ෂමව ඵලදායීව හා අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කිරි ගව පාලනය හා කළමනාකරණය මූලික කර ගත් ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබා දීම පුහුණු වැඩමුළු හරහා සිදු වේ. මිල්කෝ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හරහා මෙය සිදු වන අතර 2025 වසර තුල දිවයින පුරා කිරි ගොවීන් 11,150 දෙනෙකු පුහුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ඉලක්කය වේ. ඒ අනුව, සැප්තැම්බර් මස අවසානය වන විට කිරි ගොවීන් 6,050 දෙනෙකු පුහුණු කර ඇත. මේ සඳහා මිල්කෝ සමාගම දරන ලද වියදම රු. මි. 4.84 කි.

ඡායාරූප අංක 10

### 2.5.4. සත්ත්ව අභිජනනය කාර්යක්ෂම කිරීම

ගුණාත්මයෙන් යුත් ඉහළ කිරි නිෂ්පාදනයක් සඳහා සතුන්ගේ සෞඛ්‍ය කළමනාකරණය අත්‍යාවශ්‍ය වන අතර, ගොවිපොළ තුළදීම ස්ථානීය වශයෙන් කිරි ගවයින්ගේ රෝග හඳුනාගැනීම, ප්‍රතිකාර කිරීම රෝග වළක්වා ගැනීමේ උපදෙස් ලබා දීම සහ නියමිත කාල පරාසය තුළ කෘත්‍රිම සිංචනය සිදු කිරීම ද මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ඒ යටතේ 2025 වර්ෂය තුළ ඉලක්කගත ජංගම පශු වෛද්‍ය සායන සංඛ්‍යාව 1,819 ක් වන අතර, සමාලෝචිත කාල සීමාව අවසාන වන විට සායන 376 ක් පවත්වා ඇත. මේ සඳහා මිල්කෝ සමාගම විසින් දරන ලද වියදම රු.මි. 3.58 කි.

ඡායාරූප අංක 11

### 2.5.5. කුඩා පරිමාණ, කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP)

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP), මිල්කෝ ආයතනය හා අනුබද්ධිත කිරි ගොවීන් 3,000 කගේ සංවර්ධනය අරමුණු කරගෙන ඌව, මධ්‍යම, වයඹ, උතුරු මැද හා දකුණු පළාත් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන යටතේ 2025 සැප්තැම්බර් අවසාන වන විට ගවගාල් 1,971 ක්, වගා ළිං 51 ක් සහ ඇසොල්ලා පොකුණු 681 ක් ඉදිකිරීමට කටයුතු සම්පාදනය කර ඇති අතර, තෘණ කැබලි කිරීමේ උපකරණ 852 ක් ලබා දී ඇත. තවද, කිරි ගොවීන් 529 කට ණය පහසුකම් ලබා දී ඇති අතර, ජීව වායු ඒකක 04 ක් ස්ථාපිත කර ඇත.

ඡායාරූප අංක 12 - 13

### 2.5.6. නව වරලත් අලෙවිසැල් ආරම්භ කිරීම

මිල්කෝ බෙදාහැරීමේ ජාලය තවදුරටත් පුළුල් කරමින් 2025 වර්ෂය තුළදී නව වරලත් අලෙවිසැල් 500 ක් ආරම්භ කිරීමට සැලසුම් කළ අතර, සමාලෝචිත කාල සීමාව අවසාන වන විට වරලත් අලෙවිසැල් 81 ක් ස්ථාපිත කර ඇත. අලෙවිසැල් ආරම්භ කිරීම සඳහා සියලු වියදම් අලෙවිසැල් හිමිකරුවන් විසින් දරනු ලබයි.

ඡායාරූප අංක 14 - 15

## 03. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

### 3.1. හැඳින්වීම

1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 1973 වර්ෂයේදී ස්ථාපිත කරන ලද අතර, එහි ක්ෂේත්‍ර කටයුතු 1974 දී ආරම්භ කරන ලදී. වර්තමානයේ මණ්ඩලය සතුව ගොවිපොළ 32 ක් පවතී. මෙම ගොවිපොළවල එළ ගව, මී ගව, එළු, බැටළු, සූකර, හා කුකුළු ව්‍යාපෘති පවත්වාගෙන යන අතර, ගොවීන් වෙත අභිජනනය සඳහා සතුන් නිකුත් කිරීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වේ. මීට අමතරව, ගොවිපොළ නිෂ්පාදන වන කිරි, බිත්තර, මස් ආදිය තත්ත්වයෙන් උසස් නිෂ්පාදන ලෙස පාරිභෝගික ජනතාව වෙත සැපයීම සිදු කෙරේ. තවද වාර්ෂිකව පශු සත්ත්ව පාලනය පිළිබඳ ගොවි ජනතාව හා සිසුන් පුහුණු කිරීම මණ්ඩලයේ සියළු ගොවිපොළවල සිදු කෙරේ. පසුගිය වසර 50 ක කාල සීමාව තුළ රට තුළ පශු සම්පත් අංශයේ සිදු කරන ලද සංවර්ධනයේ පුරෝගාමී කාර්යභාරයක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ඉටු කර තිබේ.

### 3.2. 2026 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
| 1 | එළ කිරි නිෂ්පාදනය | ලීටර් මිලියන | 8.60 | 271.0 | 2340.40 |
| 2 | මී ගව කිරි නිෂ්පාදනය | ලීටර් මිලියන | 0.95 | 430.0 | 407.00 |
| 3 | එළු කිරි නිෂ්පාදනය | ලීටර් | 21,462 | 937.0 | 20.10 |
| 4 | දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් | සංඛ්‍යාව මිලියන | 3.80 | 142.0 | 539.37 |

| අ/අ | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | ඒකක පිරිවැය (රු.) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|---|
